# උදකුක්ඛේපසීමාවිභාවිනී

නම් වූ

උදකුක්ඛේපසීමා සහ සීමා-උපචාර පිළිබඳ

පෞරාණික මහාවිහාරීය ථේරවාදය



සම්පාදක

**පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ**

# උදකුක්ඛේපසීමාවිභාවිනී

නම් වූ

## උදකුක්ඛේපසීමා සහ සීමා~උපචාර පිළිබඳ
## පෞරාණික මහාවිහාරීය ථේරවාදය

**සම්පාදක**

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

**ප්‍රකාශනය**

ශ්‍රී සද්ධර්ම සංසදය

www.theravada.mahavihara.org

විමසීම් : 071 4417813

විද්‍යුත්-තැපෑල info@mahavihara.org

# පිදුම

ඒ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ ඖරසපුත්‍ර, ගෞතම බුදුසසුනෙහි විනයධර භික්ෂූන් අතරින් අග්‍රප්‍රාප්ත උපාලි මහරහතන් වහන්සේට ද,

එම ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට අයත් ලක්දිව ථේරවාද මහාවිහාරීය භික්ෂු පරපුර පිහිටුවා වදාළ අනුබුදු මහාමහින්ද මහරහතන් වහන්සේට ද,

පිරිසිදු උපසම්පදාවක් ලැබීම සඳහා දිවි නො තකා බුරුම රටට ද වැඩම කොට සවරක් ම උපසම්පදා-දළ්හීකර්ම ලැබ ශ්‍රී ලඞ්කා රාමඤ්ඤ මහානිකාය නම් අවිච්ඡින්න මහාවිහාරීය උපසම්පදා භික්ෂුවංශය පිහිටුවා වදාළ අතිපූජනීය ඉඳසභවරඤාණසාමී මහානායක මාහිමිපාණන් වහන්සේට ද,

බුදුසසුන පිරිහී යන්නට නො දී එයට නව ජීවයක් ලබා දෙමින් ශ්‍රී ලඞ්කා රාමඤ්ඤ මහානිකායානුබද්ධ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා නම්, අරණ්‍යක යෝගාවචර භික්ෂුවංශය පිහිටුවා වදාළ ශ්‍රී ආර්යවිලාසවංශාලඞ්කාර සද්ධර්මවාගීශ්වරාචාර්ය පටිපත්තිසෝභන ගණපාමොක්ඛාචරිය මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත අතිපූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන මාහිමිපාණන් වහන්සේට ද,

මාගේ ප්‍රව්‍රජ්‍යාචාර්ය, ශ්‍රී ලඞ්කා රාමඤ්ඤ මහානිකායේ කැලණිය ප්‍රාදේශීය සඞ්ඝසභාවේ විනයපාලක අතිගරු පූජනීය කිතුලම්පිටියේ ආනන්ද මාහිමිපාණන් වහන්සේට ද,

අට්ඨකථා සහිත විනයපිටකය පිළිබඳ ව මූලික දැනුම ලබා දෙමින් මාහට පෞරාණික මහාවිහාරීය විනය පිළිබඳ ව විශේෂ ඇල්මක් ඇති කරවූ අප විනයාචාර්ය අතිගරු පූජනීය ග්‍රීසියේ ඤාණදස්සන මාහිමිපාණන් වහන්සේට ද,

මෙබඳු විනයග්‍රන්ථයක් සම්පාදනය කිරීමට තරම් මා තුළ විනය දැනුම ප්‍රගුණ කරවා දුන්නා වූ ද ආදිබ්‍රහ්මචරියක, ආභිසමාචාරික සියලු ශික්ෂාවන් ද ඇතුළත් ව අට්ඨකථා, ටීකා සහිත ථේරවාද මහාවිහාරීය සියුම් විනය විනිශ්චයන් පැහැදිලි කර දෙන්නා වූ ද අට්ඨකථාටීකාචාර්යවංශානුයාත අප විනයාචාර්යයන් වහන්සේ වන විනයවිශාරද අතිගරු පූජනීය නුවරඑළියේ ඤාණසීල මාහිමිපාණන් වහන්සේට ද

මෙම විනයග්‍රන්ථය ආදර-ගෞරවයෙන් සාදර-භක්තියෙන් පුදකර සිටිමි. මෙම මහාවිහාරීය විනය විනිශ්චය බුද්ධශාසනයේ චිරස්ථිතිය පිණිස ම හේතු වේවා!

සාධු! සාධු!! සාධු!!!

# පෙරවදන

## 'උදකුක්ඛෙපසීමාවිභාවිනී'

ගෞතම සම්මාසම්බුද්ධශාසනය වසර පන්දහසක් කල් නිරුපද්‍රැත ව පවත්වා ගෙන යාම සඳහා ධර්ම-විනයධර සුපේශල ශික්ෂාකාමී, පර්යාප්තිධර, නිවන් මඟට බැසගත් ස්වාමීන් වහන්සේලා වැඩියෙන් බිහි විය යුතු සමයකි, මේ උදාවී තිබෙන්නේ. එවන් මාහැඟි ලක්ෂණ රැසකින් ම පිරිපුන්, බුදුසසුනේ චිරස්ථිතියට කටයුතු කරන සඟරුවනකි, පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ. එතුමන් වහන්සේ වටිනා දහම්පොත් සම්පාදනය කරමින් පර්යාප්ති ශ්‍රී සද්ධර්මය හදාරමින් නිවන් මඟ ගමන් කරන, සම්බුදුසසුනට දිවි කැප කළ ආදර්ශවත් බුද්ධපුත්‍රයන් වහන්සේනමක් හැටියට අපගේ දෙනෙතට හමු වේ. එසේ ම යෝගාවචර හිමිවරුන්ට මෙන් ම තෙවළාදහම හදාරණ ගිහිපැවිදි කාහටත් ප්‍රයෝජනවත් දහම්පොත් රැසක් ම මේ වන විට එළිදක්වා ඇත.

නිරවුල් ව පිරිසිදු ව සම්බුදුසසුන පවත්වාගෙන යාම සඳහා වැදගත් වනුයේ ශාසනික උපසම්පදාව යි. උපසපන් භික්ෂුවක් බිහි කිරීමට අව්‍යාජ උදකුක්ඛෙපසීමාමාලකයක් සකස් කර ගන්නා අයුරු මැනවින් පහදා දෙමින් 'උදකුක්ඛෙපසීමාවිභාවිනී' නම් මාහැඟි විනයග්‍රන්ථය එළිදැක්වීමට විශාල පරිශ්‍රමයක් දරා තිබෙන බව පැහැදිලි ව දක්නට ලැබේ. හැදෑරිය යුතු සියලු විනයග්‍රන්ථ මැනවින් අධ්‍යයනය කොට විනය පිළිබඳ විශාරද දැනුමකින් යුතු පූජනීය ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා උපදෙස් ලබමින් මෙම දහම්පොත බිහිකරමින් අගනා ශාසනික සේවාවක් ඉටුකර තිබෙන බව කිව යුතු ය. ගෞතම සම්බුදුසසුනේ විනය පිළිබඳ අගතැන් පත් උපාලි මහරහතන් වහන්ගේ පටන් අද දක්වා වූ විනය පිළිබඳ ඉතිහාසය, පැවිදි - උපසම්පදා සීමාමාලකවංශය සිහි ගන්වමින් විනය-අට්ඨකථා, ටීකා විමසුමට ලක් කරමින් ඉදිරිපත් කළ මෙම 'උදකුක්ඛෙපසීමාවිභාවිනී' ග්‍රන්ථය සත්‍ය වූ නිවැරදි වූ උපසම්පදාවක් ලබා දීමට මහෝපකාරී උපදෙස් ලබා දෙන ග්‍රන්ථරත්නයක් බව කිව යුතු ය. ශ්‍රී ලඞ්කා සම්බුද්ධශාසනය වසර පන්දහසක් පැවැතීමට මේ ආකාරයට දායකත්වයක් ලබා දී තිබීම පැසසිය යුතු ය. තව තවත් මෙබඳු වටිනා ශාසනික සේවාවක් මතුවටත් කර ගෙන යාමට එතුමන් වහන්සේට රත්නත්‍රයේ සූවිසි මහාගුණ බලයෙන් අසූහාරදහසක් ධර්මස්කන්ධයේ සත්‍ය බලයෙන් අතීත-අනාගත-වර්තමාන තුන්කාලයට අයත් අනන්ත වූ අපරිමිත වූ බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලාගේ අනන්ත ගුණ බලයෙන්, කායික මානසික සුවපත් බව ලැබේවා! ශාසනභාර දෙවියන්ගේ රැකවරණය ලැබේවා! එතුමන් වහන්සේ මෙලොවට බිහි කළ ගුණවන්ත මවුපිය දෙදෙනා වහන්සේටත්, එතුමන් වහන්සේට පැවිදි - උපසම්පදාව ලබා දුන් අතිපූජනීය ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලාටත් මෙම සම්බුදුසසුනෙන් සැනසෙන්නට ලැබේවා!

'පිරිසිදු සම්බුදුසසුන වසර පන්දහසක් කල් පවතීවා' යන උදාර අදහසින් යුතු ව ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවා වදාළ ශ්‍රී අරියවිලාසවංශාලඞ්කාර සද්ධර්මවාගීශ්වරාචාර්ය පටිපත්තිසෝභන ගණපාමොක්ඛාචරිය මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත අතිපූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන මාහිමිපාණන් වහන්සේටත් මෙම මාහැඟි ග්‍රන්ථරත්නය ගෞරව උපහාරයක් වේවා'යි මෙහි දී අප විසින් කෘතවේදී ව පුණ්‍යානුමෝදනා කරමින් සිහිපත් කළ යුතු ය.


**පූජ්‍ය අතරගල්ලේ සංකිච්ච මහාස්ථවිර**
(ශ්‍රී.ක.යෝ.සං. කාරකසභික)
වටගල ආරණ්‍යසේනාසනය,
මොරගහ උල්පත,
විල්ගමුව,
මාතලේ.
(බු: ව: 2554)

# හැඳින්වීම

භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට සමීප ව සිටිය දී ආනන්ද ස්වාමීන් වහන්සේ අමතා වදාළ "යො ඛො ආනන්ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්ථා" එනම්, "ආනන්ද, මා විසින් ඔබලාට යම් ධර්මයක්-විනයක් දේශනා කරන ලද්දේ ද පණවන ලද්දේ ද ඒ ධර්මය-විනය මාගේ ඇවෑමෙන් ඔබලාට ශාස්තෘන් වහන්සේ වන සේක" යන බුද්ධවචනය ශ්‍රාවක වූ අප විසින් නිති සිහිපත් කළ යුතු උතුම් වදනකි. භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවීමෙන් පසු මෙකල අපට ශාස්තෘන් වහන්සේ වන්නේ ධර්මයත් විනයත් බැවින් එම ධර්ම-විනය නිවැරදි ව ම දැන ගත යුතු ය. ධර්ම-විනය සම්බන්ධයෙන් විවිධාකාර වූ මතිමතාන්තර ඇති වූ සැටි ද ඒ අනුව විවිධ වූ වාද-විවාද පැනනැඟුණු සැටි ද ශාසන-ඉතිහාසයෙන් පෙනේ. ඒ අතර විනයෙහි ලා ඉතා වැදගත් ස්ථානයක් ගන්නා 'සීමා' පිළිබඳ ව ඇති වූ මතභේද ද බොහෝ ය. ශාසන-ඉතිහාසය ගැන සලකන විට දහනවවන සියවසෙහි බලපිටිමෝදර 'මාදු' ගඟෙහි උදකුක්ඛේපසීමාව මුල් කර ගෙන ඇති වූ 'සීමාසඞ්කරවාදය', සීමා පිළිබඳ මතභේදවලට කදිම නිදසුනකි. එහි දී ද විනයාචාර්ය අතිපූජනීය ලඞ්කාගොඩ ධීරානන්ද මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ ධර්මවාදී පක්ෂය විසින් විනය පෙළ-අට්ඨකථා ඇසුරින් පෙන්වා දුන් නිවැරදි කරුණු අධර්මවාදී පක්ෂය විසින් බැහැර කරනු ලැබුවේ "අට්ඨකථාවෙහි සඳහන් ක්‍රමය නිසරු ය" යි කියමිනි. එහෙත් අතිපූජනීය ලඞ්කාගොඩ ධීරානන්ද මාහිමිපාණන් වහන්සේ එදා සීමාසඞ්කරවාදයෙහි දී ඉදිරිපත් කළ මතය පෞරාණික මහාවිහාරීය ථේරවාදය ම බව අද වුව ද පෙළ-අට්ඨකථා හදාරණ නුවණැත්තන්ට පැහැදිලි ව වටහා ගත හැකි ය. එහෙත් එම ථේරවාදයට පටහැණි ව එකල විසූ ඇතැම්හු පොත්පත් පවා ලියූහ. අම්බලන්ගොඩ විමලසාරතිස්ස හිමියන් විසින් රචිත 'සීමාලක්ඛණදීපනී' නම් පාළි-ග්‍රන්ථය සීමා පිළිබඳ මහාවිහාරීය ථේරවාදයට පටහැණි ව එකල ලියන ලද ග්‍රන්ථයකි. එම ග්‍රන්ථය විවේචනය කරමින් ධර්මවාදී පක්ෂය විසින් ද 'සීමානයදප්පණ' නම් වූ ග්‍රන්ථය ප්‍රකාශයට පමුණුවන ලදී. මෙලෙස 'සීමා' පිළිබඳ ව ඇති වූ වාද සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ශාසනවංශකථාවෙහි විද්‍යමාන වේ. උදකුක්ඛේපසීමා සහ සීමා-උපචාර පිළිබඳ වූ මෙම ග්‍රන්ථය සඞ්ග්‍රහ කිරීමට හේතු වූයේ ද සීමා සම්බන්ධයෙන් පැනනැඟුණු මතභේද කිහිපයක් පිළිබඳ ථේරවාද විනිශ්චය ඉදිරිපත් කිරීමට අවශ්‍ය වීම ය. අප විනයාචාර්ය පූජනීය නුවරඑළියේ ඤාණසීල ස්වාමීන්ද්‍රයන් වහන්සේ සමඟ සීමා පිළිබඳ ව දීර්ඝ ලෙස කරුණු සාකච්ඡා කිරීමට මාහට යෙදුණු අවස්ථා බොහෝ ය. එමඟින් විශේෂයෙන් ම උදකුක්ඛේපසීමා හා සීමා-උපචාර පිළිබඳ සියුම් වූත් ගැඹුරු වූත් මහාවිහාරීය ථේරවාදය උගෙනීමට මාහට අවස්ථාව සැලසිණ. වරක් මා විසින් උදකුක්ඛේපසීමා හා සීමා-උපචාර පිළිබඳ ව විස්තර හා සටහන් සහිත ව ලියන ලද ලිපියක් දුටු පූජනීය අප විනයාචාර්යයන් වහන්සේ ඒ පිළිබඳ ව තම ප්‍රසාදය පළ කළෙන් මෙම විෂය සම්බන්ධයෙන් ග්‍රන්ථයක් සම්පාදනය කළ යුතු ය, යන අදහස මා තුළ පහළ විය. මෙම ග්‍රන්ථය සඞ්ග්‍රහ වූයේ ඒ අනුව ය. ග්‍රන්ථය සඞ්ග්‍රහ කිරීමෙහි දී අප විනයාචාර්යයන් වහන්සේ වෙතින් ලද අනුග්‍රහය පිළිබඳ ව මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය. ග්‍රන්ථය කොටසින් කොටස ලියා අප විනයාචාර්යයන් වහන්සේ ඉදිරියෙහි එය කියවා අඩුපාඩු තැන් සකස් කරවා ගැනීම අපගේ සිරිත විය. එහි දී ඇතැම් කරුණු විවරණය කර ඇති ආකාරය පිළිබඳ ව අප විනයාචාර්යයන් වහන්සේ අතිශය ප්‍රසාදයට පත් වූ අතර අඩුපාඩු තැන් තිබුනේ නම්, ඒ තැන් නිවැරදි කර දෙන ලදී. ඇතැම් විනයධරයන්ගේ මතභේදයට හේතු වූ සීමා හා සීමා-උපචාර පිළිබඳ වූ නිවැරදි මහාවිහාරීය විනිශ්චය මාහට මෙලෙස පැහැදිලි ව වටහා ගැනීමට හැකි වූයේ අප විනයාචාර්යයන් වහන්සේගේ නිරවුල් මඟ පෙන්වීම නිසා ය. ඒ නිසා මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමට අවශ්‍ය නිවැරදි උපදෙස් ලබා දීම සම්බන්ධයෙන් පූර්ණ ගෞරවය අප විනයාචාර්ය අතිගරු පූජනීය නුවරඑළියේ ඤාණසීල ස්වාමීන් වහන්සේට හිමි වන්නේ ය. උදකුක්ඛේපසීමා හා සීමා-උපචාර පිළිබඳ කරුණු අට්ඨකථා හා ටීකා ගණනාවක ඒ ඒ තැන්වල විසිරී ඇති බැවින් ඒ පිළිබඳ පුළුල් දැනුමක් නැති අයෙකුට ඒ සියල්ල ගොනු කර ගැනීම දුෂ්කර ය. උදකුක්ඛේපසීමා හා සීමා-උපචාර පිළිබඳව අට්ඨකථා-ටීකා රැසක විසිරී ඇති කරුණු ගොනු කර සඞ්ග්‍රහ කිරීම මෙම ග්‍රන්ථය සම්පාදනයෙහි ලා මූලික අරමුණ යි.

බුද්ධශාසනයෙහි පැවැත්ම රඳා පවතින්නේ භික්ෂු-උපසම්පදාව මත ය. ශාසනික උපසම්පදාව නැති වූ කල්හි භික්ෂුත්වය ද නැති වී යයි. විනයානුකූල වූ උපසම්පදාව පිහිටීම සඳහා අනිවාර්ය වූ පඤ්ච-සම්පත්තීන්ගෙන් එකක් වන්නේ සීමාසම්පත්තිය යි. එනිසා විනයකර්ම සිදු කරන සීමාව බුදුසසුනෙහි තිඹිරිගෙය බඳු ය. එනිසා නිවැරදි සීමාසම්පත්තිය පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කර ගැනීමට සියලු භික්ෂූන් වහන්සේලා උත්සාහවත් විය යුතු ය. මෙම විනයසඞ්ග්‍රහයෙහි ඇතුළත් සියලු පාළිපාඨ සුබෝච්චාරණය පිණිස 'හල්' අකුරු යොදා ලියන ලද බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

මෙම විනයග්‍රන්ථය සඞ්ග්‍රහ කිරීම සඳහා සදුපදේශ ලබා දෙමින් විශේෂයෙන් අනුග්‍රහ කළ මැල්සිරිපුර, දිද්දෙණිය, රණගිරිය අරණ්‍ය-සේනාසනාධිවාසී විනයවිශාරද අතිගරු පූජනීය නුවරඑළියේ ඤාණසීල මාහිමිපාණන් වහන්සේටත් මෙම විනයග්‍රන්ථය මුද්‍රණය කරවූ පින්වත් බුද්ධික වික්‍රමනායක මහත්මා, පින්වත් සනත් කොඩිතුවක්කු මහත්මා, පින්වත් සාලිය වටගල මහත්මා සහ පින්වත් රම්දු වීරත්න මහත්මාටත් මුද්‍රණ කටයුතු වෙනුවෙන් විශේෂයෙන් දායක වූ පින්වත් මංජුල රාජපක්ෂ මහත්මා ප්‍රධාන දායක පින්වතුන් සැමටත් රූපසටහන් චිත්‍රයට නගා දුන් පින්වත් එච්.ඒ. රාජපක්ෂ මහත්මාටත් මෙම ධර්මදානමය කුසලය නිර්වාණාවබෝධය පිණිස හේතු වේවා!

මා පැවිදි වී පසළොස්වසරක් සපිරුණු මෙම අවස්ථාවෙහි දී බුදුසසුනෙහි චිරස්ථිතිය සඳහා ප්‍රයෝජනවත් වන මෙබඳු විනයග්‍රන්ථයක් සඞ්ග්‍රහ කිරීමට හැකි වීම මා ලැබූ ජයග්‍රහණයකි. එම ජයග්‍රහණය ලබා ගැනීම සඳහා මාහට අනුග්‍රහ කළ මාගේ ආචාර්ය-උපාධ්‍යායයන් වහන්සේලාට ද විනයාචාර්යයන් වහන්සේලාට ද මාගේ දෙමවුපියන් වහන්සේලාට ද පූජනීය කුරුණෑගල සෝභිත ස්වාමීන් වහන්සේ, පූජනීය මකුලෑවේ සුදස්සන ස්වාමීන් වහන්සේ ඇතුළු සබ්‍රහ්මචාරීන් වහන්සේලාට ද පින්වත් මංජුල රාජපක්ෂ මහත්මා ප්‍රධාන සියලු උපස්ථායකවරුන්ට ද සදේවක ලෝකයාට ද මෙම ධර්මදානමය කුසලය නිර්වාණාවබෝධය පිණිස ම හේතු වේවා!

සාධු! සාධු!! සාධු!!!

මෙයට,

සසුන් ලැදි,

**පූජ්‍ය නාවල ධම්මානන්ද හිමි,**

අනුශාසක,

මහාවිහාරීය ශ්‍රී විනයාලඞ්කාර ශ්‍රාවකසභාව.

www.theravada.mahavihara.org

(මැදින් - 2554)

ප්‍රථම මුද්‍රණය : මැදින්/2554 (2011 මාර්තු)

Copyright © Sri Saddharma Sansadaya

**ශ්‍රී සද්ධර්ම සංසදයෙන් ප්‍රකාශිත වෙනත් ධර්මග්‍රන්ථ**

---

**පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ**
- අසිරිමත් දහය
- සුපිරිසිදු නිවන් මඟ
- ධම්මචක්කප්පවත්තන සූත්‍රය
- ආනාපානසති භාවනාව
- දහම්ඇස පහළ වීම
- මහාසාරෝපම සූත්‍රය
- ධම්මානුස්සති භාවනාව
- ඉරියාපථ භාවනාව සහ සම්පජඤ්ඤ භාවනාව
- පටික්කූලමනසිකාර භාවනාව (පිළිකුල් භාවනාව)
- කර්මය පිළිබඳ අගනා දෙසුමක් (චූළකම්මවිභඞ්ග සූත්‍රය)
- ක්‍රෝධය නසන මඟ (ආඝාතපටිවිනය සූත්‍රය)
- ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව

**පූජ්‍ය දිප්පිටිගොඩ සෝමශාන්ත ස්වාමීන් වහන්සේ**
- ධාතුමනසිකාර භාවනාව
- නවසීවථික භාවනාව
- බුද්ධානුස්සති භාවනාව

**සමින්ද රණසිංහ**
- පින සහ කුසලය පිළිබඳ ථේරවාද විනිශ්චය

සියලු විමසීම්,

**ශ්‍රී සද්ධර්ම සංසදය**
www.theravada.mahavihara.org

Tel : 071 4417813
E-mail: vinayalankara_sabha@mahavihara.org

# පටුන


1. උදකුක්ඛේපසීමා සහ සීමා-උපචාර විනිශ්චය ____ 01

2. සීමාවක අවශ්‍යතාව ____ 01

3. උදකුක්ඛේපසීමාව ____ 02

    3-1. බලමැදුම්-පුරුෂයා ____ 04

    3-2. විසි කරන වේගය ____ 04

    3-3. ඇතැමුන්ගේ වැරදි මතයක් ____ 05

4. උදකුක්ඛේපසීමාවේ පරිච්ඡේදය දළ වශයෙන් දැනගැනීම ____ 09

5. අත්පස (හත්ථපාස) ____ 10

6. උදකුක්ඛේපසීමාවේ උපචාරය ____ 12

7. උදකුක්ඛේපසීමාවක් සඞ්කර වන ආකාරය ____ 18

8. උදකුක්ඛේපසීමාව තුළ ඉදි කෙරෙන අට්ටාලය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණු ____ 27

    8-1. අට්ටාලය ඉදි කළ යුතු දුර ප්‍රමාණය ____ 27

    8-2. පාලම් දැමීමෙහි දී සැලකිලිමත් විය යුතු කරුණු ____ 33

    8-3. විනයානුකූල ව පාලමක් යෙදිය නො හැකි ද ? ____ 36

9. උදකුක්ඛේපසීමා-උපචාරය පිළිබඳ ව ටීකාවන්හි දැක්වෙන කරුණු ____ 38

උපග්‍රන්ථය i : විනයාලඞ්කාර-ටීකා ____ i

උපග්‍රන්ථය ii : දෙතුන්දෙනා එකවර උපසම්පදා කිරීමේ කර්මවාක්‍යය ____ viii

උදකුක්ඛේපසීමා හා අදාළ ඡායාරූප ____ xviiii - xxi


---

පිටකවරය ඉදිරිපස චිත්‍රය :

කෝට්ටේ යුගයෙහි සවන බුවනෙකබාහු රජ දවස ලක්දිවට බුරුම රටින් පැමිණි කුලපුත්‍රයන් වහන්සේලා කල්‍යාණී නදියේ උදකුක්ඛේපසීමාවෙහි දී උපසම්පදා කරවූ අයුරු දැක්වෙන කල්‍යාණී රාජමහාවිහාරයේ බිතුසිතුවමකි.

පිටකවරය පසුපස චිත්‍රය :

මහාමහින්ද මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙන් යුතු ව අනුරාධපුර මහාවිහාරයේ මහාසීමාව බන්ධනය කිරීම සඳහා දේවානම්පියතිස්ස රජු රන්නඟුලෙන් සීමාව සලකුණු කළ අයුරු දැක්වෙන කල්‍යාණී රාජමහාවිහාරයේ බිතුසිතුවමකි.


නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!
(භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!)

# 1. උදකුක්ඛේපසීමා සහ සීමා-උපචාර විනිශ්චය

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අර්හත් වූ දශබලධාරී සර්වඥ සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් 'සඞ්ඝසුට්ඨුතා' ආදි දශ කරුණක් සලකමිනි, විනය ශික්‍ෂාපද පණවන්නට යෙදුණේ. එසේ පැණවූ ශික්‍ෂාපද හිස්මුදුනින් පිළිගත් සැදැහැති පැවිදි-ශ්‍රාවකයෝ දිවි පරදුවට තබා එම ශික්ෂාපද ආරක්ෂා කළහ. සියුම් විනය කරුණු පවා වෙසෙසින් ගරු කළහ. විනය විනිශ්චයන්හි දී ගරු පක්‍ෂය සලකා එනයින් විනිශ්චය කිරීම ප්‍රකරණාගත පිළිවෙළ යි. එයට හේතුව නම්, "අනුමත්තේසු වජ්ජේසු භයදස්සාවි සමාදය සික්ඛති සික්ඛාපදේසු" යනුවෙන් බුද්ධශ්‍රාවක භික්‍ෂුව සුළු වරදෙහිත් බිය වෙමින් ශික්‍ෂාපද මනා කොට ආරක්‍ෂා කරන බව සර්වඥයන් වහන්සේ විසින් ම දේශනා කර තිබීම යි. ඒ අනුව මෙම ග්‍රන්ථයෙන් ඉදිරිපත් කෙරෙන්නේ ද උදකුක්ඛේපසීමා සහ සීමා-උපචාර පිළිබඳ ව සුළු වරදෙහිත් බිය වෙමින් අනුගමනය කළ යුතු නිවැරදි ගරු පිළිවෙත යි. එසේ ම අදාළ කරුණු ඉදිරිපත් කරනු ලබන්නේ ථේරවාද මහාවිහාරීය  පාළි-අට්ඨකථා-ටීකාවන්ට අනුගත ව යි.

# 2. සීමාවක අවශ්‍යතාව

බුද්ධශාසනයෙහි උපසම්පද භික්‍ෂූන් පිළිබඳ උපසම්පද - උපෝසථ - පවාරණ - සම්මුතිදාන - පරිවාසදානාදිය මෙන් ම තජ්ජනීයාදි සියලු විනයකර්ම සිදු කරනු ලබන්නේ, (1). ඤත්තිකම්ම (2). ඤත්තිදුතියකම්ම (3). ඤත්තිචතුත්ථකම්ම (4). අපලෝකනකම්ම යන චතුර්විධ කර්මයන්ගේ වශයෙන් අදාළ පරිද්දෙනි. 'විනයකර්ම' නමින් හඳුන්වනු ලබන භික්‍ෂූන්ගේ එම විනයකටයුතු සිදු කරනුයේ,  ඒකච්ඡන්දයෙනි. ඒ සඳහා භික්‍ෂූන්ගේ සාමග්‍රිය ලබා ගැනීමට සම්මත කරගන්නා ප්‍රදේශය 'සීමා' නමින් හැඳින්වේ. සීමාවක් සම්මත කර ගනු ලබන්නේ වර්ග වීමකින් තොර ව එම සීමාව තුළ සිටින  සමගි සඞ්ඝයාගේ  ඡන්දය ලබා ගෙන  නිසි  පරිදි විනයකර්ම  සිදු කර ගැනීම සඳහා ය.



ප්‍රධාන වශයෙන් සීමා ප්‍රභේද දෙකකි. එනම්,

(1). බද්ධසීමා (2). අබද්ධසීමා

බද්ධසීමා තුන්වර්ගයකි.

(1). ඛණ්ඩසීමා (2). සමානසංවාසසීමා (3). අවිප්පවාසසීමා

අබද්ධසීමා ද තුන්වර්ගයකි.

(1). ගාමසීමා (2). සත්තබ්භන්තරසීමා (3). උදකුක්ඛේපසීමා

- මාතිකට්ඨකථා හේ.මු. 7 පිටුව -

මෙයින් අපගේ ප්‍රස්තුතයට අදාළ වන්නේ අබද්ධසීමා සඞ්ඛ්‍යාවට අයත් වන උදකුක්ඛේපසීමාව යි.

# 3. උදකුක්ඛේපසීමාව

උදකුක්ඛේපසීමාව පිළිබඳ ව විනයපිටකයේ මහාවග්ගපාළියේ උපෝසථක්ඛන්ධකයෙහි සර්වඥයන් වහන්සේ විසින් දේශනා කර තිබෙන්නේ මෙපරිද්දෙනි. එනම්,

**"නදියා වා භික්ඛවේ සමුද්දේ වා ජාතස්සරේ වා යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛේපා අයං තත්‍ථ සමානසංවාසා ඒකූපෝසථා"**

"මහණෙනි, නදියක හෝ සමුද්‍රයෙහි හෝ විලක හෝ යම් පෙදෙසක් මධ්‍යමබල ඇති පුරුෂයාගේ හාත්පස දිය ඉසීමෙන් පිරිසිඳේ ද, මේ උදකුක්ඛේපසීමාව වනාහි එහි සමානසංවාස ඒකූපෝසථ-සීමාව යි"

- මහාවග්ගපාළි - උපෝසථක්ඛන්ධකය බු.ජ. 268 පිටුව -

ඒ අනුව පැහැදිලි වන පරිදි මැදුම්බල ඇති පුරුෂයෙකු විසින් නදියක හෝ සමුද්‍රයක හෝ විලක හෝ හාත්පස දිය ඉසින්නේ ද එම ජලය වැටෙන ප්‍රදේශයෙන් ඇතුළත උදකුක්ඛපසීමාව පිහිටයි. මැදුම්බල ඇති පුරුෂයා විසින් හාත්පස දිය ඉසීම කළ යුතු ආකාරය හා සීමාපරිච්ඡේදය සිදු වන ආකාරය පිළිබඳ ව වඩාත් පැහැදිලි ව සඳහන් වන්නේ සමන්තපාසාදිකා, කඞ්ඛාවිතරණී යන විනයට්ඨකථාවන්හි හාවජිරබුද්ධි, විමතිවිනෝදනී, විනයාලඞ්කාර, විනයත්‍ථමඤ්ජූසා යන ටීකාවල ය. ඒ පිළිබඳ වූ අට්ඨකථාපාඨ මෙසේ ය.

"යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛේපා'ති යං ඨානං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තතෝ උදකුක්ඛේපේන පරිච්ඡින්නං, තත්‍ථ යථා අක්ඛධුත්තා දරුගුළං ඛිපන්ති, ඒවං උදකං වා වාලිකං වා හත්ථේන ගහෙත්‍වා මජ්ඣිමේන පුරිසේන සබ්බත්‍ථාමේන ඛිපිතබ්බං. යත්‍ථ ඒවං ඛිත්තං උදකං වා වාලිකා වා පතති අයං උදකුක්ඛේපෝ නාම ;"

- කඞ්ඛාවිතරණී-මාතිකට්ඨකථා - හේ.මු. 8 පිටුව, මෙම අදහස ම සමන්තපාසාදිකා විනයට්ඨකථාවෙහි 785 පිටුවෙහි ද සඳහන් වේ. -

"යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛේපා" යන දේශනාපාළියෙහි අර්ථය නම්, 'යම් පෙදෙසක් බලමැදුම් (මධ්‍යම ප්‍රමාණයේ ශක්තිය ඇති) පුරුෂයාගේ හාත්පස දිය ඉසීමෙන් පිරිසිඳේ ද එම පෙදෙස ය' යනු යි. එහි ලා දිය ඉසීම කළ යුත්තේ මෙපරිද්දෙනි. එනම්,

අක්ෂධූර්තයෝ (සූදු කෙළියෙහි යෙදුණු අය) දාදුකැටය යම් සේ දමත් ද එපරිද්දෙන් දිය හෝ වැලි හෝ අතට ගෙන බලමැදුම්-පුරුෂයා විසින් මුළු වැර යොදා එම දිය හෝ වැලි හෝ විසි කරන පරිද්දෙනි. එසේ විසි කරන දිය හෝ වැලි හෝ යම් දුරකට වැටෙයි ද එය 'උදකුක්ඛේපය' නම්.

මෙම විවරණයෙන් පැහැදිලි කෙරෙන බලමැදුම්-පුරුෂයා කෙබඳු තත්ත්වයක කෙනෙක් ද? යන්න අවිනිශ්චිත ය. එහෙත් බෙලහීන නො වූත් රණශූරයෙකු මෙන් අතිබල සහිත නො වූත් මධ්‍යම බලැති පුරුෂයෙකු බව පැහැදිලි ය. එබඳු පුරුෂයෙකු දිය හෝ වැලි හෝ අතින් ගෙන දාදුකැටයක් දමන පරිද්දෙන් මුළු වැර යොදා හාත්පස විසි කරන විට එම දිය හෝ වැලි හෝ වැටෙන දුර ප්‍රමාණය 'උදකුක්ඛේපය' නම්. මෙහි දී සැලකිය යුතු කරුණු කිහිපයක් ඇත.

## 3-1. බලමැදුම්-පුරුෂයා

මෙහි ලා බලමැදුම්-පුරුෂයා යනු, ශරීර-ප්‍රමාණයෙන් නොව ශරීර-ශක්තියෙන් මධ්‍යම බල ඇති පුරුෂයා ය. මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් ටීකාවන්හි සඳහන් වේ. එනිසා දුර්වල මහල්ලෙකු ද නො වන කුඩා දරුවෙකු ද නො වන රණශූරයෙකු බඳු අතිබල පුරුෂයෙකු ද නො වන මධ්‍යම බලැති, සිරුරක් ඇති නිරෝගි පුරුෂයෙකු විසි කරන දිය හෝ වැලි හෝ වැටෙන දුර ප්‍රමාණය උදකුක්ඛේපය ලෙස සැලකීම සුදුසු බව පෙනේ.

එබඳු පුරුෂයෙකු ලවා දිය හා වැලි විසි කරවූ විට දිය හා වැලි වැටුණු දුර ප්‍රමාණ මෙසේ ය.

(1). ජලය පමණක් විසි කළ විට අඩි 30 - 35 පමණ
(2). වැලි පමණක් විසි කළ විට අඩි 40 පමණ
(3). ජලය-වැලි (තෙත වැලි) විසි කළ විට අඩි 50 පමණ

මේ අනුව උදකුක්ඛේපය අවම වශයෙන් අඩි 30 -35 පමණ දුරට විහිදෙන බවට කිසිදු සැකයක් නැත. උදකුක්ඛේපය සැලකිය යුත්තේ විනයකර්ම සිදු කිරීම සඳහා කර්මාපේක්ෂාවෙන් යුතු ව දියට බට සඟපිරිස කෙළවර සිට හාත්පස විහිදී යන පරිද්දෙනි. මේ අනුව ජලය තුළ සඟපිරිස කෙළවර සිට අඩි 30 දුරට උදකුක්ඛේපය නිසැක වශයෙන් ම විහිදී යයි.

## 3-2. විසි කරන වේගය

උදකුක්ඛේපය දළ වශයෙන් දැන ගත හැකි වන පරිදි දිය ඉසීම කළ යුතු අකාරය අට්ඨකථාවෙහි විවරණය කර තිබෙන්නේ "උදකං වා වාලිකං වා හත්ථේන ගහෙත්වා මජ්ඣිමේන පුරිසේන සබ්බත්ථාමේන ඛිපිතබ්බං" යනුවෙනි. එනම්, බලමැදුම්-පුරුෂයා විසින් දිය හෝ වැලි හෝ අතින් ගෙන මුළු වැර යොදා (සබ්බත්ථාමේන) විසි කිරීම සිදු කළ යුතු ය. ඒ අනුව උපරිම ශරීර ශක්තිය යොදා ය, දිය හෝ වැලි හෝ විසි කිරීම කළ යුත්තේ.

සාමාන්‍යයෙන් දක්නට ලැබෙන කරුණක් වන්නේ, විනයකර්මවල දී මූලිකත්වය ගන්නා මහතෙරුන් වහන්සේ විසින් උදකුක්ඛේපය සලකුණු කරමින් දිය ඉසීම කරනු ලැබීම යි. දිය ඉසීම සිදු කරන මහතෙරුන් වහන්සේ වයෝවෘද්ධ දුර්වල අයෙකු නම්, එබඳු කෙනෙකු දිය ඉසීමෙන් පිරිසිඳෙන ප්‍රදේශය උදකුක්ඛේපසීමාව වන්නේ නැත. එයට හේතුව නම්, අට්ඨකථා විග්‍රහය අනුව උදකුක්ඛේපය ඊටත් වඩා ඈතට විහිදී යාම යි. ඒ නිසා වයෝවෘද්ධ තෙරුන් වහන්සේනමක විසින් දිය ඉසින අවස්ථාවක දීත් උදකුක්ඛේපසීමාව වන්නේ දිය වැටෙන එම ස්වල්ප දුර නොව බලමැදුම්-පුරුෂයා විසින් මුළු වැර යෙදා දිය විසිකරන දුර ම බව විශේෂයෙන් සලකා ගත යුතු ය. මේ අනුව තහවුරු වන තවත් කරුණක් වන්නේ යම් සඟපිරිසක් විනයකර්ම සිදු කිරීම සඳහා දියට බට කල්හි එම නදියෙහි ම තවත් භික්ෂුපිරිස් සිටිය හැකි බැවින්, 'වර්ග-සංඥාව' කරණ කොට ගෙන ස්වකීය සඟපිරිසට ආවේනික වූ 'සීමා-අපේක්ෂාව' ඇති වූ කල බුද්ධාඥාව පරිද්දෙන් බලමැදුම්-පුරුෂයෙකු මුළු වැර යොදා දිය විසි කරන ප්‍රමාණයට උදකුක්ඛේපසීමාව පිහිටන බව යි.

එම 'සීමා-අපේක්ෂාව' ('සීමා-අපේක්ෂාව' නම්, පිරිස වර්ග වීම වැළැක්වීම පිණිස වෙන ම උදකුක්ඛෙපසීමාවක් ලබා ගැනීමේ අවශ්‍යතාව යි) පිහිටුවා ගත් කල්හි උදකුක්ඛෙපය සලකුණු කර ගැනීම සඳහා දිය විසි කරන ලද්දේ හෝ දිය විසි නො කරන ලද්දේ හෝ වේවා 'කර්මාපේක්ෂාව' (විනයකර්ම කරන අදහස) ඇති භික්ෂුපිරිස කෙළවර සිට හාත්පස බලමැදුම්-පුරුෂයෙකු මුළු වැර යොදා දිය හෝ වැලි හෝ විසි කරන තරම් දුර බුද්ධාඥවෙන් ම උදකුක්ඛෙපසීමාව පිහිටයි. ඒ බව විමතිවිනෝදනී-ටීකාවෙහිත් විනයාලඞ්කාර-ටීකාවෙහිත් පැහැදිලි ව සඳහන් වේ.

## 3-3. ඇතැමුන්ගේ වැරදි මතයක්

'උදකුක්ඛෙපයෙහි සීමාව පිරිසිඳෙන්නේ විසි කරන ජලය වැටීමෙන් ම ය'යි වර්තමානයෙහි ඇතැම්හු සලකති. එහෙත් එය අත්තනෝමතියක් බව විනය-ප්‍රකරණයන්ගෙන් ම තහවුරු වේ. විනයකර්ම සිදු කරනු පිණිස පටු නදියක් තුළ සිට හාත්පස දිය හෝ වැලි හෝ විසි කරන කල්හි (නදිය පළලින් අඩු බැවින්) විසි කරන දිය හෝ වැලි හෝ නදියෙන් පිටත වූ ගොඩබිමට ද වැටෙන්නට ඉඩ තිබේ. නදියෙන් පිටත වූ ගොඩබිම වනාහි ග්‍රාමසීමාව ය. එම ග්‍රාමසීමාව උදකුක්ඛෙපයට ඇතුළත් වීම විනය විරෝධී ය. එයින් සීමාසම්භේදය හා සඞ්කර වීම සිදු වන බැවිනි. ඒ අනුව තහවුරු වන්නේ උදකුක්ඛෙපසීමාවෙහි සීමා-පරිච්ඡේදය සිදු වන්නේ, ඇතැම් ඇදුරන් අදහස් කරන පරිදි හුදෙක් දිය ඉසීමෙන් නොව කර්මාපේක්ෂාවෙන් (විනයකර්ම සිදු කරනු කැමැත්තෙන්) දියට බට සඟපිරිසක් තුළ වර්ගසංඥාව කරණ කොට ගෙන උදකුක්ඛෙපසීමා-අපේක්ෂාවක් ඇති කර ගැනීමෙන් බව ය.


මෙහි ලා 'වර්ගසංඥාව' යනු කුමක් දැ'යි කියා පැහැදිලි ව වටහා ගත යුතු ය. විනයකර්ම කරනු පිණිස නදියකට හෝ ස්වභාවික ජලාශයකට හෝ සාගරයකට හෝ බට සඟපිරිස තුළ, මෙකී නදී ආදි ක්ෂේත්‍ර විශාල බැවින් තමන් සිටින තැනින් පරව තවත් භික්ෂූන් හෝ සඟපිරිස් හෝ ඇති දැ'යි කියා විමතිය ඇති වේ. එයට හේතුව නම්, මුළු නදිය ම හෝ සාගරය ම හෝ ස්වභාවික ජලාශය ම හෝ එක ම සීමාවක් සේ ගිණිය හැකි බැවිනි. ("සබ්බා භික්ඛවේ නදී අසීමා" යනාදි වශයෙන් "මහණෙනි සියලු නදී අසීමා ය" යනුවෙන් බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලද්දේ නදී ආදිය 'අබද්ධ-සිමාවක්' නො වන බව දැක්වීමට නොව එය බද්ධසීමා බන්ධනයට සුදුසු ක්ෂේත්‍රයක් නො වන බව දැක්වීමට ය. එබැවින් මුළු නදිය ම හෝ මුළු සාගරය ම හෝ මුළු ස්වභාවික ජලාශය ම හෝ අත්පස නො හළ සඞ්ඝයාට විනයකර්ම කිරීමට සුදුසු අබද්ධසීමාවක් බව දත යුතු ය). ඒ අනුව එබඳු වූ විශාල අබද්ධසීමාවක් තුළ සුළු සඟපිරිසකට සැකයකින් තොර ව විනයකර්ම සිදු කර ගැනීමට පහසුව සලසන භාග්‍යවතුන් වහන්සේ ඒ තුළ උදකුක්ඛෙපසීමාවක් පිහිටුවා ගැනීමට අනුදැන වදාළහ. ඒ අනුව නදිය ම සීමාවක් ලෙස ගත හැකි ව තිබිය දී විනයකර්ම කිරීම සඳහා නදියකට බට ඕනෑ ම සඟපිරිසකට එම නදියෙහි ම තවත් සඟපිරිසක් හෝ භික්ෂුවක් හෝ සිටිය හැකි ය යන සැකය මත 'වර්ගසංඥාව' පහළ වේ. කරුණු මෙසේ හෙයින් එබඳු වර්ගසංඥාවක් හේතුවෙන් ස්වකීය සඟපිරිසට උදකුක්ඛෙපසීමාවක් පිළිබඳ අපේක්ෂාවක් පහළ වීමත් සමඟ ස්වභාවයෙන් ම බලමැදුම්-පුරුෂයෙකුගේ උදකුක්ඛෙපනයෙන් පිරිසිඳෙන තැන තෙක් උදකුක්ඛෙපසීමාවක් පිහිටයි.

දිය විසි කිරීමෙන් පිරිසිඳෙන ප්‍රදේශය එක් අයෙකුගෙන් තවත් අයෙකුට වෙනස් විය හැකි ය. ඇතැමෙකුගේ රියනක් විය හැකි ය. ඇතැමෙකුගේ රියන් දෙක-තුනක් විය හැකි ය. ඇතැමෙකුගේ රියන් දහයක්-පසළොසක් පමණ විය හැකි ය. එබඳු විවිධත්වයක් උදකුක්ඛෙපයකට තිබීම සීමා පිළිබඳ ව සඞ්කාවට (සැකයට) හේතු වේ. එබැවින් ඉහත සඳහන් පරිදි බලමැදුම්-පුරුෂයෙකුගේ මුළු වැර යොදා දිය විසි කිරීම අඩි 30 අනිවාර්යයෙන් සිදු වේ ය'යි සැලකිය යුතු ය. භාග්‍යවතුන් වහන්සේ අදහස් කළ උදකුක්ඛෙපසීමා පරිච්ඡේදනය විය යුත්තේ එය යි.එබැවින් දිය විසි කිරීම කළත් නො කළත් ඉහත කී 'වර්ගසංඥාව' හා 'සීමා-අපේක්ෂාව' ඇති කල භාග්‍යවතුන් වහන්සේ අදහස් කළ පමණින් ස්වභාවයෙන් ම උදකුක්ඛෙපසීමාව පිහිටයි. එහි ලා භාග්‍යවතුන් වහන්සේ අදහස් කළ ප්‍රමාණය, මෙපමණ ම ය'යි ඒකාන්ත වශයෙන් නිශ්චිත නො වන හෙයින් 'සීමා-සඞ්කාව' හා 'කර්ම-සඞ්කාව' දුරු කර ගැනීම පිණිස තවත් එබඳු අනුමානික උදකුක්ඛෙපයක් සීමා-උපචාරය ලෙස පිරිසිදු කර ගැනීමත් සත්‍ය සීමා-පරිච්ඡේදයට කී හත්ථපාසානයනාදි 'සීමා-විශෝධනවිධාන' (එනම්, සීමා-උපචාරය තුළ සිටින භික්ෂූන් ද අත්පසට කැඳවා ගැනීම හෝ සීමා-උපචාරයෙන් ඉවත් කරවීම යනාදිය) එම උපචාර ප්‍රදේශය තුළ ද අනිවාර්ය බවත් අට්ඨකථාචාර්යයන් වහන්සේලා ප්‍රකාශ කර ඇත්තාහ.

මෙහි ලා ගැටලුවක් මතුවේ. එනම්, පාචිත්තියපාළියෙහි භික්ඛුනීවිභඞ්ගයෙහි ඇතැම් තැනක "උදකං වා පරික්ඛිපිත්වා" යයි ද විනය අට්ඨකථාවෙහි, "උදකං වා වාලිකං වා ගහෙත්වා සබ්බථාමේන ඛිපිතබ්බං" (එනම්, "දිය හෝ වැලි හෝ ගෙන මුළු වැර යොදා විසි කළ යුතු ය") යනුවෙන් ද ප්‍රකාශ කොට ඇත්තේ කුමක් නිසා ද? කියා ය. එසේ සඳහන් වන්නේ ඉහත දැක්වූ පරිදි බුදුරජාණන් වහන්සේගේ ආඥාව අනුව පිහිටන උදකුක්ඛේපසීමාව දළ වශයෙන් දැනගැනීමට පහසු වීම පිණිස ය. එනම්, ගෘහෝපචාර - ග්‍රාමෝපචාර දැනගැනීම සඳහා කුල්ල විසි කිරීම ගල්කැට විසි කිරීම ආදිය දැක්වූ පරිද්දෙනි. එහි දී කුල්ල විසි නො කළේ ද ගෘහෝපචාරය, භාග්‍යවතුන් වහන්සේ අදහස් කළ පමණින් පිහිටන්නේ යම් සේ ද මෙම උදකුක්ඛේප-කථාවෙහි ද සීමා පිහිටීම එසේ ම සිදු වන බව දත යුතු ය. නමුත් එසේ පිහිටි 'සීමා-පරිච්ඡේදය' දිය හෝ වැලි හෝ විසි කර දළ වශයෙන් දැනගැනීම විනයකර්ම සඳහා අතිශය උපකාරී වෙයි. එපමණක් ද නොව දිය හෝ වැලි හෝ විසි කිරීමේ ක්‍රියාසිද්ධිය තුළ 'වර්ගසංඥාව' පහළ වීමත් 'සීමා-අපේක්ෂාව' ඇති වීමත් යන උදකුක්ඛේපසීමාවක් පිහිටීමට අවශ්‍ය මූලික අංග යුගලය සිද්ධියට (සම්පූර්ණත්වයට) පත් වේ. එනම්, දිය හෝ වැලි හෝ විසි කිරීම කරනුයේ උදකුක්ඛේපසීමාවක් ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. ඒ අනුව 'සීමා-අපේක්ෂාව' සිද්ධ ය. උදකුක්ඛේපසීමාවක් ලබා ගැනීමේ අපේක්ෂාව පහළ වූයේ පර්යාය (වක්‍රාකාර) වශයෙන් හෝ නිෂ්පර්යාය (වක්‍රාකාරයෙන් නොව, ඒකාන්ත ලෙස) වශයෙන් හෝ එම නදිය / සාගරය / ජලාශය තුළ තවත් සඟපිරිසක් නැතහොත් භික්ෂුපිරිසක් / භික්ෂුවක් සිටිය හැකි ය යන සැකය හේතුවෙනි. එයින් 'වර්ගසංඥාව' සිද්ධ ය. මෙය මෙසේ දක්වනු ලබන්නේ අත්තනෝමතියක් ලෙස නොව විමතිවිනෝදනී, විනයාලඞ්කාර යන අතිප්‍රශස්ථ ටීකා ද්වයෙහි ම එන සීමා පිළිබඳ විග්‍රහයක් වශයෙනි. එම 'වර්ගසංඥාව' ඇති කර ගත් කල්හි හාත්පස දිය හෝ වැලි හෝ විසි කිරීම කළ ද නො කළ ද බුද්ධාඥාව පරිදි බලමැදුම්-පුරුෂයෙකු මුළු වැර යොදා දිය හෝ වැලි හෝ විසි කරන තරම් දුර උදකුක්ඛේපසීමාව පිහිට යි. ඉන් ඔබ්බෙහි එපමණ වූ ම දුරක් උදකුක්ඛේපසීමාවේ උපචාරය තැබිය යුතු යි.මෙම උදකුක්ඛේපසීමාව හා සීමා-උපචාරය ප්‍රකෘති වර්ෂාකාලයෙහි නදිය හෝ ජලාශය හෝ දියෙන් යටවන ප්‍රදේශය දක්වා විහිදී යයි. ඉන් ඔබ්බට නො යයි. එනිසා උදකුක්ඛේපසීමාව පිරිසිඳීම සඳහා දිය හෝ වැලි හෝ විසි කිරීම මෙහි ලා අනිවාර්ය අංගයක් නොවේ. එහි දී අනිවාර්ය අංගය විය යුත්තේ උදකුක්ඛේපසීමාව හා එහි උපචාරය ග්‍රාමසීමාව සමග සඞ්කර වී නැති බව, ඉතා හොඳින් පරීක්ෂා කර බලා සැක හැර දැන ඉහත කී පරිදි 'වර්ගසංඥාව' පිහිටුවා ගැනීම යි. රැස් ව සිටින සඟපිරිස ස්වකීය උදකුක්ඛේපසීමාවේ පරිච්ඡේදය දළ වශයෙන් හෝ දැනගෙන තිබීම අවශ්‍ය නිසා ඉහත සඳහන් කළ පරිදි හාත්පස දිය හෝ වැලි හෝ විසි කිරීම වරදක් නො වේ. එහෙත් උදකුක්ඛේපසීමාව පිහිටන්නේ දිය විසි කිරීමෙන් ම ය'යි කියා එයින් වරදවා ගෙන දිට්ඨානුගතියට නො යා යුතු ය.

# 4. උදකුක්ඛේපසීමාවේ පරිච්ඡේදය දළ වශයෙන් දැනගැනීම

විනයකර්ම කිරීම සඳහා සඟපිරිස නදිය හෝ ජලාශය තුළට අවතීර්ණ වී සියලුදෙනා අත්පසට පැමිණ සිටි කල්හි පිරිස කෙළවර සිට මැදුම්බල ඇති භික්ෂුවක විසින් දිය හෝ වැලි හෝ අතින් ගෙන "උදකුක්ඛේපං කරෝමි" ("දිය විසි කරමින් උදකුක්ඛේපසීමාව සලකුණු කරමි") යනුවෙන් පවසමින් හාත්පස දිශා කිහිපයකට (සතරක් හෝ ඊට වැඩි වන ලෙස) දිය විසි කිරීමෙන් සීමාව පරිච්ඡේද කළ හැකි ය. මෙය වනාහි දළ වශයෙන් තම උදකුක්ඛේපසීමාව සලකා ගැනීමේ උත්සාහයක් පමණි. විනයකර්ම සිදු කරන සඟපිරිසට පහසුවෙන් වැඩහිඳීමට නදියෙහි හෝ ජලාශයෙහි හෝ ඉඩකඩ ඇති අට්ටාලයක් ඉදි කර ගැනීම සාමාන්‍ය පිළිවෙත යි. සමහර ඇඳුරුකෙනෙක් මෙම අට්ටාලය වටා ගමන් කරමින් අට්ටාලය හාත්පස දිය හෝ වැලි හෝ විසි කරනු දක්නට ලැබේ. එහෙත් එය සාවද්‍ය ය. උදකුක්ඛේපසීමාව පිහිටන්නේ අට්ටාලයේ දිග-පළල අනුව නොව කර්මාපේක්ෂාවෙන් අත්පස රැස්වී සිටින සඟපිරිස අනුව ය. ඒ නිසා දිය හෝ වැලි හෝ විසි කිරීම කළ යුත්තේ අට්ටාලය වටා යමින් අට්ටාලයේ දිග-පළල අනුව නොව කර්මාපේක්ෂාවෙන් අත්පස රැස්ව සිටින සඟපිරිස කෙළවර සිට ය.





අට්ටාලය වටා යමින් දිය විසි කිරීම

දිය විසි කළ යුත්තේ අට්ටාලය වටා යමින් නොව මෙලෙස සඟපිරිස කෙළවර සිට ය.


## 5. අත්පස (හත්ථපාස)

උදකුක්ඛේපය තුළ සඟපිරිස ඔවුනොවුන්ගේ අත්පසින් වැඩසිටිය යුතු අතර අත්පස (හත්ථපාස) ලෙස සැලකෙන්නේ රියන් 2½ දුර ප්‍රමාණයකි. 'විනයකර්ම-අත්පස' රියන් 1½ ලෙස ඇතැම් ඇදුරෝ සලකති. 'විනයකර්ම-අත්පස' ලෙස විශේෂයෙන් සැලකෙන අත්පසක් පිළිබඳ ව විනය පෙළ, අට්ඨකථා, ටීකා ප්‍රකරණවල සඳහන් නො වේ. එනමුත් විනයකර්මවල දී රියන් 1½ දුර ප්‍රමාණයකින් ඔවුනොවුන්ට සමීප ව හිඳීම වඩාත් ආරක්ෂිත ය. එනිසා විනය ගරු කරන ඇදුරන් විසින් රියන් 1½ දුර ප්‍රමාණයකින් ඔවුනොවුන්ට සමීප ව අත්පසින් හිඳිනු ලැබීම වඩාත් සුදුසු පිළිවෙතක් බව සඳහන් කළ හැකි ය.

මේ පිළිබඳව තව දුරටත් මෙසේ විග්‍රහ කළ හැකි ය. අසුන්ගෙන සිටින භික්ෂූන් අතර ඔවුනොවුන්ගේ අත්පස සලකනු ලබන්නේ පහත රූප සටහනෙහි දැක්වෙන පරිදි 'අ' භික්ෂුවගේ පිටුපස කෙළවර සිට ය.






'අ' භික්ෂුවගේ පිටුපස කෙළවර සිට රියන් 2½ දුරක් තුළ 'ආ' භික්ෂුව සිටියි.
රියන් 2½ ඉක්ම ගියේ නම් කායසාමග්‍රිය නැති ව යාමෙන් පිරිස වර්ග වේ.




අතේ වැලමිටෙහි සිට ඇඟිලි අග දක්වා ප්‍රමාණය
සාමාන්‍යයෙන් රියනක් ලෙස සැලකේ. එබඳු රියන් 2½ දුර අත්පස ය.

භික්ෂූන් අසුන් ගන්නා ක්‍රමය අනුව පර්යඞ්කය සඳහා රියනක දුර ප්‍රමාණයක් අත්හළ කල්හි 'අ' සහ 'ආ' භික්ෂූන් දෙදෙනා ඔවුනොවුන්ට රියන් 1½ දුර නො ඉක්මවා සිටිය යුතු ය.







මැද හිඳින භික්ෂුවගේ දෙපසින් හිඳින භික්ෂූහු මැද හිඳින භික්ෂුවට රියන් 2½ දුර නො ඉක්මවා සිටිය යුත්තාහ. මැද හිඳින භික්ෂුවගේ මධ්‍යයෙහි සිට පර්යඞ්කාසනය සඳහා එක් පසෙකට රියන බැගින් අත්හළ විට ඉතිරි දුර ප්‍රමාණය වන රියන් 1½ නො ඉක්මවා සෙසු සමීපස්ථ භික්ෂූහු සිටිය යුත්තාහ. ඒ අනුව විනයකර්ම සඳහා අත්පස රියන් 1½ ලෙස සැලකීමට විනයධර ඇදුරන් පුරුදු වී ඇත්තේ පර්යඞ්කාසනයේ කෙළවර සිට ඔවුනොවුන් රියන් 1½ දුර නො ඉක්මවා සිටිය යුතු බැවිනි.

# 6. උදකුක්ඛේපසීමාවේ උපචාරය

ඉහත සඳහන් කළ පරිදි උදකුක්ඛේපසීමාවේ පරිච්ඡේදය දළ වශයෙන් විනා නියමාකාරයෙන් විනිශ්චය කිරීම දුෂ්කර ය. උදකුක්ඛේපසීමාව දළ වශයෙන් දැන ගත හැකි වන්නේ බලමැදුම්-පුරුෂයෙකු වැලි හෝ දිය හෝ අතින් ගෙන දාදුකැටයක් විසි කරන පරිද්දෙන් මුළු වැර යොදා විසි කිරීමෙහි දී එම දිය හෝ වැලි හෝ වැටෙන දුර ප්‍රමාණය අනුව බව ඉහත දක්වන ලදී. මෙහි ලා බලමැදුම්-පුරුෂයාගේ ශක්තිය පිළිබඳ ව පැහැදිලි නිශ්චයක් නැත. එසේ ම යොදන මුළු වැර පිළිබඳ ව ද නිශ්චයක් නැත. මේ අනුව භාග්‍යවතුන් වහන්සේ අදහස් කළ පරිදි උදකුක්ඛේපසීමාවේ නියම දුර ප්‍රමාණය අවිනිශ්චිත ය. එම නිසා උදකුක්ඛේපසීමාව සඳහා උපචාරය තිබීම අත්‍යාවශ්‍ය කරුණකි. සීමා-උපචාරය නම්, සීමාවට සමීප වූ ද සීමාවට අදාළ නො වන සෙසු ප්‍රදේශ සීමාව සමඟින් සම්බන්ධ වී සඞ්කර වීම වළක්වන්නා වූ ද ප්‍රදේශය යි. බද්ධසීමාවකට (ඛණ්ඩසීමාවකට) ද සීමා-උපචාරයක් අවශ්‍ය ය. එහෙත් එම සීමා-උපචාරය අවම වශයෙන් අඟල් සතරක් තරම් වුව ද ප්‍රමාණවත් ය. එනමුත් උදකුක්ඛේපසීමාවේ උපචාරය ඊට හාත්පසින් ම වෙනස් ය. උදකුක්ඛේපසීමාවේ දුර ප්‍රමාණය සලකනු ලබන්නේ සඟපිරිස කෙළවර සිට බලමැදුම්-පුරුෂයෙකු දිය හෝ වැලි හෝ අතට ගෙන මුළු වැර යොදා දාදුකැටයක් විසි කරන පරිද්දෙන් එම දිය හෝ වැලි හෝ විසි කරන විට වැටෙන දුර ප්‍රමාණය අනුව බව ඉහත සඳහන් විය. උදකුක්ඛේපසීමාවේ උපචාරය වශයෙන් සැලකිය යුත්තේ ද එබඳු ම දුර ප්‍රමාණයකි. ඒ අනුව උදකුක්ඛේපසීමාවක් සඞ්කරදෝෂාදියෙන් විරහිත ව පැවතීම සඳහා එක් උදකුක්ඛේපයක දුරක් සීමාව වශයෙන් ද තවත් එබඳු ම උදකුක්ඛේපයක් සීමා-උපචාරය වශයෙන් ද යන ලෙසින් උදකුක්ඛේප දෙකක දුර ප්‍රමාණයෙන් යුක්ත විය යුතු ය. ඒ මෙසේ ය.




(1) $A_1$ දුර = බලමැදුම්-පුරුෂයා දිය හෝ වැලි හෝ අතට ගෙන දාදුකැටයක් විසි කරන පරිද්දෙන් මුළු වැර යොදා එම දිය හෝ වැලි හෝ විසි කරන විට වැටෙන දුර ප්‍රමාණය හෙවත් උදකුක්ඛේපසීමාව.

(2) $A_2$ දුර = උදකුක්ඛේපයේ දුර බඳු තවත් දුර ප්‍රමාණයක් වන උදකුක්ඛේපසීමා-උපචාරය.

මෙම උදකුක්ඛේපසීමාව තුළ හෝ එබඳු ම තවත් දුර ප්‍රමාණයක් ලෙස සැලකෙන උදකුක්ඛේපසීමා-උපචාරය තුළ අත්පසින් බැහැර ව සිටින භික්‍ෂුව නිසා විනයකර්ම කෝප්‍ය (අඩාළ) වන බව කඞ්ඛාවිතරණී නම් මාතිකට්ඨකථාවෙහි සඳහන් වේ. මාතිකට්ඨකථාව වනාහි මහාඅට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ප්‍රාතිමෝක්‍ෂය වර්ණනා කරමින් එයට සම්පාදනය කරන ලද අට්ඨකථාව යි. ඒ නිසා එය ද සමන්තපාසාදිකා මහාවිනයට්ඨකථාව සේ ම එකලෙස ගරු කටයුතු තදනුබද්ධ අට්ඨකථාවකි. එම මාතිකට්ඨකථාවෙහි උදකුක්ඛේපසීමාවේ උපචාරය පිළිබඳ ව විවරණය වන පාඨය මෙසේ යි.

"යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛේපා"ති යං ඨානං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තතෝ උදකුක්ඛේපේන පරිච්ඡින්නං, තත්‍ථ යථා අක්ඛධුත්තා දාරුගුළං ඛිපන්ති, ඒවං උදකං වා වාලිකං වා හත්ථේන ගහෙත්‍වා මජ්ඣිමේන පුරිසේන සබ්බථාමේන ඛිපිතබ්බං, යත්‍ථ ඒවං ඛිත්තං උදකං වා වාලිකා වා පතති, අයං උදකුක්ඛේපෝ නාම. "අයං තත්‍ථ සමානසංවාසා ඒකූපෝසථා"ති අයං තේසු නදීආදිසු උදකුක්ඛේපපරිච්ඡින්නා සීමා සමානසංවාසා චේව ඒකූපෝසථා ච, අයං පන ඒතේසං නදීආදීනං අන්තෝයේව ලබ්භති, න බහි. තස්මා නදියා වා ජාතස්සරේ වා යත්තකං පදේසං පකතිවස්සකාලේ චතුසු මාසේසු උදකං ඔත්‍ථරති, සමුද්දේ යස්මිං පදේසේ පකතිවීචියෝ ඔත්‍ථරිත්‍වා සණ්ඨහන්ති, තතෝ පට්ඨාය කප්පියභූමි, තත්‍ථ ඨත්‍වා උපෝසථාදිකම්මං කාතුං වට්ටති. දුබ්බුට්ඨිකාලේ වා ගිම්හේ වා නදීජාතස්සරේසු සුක්ඛේසුපි සා ඒව කප්පියභූමි. සචේ පන සුක්ඛේ ජාතස්සරේ වාපිං වා ඛණන්ති, වප්පං වා කරොන්ති, තං ඨානං ගාමක්ඛෙත්තං හෝති. යා පනේසා කප්පියභූමීති වුත්තා තතෝ බහි උදකුක්ඛේපසීමා න ගච්ඡති. අන්තෝයේව ගච්ඡති. තස්මා තේසං අන්තෝ පරිසපරියන්තතෝ පට්ඨාය සමන්තා උදකුක්ඛේපපරිච්ඡේදෝ කාතබ්බෝ. සචේ පන ද්වේ සඞ්ඝා විසුං විසුං උපෝසථාදිකම්මං කරොන්ති, ද්වින්නං උදකුක්ඛේපානං අන්තරේ අඤ්ඤෝ ඒකෝ උදකුක්ඛේපෝ උපචාරත්‍ථාය ඨපේතබ්බෝ. අයං හි සත්තබ්භන්තරසීමා ච උදකුක්ඛේපසීමා ච භික්ඛූනං ඨිතෝකාසතෝ පට්ඨාය ලබ්භති. පරිච්ඡේදබ්භන්තරේ හත්‍ථපාසං විජහිත්‍වා ඨිතෝපි පරිච්ඡේදතෝ බහි අඤ්ඤං තත්තකංයේව පරිච්ඡේදං අනතික්කමිත්‍වා ඨිතෝපි කම්මං කෝපේති, ඉදං සබ්බඅට්ඨකථාසු සන්නිට්ඨානං."


- කඞ්ඛාවිතරණී මාතිකට්ඨකථා - හේ.මු. 7 පිටුව -

"යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛේපා" (බලමැදුම්-පුරුෂයාගේ හාත්පස උදකුක්ඛේපය) යනු බලමැදුම්-පුරුෂයෙකු දිය හෝ වැලි හෝ හාත්පස විසි කරන කල්හි එම ජලය/වැලි වැටීමෙන් පිරිසිඳෙන ප්‍රදේශය උදකුක්ඛේපය යි. එහි ලා දිය විසි කිරීම කළ යුත්තේ කෙසේ ද යත් අක්ෂධූර්තයෝ දාදුකැටය යම් සේ දමත් ද එපරිද්දෙන් දිය හෝ වැලි හෝ අතින් ගෙන බලමැදුම්-පුරුෂයෙකු විසින් මුළු වැර යොදා එම දිය හෝ වැලි හෝ විසි කිරීම කළ යුතු ය. එසේ මුළු වැර යොදා විසි කරන එම දිය හෝ වැලි හෝ යම් දුරකට වැටෙයි ද එම ප්‍රදේශය උදකුක්ඛේපය නම් වේ." "අයං තත්‍ථ සමානසංවාසා ඒකූපෝසථා" (මෙය සමානසංවාස වූ ඒකූපෝසථ සීමාව ය) යනු ඒ නදී ආදියෙහි බලමැදුම්-පුරුෂයාගේ දිය ඉසීමෙන් පිරිසිඳෙන ප්‍රදේශය එහි ලා "සමානසංවාස වූ ඒකූපෝසථසීමාව" වේ, යනු යි. මෙම උදකුක්ඛේපසීමාව වනාහි නදී ආදිය තුළ ම පිහිටන අතර නදියෙන් බැහැර ව නො පිහිටයි. එබැවින් නදියෙක හෝ විලක හෝ ප්‍රකෘති වර්ෂාකාලයෙහි (එනම්, වැසි සාරමාසයෙහි) යම් පෙදෙසක් දියෙන් යට වේ ද, එමෙන් ම මහාසමුද්‍රයෙහි ප්‍රකෘති දියරැළි නැඟී බැසගොස් යම් පෙදෙසක නිරතුරු ව දිය රැඳේ ද එතැන් පටන් ජලය තුළට විහිදෙන ප්‍රදේශය උදකුක්ඛේපසීමාව සඳහා කැප වූ භූමිය යි. එම ප්‍රදේශයෙහි සිට උපෝසථ ආදි විනයකර්ම කිරීම සුදුසු ය. වර්ෂාව අඩු කාලයෙහි හෝ ග්‍රීෂ්ම ඍතුවෙහි හෝ නදී-විල් ආදියෙහි දිය සිඳී ගිය කල්හිත් විනයකර්ම සිදු කිරීම සඳහා කැප වූ භූමිය වන්නේ ඉහත සඳහන් කළ ප්‍රදේශය ම ය. ඉදින් දිය සිඳී වියළී ගිය විලක වැවක් සාරනු ලැබේ ද නැතහොත් භෝග වගා කරනු ලැබේ ද ඉන්පසු එම ස්ථානය ගමට අයත් ප්‍රදේශයක් හෙවත් ග්‍රාමක්ෂේත්‍රයක් බවට පත් වේ. ඉහත සඳහන් කළ කැප භූමියෙන් පිටතට උදකුක්ඛේපසීමාව නො විහිදේ. ඉන් ඇතුළත ප්‍රදේශය තුළ පමණක් ම සීමාව විහිදේ. එබැවින් එම කැප භූමිය තුළ සිටි සඟපිරිස කෙළවර සිට හාත්පස විහිදී යන ලෙස උදකුක්ඛේපසීමාවේ පරිච්ඡේදය සැලකිය යුතු ය. ඉදින් (නදියෙහි) සඟපිරිස් දෙකක් වෙන් ව පොහොයකර්මාදි විනයකර්ම සිදු කරත් නම්, එම උදකුක්ඛේපසීමා දෙක අතරෙහි තවත් සම්පූර්ණ-උදකුක්ඛේපයක් සීමා-උපචාරය වශයෙන් තැබිය යුතු යි. මෙම සීමා එනම්, සත්තබ්භන්තරසීමා, උදකුක්ඛේපසීමා ව්‍යාප්තිය (එනම්, දුර සලකා ගැනීම) සිදු වන්නේ විනයකර්ම සිදු කිරීම සඳහා රැස් ව අත්පස (රියන් 2½ ඈත් නො වන සේ) සිටින භික්ෂුපිරිස කෙළවර සිට ය. එම සීමා-පරිච්ඡේදය තුළ අත්පසින් බැහැර ව එනම්, පිරිසෙන් වෙන් ව රියන් 2½ දුරින් සිටින භික්ෂුව මෙන් ම එම සීමා-පරිච්ඡේදයෙන් බැහැර ව තවත් එබඳු ම දුර ප්‍රමාණයක් (එනම්, සීමා-උපචාරය) නො ඉක්මවා අත්පසින් වෙන් ව සිටින භික්ෂුව ද විනයකර්මය කෝප්‍ය (අඩාළ) කරයි. මෙය සියලු (පෞරාණික) අට්ඨකථාවල විනිශ්චය යි.


- මාතිකට්ඨකථාව -

මෙම රූපසටහන්වලින් ඉහත සඳහන් කරුණ වඩාත් පැහැදිලි ලෙස දැක්විය හැකි ය.

එක් සඟපිරිසක් විනයකර්ම කරන විට සීමා-උපචාරය තැබිය යුතු ආකාරය.




සඟපිරිස් දෙකක් විනයකර්ම කරන විට සීමා-උපචාරය තැබිය යුතු ආකාරය.




$A_1$ = 'A' සඟපිරිසේ උදකුක්ඛේපසීමාව.

$A_2$ = 'A' සඟපිරිසේ සීමා-උපචාරය.

$B_1$ = 'B' සඟපිරිසේ උදකුක්ඛේපසීමාව.


$B_2$ = 'B' සඟපිරිසේ සීමා-උපචාරය.


C = 'A' සහ 'B' සඟපිරිස් දෙක එක ම නදියක විනයකර්ම සිදු කරන විට උදකුක්ඛේපසීමා දෙක අතර තවත් <u>සම්පූර්ණ</u> උදකුක්ඛේපයක් සීමා-උපචාරය සඳහා තැබිය යුතු ය. <u>එය සැකසෙන්නේ දෙපසේ සීමා-උපචාර එක්වීමෙනි</u>.

# 7. උදකුක්ඛේපසීමාවක් සඞ්කර වන ආකාරය

බද්ධසීමා - අබද්ධසීමා සම්බන්ධයෙන් ඉතා සැලකිලිමත් ව විමසා බැලිය යුතු තවත් කරුණක් වන්නේ සීමා එකිනෙක සඞ්කර වන ආකාරය පිළිබඳ ව යි. ඒ සඳහා පළමු ව සීමා පිළිබඳ 'නිස්සය-නිස්සිත' භේදය දැන ගත යුතු ය. බද්ධසීමාවක් පිහිටා තිබෙන ක්ෂේත්‍රය වන ග්‍රාම-නගරසීමාව 'නිස්සය' නම් වේ. 'නිස්සය' වූ ග්‍රාම-නගරසීමාව තුළ පිහිටා තිබෙන බද්ධසීමාව 'නිස්සිත' ය යි. මෙම 'නිස්සය' හා 'නිස්සිත' දෙක එකිනෙක ගස්වැල් ආදි කිසිවකින් සම්බන්ධ වුව ද සීමා එකිනෙක සඞ්කර වීමක් සිදු නො වේ. එහෙත් 'නිස්සිත' දෙකක් එකිනෙක සම්බන්ධ වීමෙන් එම සීමා එකිනෙක සඞ්කර වේ. උදාහරණයක් ලෙස එක ම ග්‍රාමසීමාවක් තුළ තිබෙන බද්ධසීමා දෙකක් ගස්වැල් ආදි කිසිවකින් සම්බන්ධ වීමෙන් එම බද්ධසීමා දෙක එකිනෙක සඞ්කර වේ. එම සම්බන්ධය තිබිය දී සිදු කරන සියලු විනයකර්ම කෝප්‍ය වීමෙන් අඩාළ වේ (සිද්ධියට පත් නො වේ). එනිසා විනයකර්ම සිදු කිරීමට පෙර එක ම ග්‍රාමසීමාවක් තුළ තිබෙන එම බද්ධසීමා දෙකෙහි සම්බන්ධය සිඳලිය යුතු ය. නැතහොත් භික්ෂූන්ගේ ඡන්දය ගැනීම ආදියෙන් හෝ එම සීමා දෙක ශෝධනය කිරීම කළ යුතු ය.

අබද්ධසීමාවක් වන උදකුක්ඛේපසීමාව පිහිටන ක්ෂේත්‍රය වන්නේ නදී, විල් (ජාතස්සර), මහාසමුද්‍ර බඳු ස්වභාවික ජලාශ යි . එම ක්ෂේත්‍රය උදකුක්ඛේපසීමාව පිහිටීමට 'නිස්සය' වන අතර එහි පිහිටන උදකුක්ඛේපසීමාව 'නිස්සිත' යි. මෙම 'නිස්සය - නිස්සිත' දෙක අතර සම්බන්ධයක් ඇති වීමෙන් සීමාව සඞ්කර වීම සිදු නො වේ. එහෙත් උදකුක්ඛේපසීමාව ('නිස්සිත' ය) තුළ පිහිටි යමක් ආසන්න ග්‍රාමසීමාව හෝ වෙනත් සීමාවක් හෝ සමඟ සම්බන්ධ වීමෙන් එම සීමා දෙක එකිනෙක සඞ්කර වේ. මුළු නදිය ම හෝ මුළු විල ම හෝ මුළු සමුද්‍රය ම හෝ අබද්ධසීමාවක් වන බැවින්, මුළු නදිය ම හෝ මුළු විල ම හෝ මුළු සමුද්‍රය ම හෝ එක ම අබද්ධසීමාවක් ලෙස ගෙන එම සඞ්කරය තිබිය දී සිදු කරන සියලු විනයකර්ම කෝප්‍ය වීමට ඉඩ ඇත. එම නිසා සීමා පිළිබඳ කරුණු දැනගන්නා කල්හි විශේෂයෙන් ම සීමා සඞ්කර වීම පිළිබඳ ව ද මැනවින් කරුණු උගත යුතු ය.





සීමාන්තරිකය
සම්බන්ධ වීමෙන් සඞ්කර නො වේ.
සම්බන්ධ වීමෙන් එකිනෙක සඞ්කර වේ.
සම්බන්ධ වීමෙන් සඞ්කර නො වේ.
නිස්සිත / බණ්ඩසීමාව
නිස්සිත / මහාසීමාව
නිස්සය / ගම
නිස්සය / ගම
සම්බන්ධ වීමෙන් සඞ්කර නො වේ.
නිස්සිත / මහාසීමාව
සම්බන්ධ වීමෙන් සඞ්කර නො වේ.
නිස්සය / ගම
සම්බන්ධ වීමෙන් සඞ්කර නො වේ.
සම්බන්ධ වීමෙන් එකිනෙක සඞ්කර වේ.
නිස්සය / නදිය
නිස්සය / නදිය
සම්බන්ධ වීමෙන් එකිනෙක සඞ්කර වේ.
නිස්සිත / උදකුක්ඛේපසීමාව හා උපචාරය
නිස්සිත / උදකුක්ඛේපසීමාව හා උපචාරය
සම්බන්ධ වීමෙන් එකිනෙක සඞ්කර නො වේ.
නිස්සය / නදිය


උදකුක්ඛේපසීමාවක සඞ්කරය සිදු වන ආකාරය පිළිබඳ ව සමන්තපාසාදිකා විනයට්ඨකථාවෙහි මෙසේ සඳහන් වේ.

"නදියා පන කම්මං කරිස්සාමාති ගතේහි සචේ නදී පරිපුණ්ණා හෝති සමතිත්තිකා, උදකසාටිකං නිවාසෙත්වාපි අන්තෝනදියංයේව කම්මං කාතබ්බං. සචේ න සක්කොන්ති නාවායපි ඨත්වා කාතබ්බං. ගච්ඡන්තියා පන නාවාය කාතුං න වට්ටති. කස්මා ? උදකුක්ඛේපමත්තමේවහි සීමා. තං නාවා සීඝමේව අතික්කාමේති. ඒවං සති අඤ්ඤිස්සා සීමාය ඤත්ති, අඤ්ඤිස්සා අනුසාවණා හෝති. තස්මා නාවං අරිත්තේන වා ඨපෙත්වා පාසාණේ වා ලග්ගෙත්වා අන්තෝනදියං ජාතරුක්ඛේ වා බන්ධිත්වා කම්මං කාතබ්බං. අන්තෝනදියං බද්ධෙ අට්ටකේපි අන්තෝනදියං ජාතරුක්ඛේපි ඨිතේහි කාතුං වට්ටති. සචේ පන රුක්ඛස්ස සාඛා වා තතෝ නික්ඛන්තපාරෝහෝ වා බහිනදීතීරේ විහාරසීමාය වා ගාමසීමාය වා පතිට්ඨිතෝ, සීමං වා සෝධෙත්වා සාඛං වා ඡින්දිත්වා කම්මං කාතබ්බං. බහිනදීතීරේ ජාතරුක්ඛස්ස අන්තෝනදියං පවිට්ඨසාඛාය වා පාරෝහේ වා නාවං බන්ධිත්වා කම්මං කාතුං න වට්ටති. කරොන්තේහි සීමා වා සෝධෙතබ්බා, ඡින්දිත්වා වාස්ස බහිපතිට්ඨිතභාවෝ නාසේතබ්බෝ. නදීතීරේ පන ඛාණුකං කොට්ටෙත්වා තත්ථ බද්ධනාවාය න වට්ටතියේව. නදියා සේතුං කරොන්ති. සචේ අන්තෝනදියංයේව සේතු වා සේතුපාදා වා, සේතුම්හි ඨිතේහි කම්මං කාතුං වට්ටති. සචේ පන සේතු වා සේතුපාදා වා බහිතීරේ පතිට්ඨිතා, කම්මං කාතුං න වට්ටති. සීමං සෝධෙත්වා කාතබ්බං. අථ සේතුපාදා අන්තෝ, සේතු පන උභින්නම්පි තීරානං උපරිආකාසේ ඨිතෝ, වට්ටති."

"නදියෙහි විනයකර්ම කරන්නෙමු'යි කියා භික්ෂූන් නදිය වෙත ගිය කල්හි ඉදින් නදියේ ඉවුරු මට්ටම දක්වා ම ජලයෙන් පිරී තිබේ නම්, ජලසාටිකාව (නානකඩය) හැඳ නදියට බැස (නදිය තුළ සිට ම) විනයකර්ම කළ යුතු ය. එසේ නො කළ හැකි පමණට ජලය අධික නම්, නැවක (ඔරු, පාරු ආදියක) නැඟී විනයකර්ම කළ යුතු ය. එහෙත් ගමන් කරන්නා වූ නැවක හිඳිමින් විනයකර්ම නො කළ යුතු ය. ඒ කුමක් නිසා ද? එක් උදකුක්ඛේපයක් ම සීමාව වන බැවිනි. ගමන් කරන නැවක් එම උදකුක්ඛේපසීමාව ඉතා ශීඝ්‍රයෙන් ඉක්මවා යයි. එසේ කල්හි කර්මවාක්‍යයේ 'ඤත්තිය' ප්‍රකාශ කිරීම එක් සීමාවක ද 'අනුසාවණය' කිරීම අනෙක් සීමාවක ද වන්නේ ය. එබැවින් නැව (යාත්‍රාව) හබලක (රිටක) ආධාරයෙන් නවතා ගෙන හෝ ගලක් එල්ලා 'නැංගුරම්' ලෑමෙන් හෝ නදිය තුළ ම හටගත් ගසක බැඳ තබා හෝ විනයකර්ම කළ යුතු ය. නදිය තුළ ම ඉදි කළ අටල්ලක නැඟී හෝ නදිය තුළ ම හටගත් ගසක නැඟී හෝ විනයකර්ම කිරීම සුදුසු ය. ඉදින් නදිය තුළ හටගත් එම ගසෙහි ශාඛාවක් හෝ එයින් නික්මුණු අරළුවක් හෝ නදියෙන් බැහැර ඉවුරෙහි විහාරසීමාව හෝ ග්‍රාමසීමාව හෝ සමඟින් සම්බන්ධ වන ලෙස පිහිටා තිබේ නම්, එම සීමාවෙහි සිටින භික්ෂූන්ගේ ඡන්දය ගෙන ඒමෙන් සීමාව ශෝධනය කොට හෝ නදීතීරයට සම්බන්ධ ව තිබෙන ශාඛාව සිඳ දමා හෝ විනයකර්ම කළ යුතු ය. (එම සම්බන්ධය තිබිය දී විනයකර්ම කිරීමෙන්, එම විනයකර්ම කෝප්‍ය වන බව මෙයින් ප්‍රකාශිත ය.) එසේ ම නදියෙන් බැහැර ඉවුරෙහි හටගත් ගසක ශාඛාවක් හෝ අරළුවක් හෝ නදිය තුළට පිවිස ඇති කල්හි එහි නැව (ඔරු, පාරු ආදිය) බැඳ තබා විනයකර්ම කිරීම නුසුදුසු ය. එසේ විනයකර්ම කරන්නේ නම්, එම ගස පිහිටි ග්‍රාමසීමාවෙහි හෝ විහාරසීමාවෙහි හෝ සිටින භික්ෂූන්ගේ ඡන්දය ගැනීමාදි වශයෙන් සීමාව ශෝධනය කොට ම විනයකර්ම කළ යුතු ය. නැතහොත් ගොඩබිම සමඟ ඇති සම්බන්ධය දුරු කළ යුතු ය. නදීතීරයෙහි සිටුවන ලද කණුවක නැව (ඔරු, පාරු ආදිය) බැඳ තබා විනයකර්ම කිරීම ද නුසුදුසු ය. නදියෙහි ඉදි කරනු ලැබූ පාලමක, කණු හා මුළු පාලම නදිය තුළ ම පිහිටා තිබේ නම්, (ගොඩබිමට සම්බන්ධයක් නැති නම්) එම පාලමෙහි සිට විනයකර්ම සිදු කළ හැකි ය. ඉදින් පාලම්-තට්ටුව හෝ පාලමෙහි කණු නදියෙන් බැහැර ඉවුරෙහි පිහිටා තිබේ නම්, එම පාලමෙහි සිට විනයකර්ම නො කළ යුතු ය. එසේ කල්හි පාලම සම්බන්ධ ව තිබෙන ග්‍රාමසීමා-විහාරසීමා ආදිය ශෝධනය කොට ම විනයකර්ම කළ යුතු ය. ඉදින් පාලමේ කණු නදිය තුළ ද පාලම්-තට්ටුව ඉවුරු දෙකට සම්බන්ධ නො වී ඉහළින් ද පිහිටා තිබේ නම්, එම පාලමෙහි සිට විනයකර්ම කළ හැකි ය."

\- සමන්තපාසාදිකා විනයට්ඨකථාව -


ඉහත සඳහන් කරුණු රූපසටහන් ඇසුරින් මෙසේ පෙන්වා දිය හැකි ය.





$A_1B_1$ දුර = $A_2B_2$ දුර = උදකුක්ඛේපසීමාව

$B_1C_1$ දුර = $B_2C_2$ දුර = සීමා-උපචාරය

උදකුක්ඛේපසීමාව හා සීමා-උපචාරය පිරිසිදු ව ඇති කල්හි හබලකින් / රිටකින් හෝ 'නැංගුරම්' ලෑමෙන් හෝ නදිය තුළ ම හටගත් ගසක නැව (යාත්‍රාව) බැඳ තබා හෝ විනයකර්ම කළ හැකි ය.








$A_1B_1$ දුර = $A_2B_2$ දුර = උදකුක්ඛේපසීමාව

$B_1C_1$ දුර = $B_2C_2$ දුර = සීමා-උපචාරය


උදකුක්ඛේපසීමාව හා සීමා-උපචාරය පිරිසිදු ව ඇති කල්හි නදිය තුළ ඉදි කළ අටල්ලක සිට හෝ නදිය තුළ ම හටගත් ගසක සිට හෝ විනයකර්ම කළ හැකි ය.






නදිය තුළ ම හටගත් ගසක සිට විනයකර්ම කරන කල්හි එම ගසෙහි ශාඛා හෝ අරළු හෝ නදියෙන් බැහැර ඉවුරෙහි, ග්‍රාමසීමාව හෝ විහාරසීමාව හෝ සම්බන්ධ වන ලෙස පිහිටා තිබේ නම්, සීමා එකිනෙක සඞ්කර වී ඇති බැවින් එම ගසෙහි සිට විනයකර්ම නො කළ යුතු ය.


එම ගසෙහි සිට විනයකර්ම කිරීමට අවශ්‍ය නම්, ඉවුරට සම්බන්ධ වී ඇති ශාඛා, අරළු ආදිය ඉවත් කිරීම හෝ ග්‍රාම/විහාරසීමා ශෝධනය හෝ කළ යුතු ය.




නදියෙන් බැහැර ඉවුරෙහි හටගත් ගසක ශාඛාවක් හෝ අරළුවක් හෝ නදිය තුළට පිවිස ඇති කල්හි එහි යාත්‍රාව බැඳ තබා විනයකර්ම නො කළ යුතු ය. එසේ ම ඉවුරෙහි සිටුවන ලද කණුවක යාත්‍රාව බැඳ තබා විනයකර්ම කිරීම ද නුසුදුසු ය.



පාලම හෝ පාලමෙහි කණු හෝ නදියෙන් බැහැර ඉවුරෙහි පිහිටා තිබේ නම්,
ග්‍රාමසීමා/විහාරසීමා ශෝධනය නො කොට එම පාලමෙහි සිට විනයකර්ම නො කළ යුතු ය.







$A_1B_1$ දුර = $A_2B_2$ දුර = උදකුක්ඛේපසීමාව

$B_1C_1$ දුර = $B_2C_2$ දුර = සීමා-උපචාරය

පාලමෙහි කණු හා මුළු පාලම ඉවුරට සම්බන්ධයක් නැති ව නදිය තුළ ම
පිහිටා ඇති විට එහි සිට විනයකර්ම සිදු කළ හැකි ය.
(පාලම මකුළුහුයකින් හෝ ග්‍රාමසීමාව සමඟින් සම්බන්ධ නො වී තිබිය යුතු ය )




$A_1B_1$ දුර = $A_2B_2$ දුර = උදකුක්ඛේපසීමාව

$B_1C_1$ දුර = $B_2C_2$ දුර = සීමා-උපචාරය


පාලමෙහි කණු නදිය තුළ ද පාලම ඉවුරු දෙකට සම්බන්ධ නො වී
ඉහළින් ද පිහිටා තිබේ නම්, එම පාලමෙහි සිට විනයකර්ම සිදු කළ හැකි ය.

මෙම කරුණු සම්බන්ධයෙන් උදකුක්ඛේපසීමාවල විනයකර්ම සිදු කරන සඟපිරිස් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය. නදිය තුළ ඉදි කෙරෙන අට්ටාලය කරා පහසුවෙන් ගමන් කළ හැකි වනු පිණිස ඉදි කෙරෙන පාලම් නිසා ඇතැම් අවස්ථාවල දී උදකුක්ඛේපසීමා, සීමා-උපචාර සමඟ ග්‍රාමසීමා සම්බන්ධ වීම හේතුවෙන් උපසම්පදා ආදි ගරු විනයකර්ම අඩාළ වූ අවස්ථා පිළිබඳ ව ලක්දිව ශාසන ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් දත හැකි ය. එනිසා නදියක් තුළ අට්ටාලයක් ඉදි කරන විට පහත සඳහන් කරුණු පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.


# 8. උදකුක්ඛේපසීමාව තුළ ඉදි කෙරෙන අට්ටාලය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණු

ඉහත දැක්වූ අට්ඨකථා විවරණය සැලකිල්ලට ගනිමින් උදකුක්ඛේපසීමාවල විනයකර්ම සිදු කරන සඟපිරිස්වල විශේෂ අවධානයට යොමු විය යුතු කරුණු කිහිපයකි.

## 8-1. අට්ටාලය ඉදි කළ යුතු දුර ප්‍රමාණය




$A_1B_1$ දුර = $A_2B_2$ දුර = උදකුක්ඛේපසීමාව (අඩි 35)
$B_1C_1$ දුර = $B_2C_2$ දුර = සීමා-උපචාරය (අඩි 35)



අට්ඨකථාවන්හි සඳහන් ආකාරයට උදකුක්ඛේපසීමාවේ පරිච්ඡේදය දනගැනීම සඳහා දිය විසි කරන විට සාමාන්‍යයෙන් අඩි 30 - 35 පමණ දුරට දිය වැටෙන බැවින් සඟපිරිස කෙළවර සිට උදකුක්ඛේපසීමාව සඳහා අවම වශයෙන් අඩි 35 දුර ප්‍රමාණයක් හාත්පස ඉඩ තැබිය යුතු ය. ඊට අඩු දුර ප්‍රමාණයක් තැබීම සඞ්කාදෝෂ ඇති වීමට හේතු වන බැවින් කෙසේවත් එය සුදුසු නො වේ. උදකුක්ඛේපසීමාවේ කෙළවර සිට තවත් එබඳු ම දුර ප්‍රමාණයක් (එනම්, තවත් අඩි 35) සීමා-උපචාරය සඳහා ඉඩ තැබිය යුතු ය. මේ අනුව නදිය මැද ඉදි කරන අට්ටාලයෙහි සිට හාත්පස අඩි 75 පමණ වූ ප්‍රදේශයක් උදකුක්ඛේපසීමාව හා සීමා-උපචාරය සඳහා වෙන් කළ හැකි නම්,එය ඉතා පිරිසිදු හා නිසැක උදකුක්ඛේපසීමාවකි. නදියෙහි එම ප්‍රදේශයට, ඉන් බැහැර නදීතීරයෙහි තිබෙන ගස්වැල් (අවම වශයෙන් තණකොළ ගසක් හෝ) සම්බන්ධ ව නො තිබිය   යුතු ය. නදිය මැද ඉදි කෙරෙන අට්ටාලය වෙත ගමන් කිරීමට පාලම් ආදිය නො යොදා පාරුවක් බඳු කුඩා යාත්‍රාවක් භාවිතා කිරීමෙන් සඞ්කාදෝෂ ඇති වීම දුරින් ම වළක්වා ගත හැකි ය. එනිසා  පුරාණ විනයධර උතුමෝ නදිය මැද ඉදි කෙරෙන අට්ටාලය වෙත යාමට පාලම් භාවිතා නො කර ඔරුවක් බඳු යාත්‍රාවක් ම භාවිතා කළහ.  එසේ ම අට්ටාලය වෙත ගමන් කරන පාරු, යාත්‍රා ආදිය නවතා තැබිය යුත්තේ ද සීමා-උපචාරයට ඔබ්බෙනි.

ඉදින් උදකුක්ඛේපසීමාව හා සීමා-උපචාරය සඳහා හාත්පස අඩි 75 තරම් ඉඩ තැබීමට අවකාශ නැති පටු නදියක් නම් කුමක්  කළ යුතු ද? ප්‍රකෘති වර්ෂා කාලයෙහි ජලයෙන් යටවන නදී සඞ්ඛ්‍යාවට අයත් ප්‍රදේශයෙහි තිබෙන ග්‍රාමසීමාවට අයත් ගස්වැල් ආදි කිසිවක් නදියට සම්බන්ධ නො වන සේ දෙපස ඉවුරු පිරිසිදු කර ගත යුතු ය. මෙකල නදීතීර බොහෝ සෙයින් ම රජයට අයත් දේපලක් බැවින් ඉවුරු ශෝධනාදි කටයුතු නීත්‍යානුකූල ව ම සිදු කළ යුතු ය.

පුරාණයෙහි සිට ම විනයධර භික්ෂූහු නිසැක උදකුක්ඛේපසීමාවල ම උපසම්පදා ආදි ගරු විනයකර්ම සිදු කළ බවට ශාසන ඉතිහාසය හදාරණ විට කරුණු පැහැදිලි කර ගත හැකි ය.

විනයධර භික්ෂූන් ගරු විනයකර්ම සඳහා උදකුක්ඛේපසීමා භාවිතා කිරීමට හේතු වූ විශේෂ කරුණක් ද මෙහි ලා සඳහන් කළ  යුතු ය. මහාමහින්ද මහරහතන් වහන්සේ ලඞ්කාද්වීපයට වැඩම කොට බුදුසසුන පිහිටුවා කෙටි කලක් ගත වන විට බුදුසසුන දිවයින පුරා ම ව්‍යාප්ත විය. රුහුණු, පිහිටි, මායා යන තුන්-සිංහලය ම භික්ෂූන්ගේ වාසයෙන් කසාවතින් බබළන්නට විය. භික්ෂූන් වහන්සේලා වාසය කළ සෑම ප්‍රදේශයක ම උපෝසථ-පවාරණ ආදි විනයකර්ම සිදුකිරීම සඳහා බද්ධසීමා සම්මත කිරීම ද අනිවාර්යයෙන් ම සිදු වන්නට ඇත. අට්ඨකථා ආදියෙන් පැහැදිලි වන ආකාරයට අනුරාධපුර යුගයේ මුල් කාලයෙහි සම්මත කරන ලද බද්ධසීමා වර්තමානයෙහි සම්මත කෙරෙන ඛණ්ඩසීමා බඳු කුඩා සීමා නො වුණු අතර ඒවා '<u>සීමවිහාර</u>' සේ හඳුන්වන මුළු විහාරය ම ඇතුළත් භූමිප්‍රදේශ විය.  එපමණක් ද නොව සමහර සීමා ගමක්-දෙකක් පමණ ඇතුළත් ව බැඳුනු බවට පුරාණ ශාසන ඉතිහාසයේ සාධක නැත්තේ ම නො වේ. ඒවා තුන්යොදුන් වූ මහාසීමා නොවූ යොදුනෙන් 1/5 පමණ ප්‍රදේශයක පැතිරුණු සීමා ය. ඒවා ද මහාසීමා ලෙස ම සලකනු ලැබේ. එබඳු විශාල සීමා බන්ධනය කිරීමට අවශ්‍ය වූයේ කුමක්  නිසාද? භික්ෂූන් වහන්සේලාට තුන්සිවුරුවලින් වෙන් ව කටයුතු කර ගැනීමේ පහසුව සලකා 'චීවර-අවිප්පවාසය' ලබා ගැනීම සඳහා මෙන් ම අතීතයෙහි ලක්දිව භික්ෂූන් බහුල වශයෙන් සිටි බැවිනි. වළගම්බා රජ සමයෙහි තිස්සමහාරාම විහාරයෙහි හා සිතුල්පවුව මහාවිහාරයෙහි පමණක් භික්ෂූන් වහන්සේලා දොළොස්දහස බැගින් විසිහතරදහසක් වාසය කළහ. එනිසා එබඳු විහාරවල විනයකර්ම කිරීම සඳහා අවම වශයෙන් 'සීමවිහාර' පමණින් වූ මහාසීමා තිබූ බවට සැක නැත. එබඳු මහාසීමා තුළ ඇතැම් විට ඛණ්ඩසීමා කිහිපයක් ම සම්මත කොට තිබිණි. මහාසීමා හා ඛණ්ඩසීමා බන්ධනය කිරීමේ දී යොදා ගත් නිමිතිවල පිහිටීම නියම වශයෙන් නො දන්නේ නම්, එම සීමා සමූහනනය කළ නො හැකි බව සමන්තපාසාදිකා-විනයට්ඨකථාවෙහි සඳහන් වන්නේ මෙසේ ය.

"යේ පන උභෝපි (ඛණ්ඩසීමා ච අවිප්පවාසසීමා ච) න ජානන්ති තේ නේව සමූහනිතුං න බන්‍ධිතුං සක්ඛිස්සන්ති. අයං හි සීමා නාම කම්මවාචාය වා අසීමා හෝති සාසනන්තරධානේන වා.  න ච සක්කා සීමං අජානන්තේහි කම්මවාචා කාතුං. තස්මා න සමූහනිතබ්බා. සාධුකං පන ඤත්වායේව සමූහනිතබ්බා ච බන්‍ධිතබ්බා චාති"

- සමන්තපාසාදිකා-විනයට්ඨකථා - උපෝසථක්ඛන්‍ධකවණ්ණනා - 784 පිටුව හේ.මු. -

"ඛණ්ඩසීමා හා අවිප්පවාසසීමා යන උභය සීමාවන්ගේ පරිච්ඡේද නො දන්නේ නම්, එම සීමාවන් සමූහනනය හෝ නැවත බන්ධනය කිරීම හෝ නො කළ හැකි ය. සීමා වනාහි 'අසීමා' වනුයේ (එනම්, සීමාව අහෝසි වනුයේ) සීමා සමූහනන කර්මවාක්‍යයෙන් හෝ බුදුසසුන අතුරුදහන් වීමෙනි. සීමා-පරිච්ඡේද නො දන්නහු විසින් කර්මවාක්‍ය කීම කළ නො හැකි ය. එබැවින් සීමාවේ පරිච්ඡේද (සීමාවේ පිහිටීම) මැනවින් නො දැන සීමා සමූහනනය (නැති කිරීම / ඉගිළුවීම) නො කළ යුතු ය. සීමා-පරිච්ඡේද මැනැවින් දැන ම සමූහනනය කිරීමත් බන්ධනය කිරීමත් කළ යුතු ය."

– සමන්තපාසාදිකා-විනයට්ඨකථාව –

මෙහි 'අවිප්පවාසසීමාව' ලෙස ගැනෙන්නේ 'මහාසීමාව' ය. චීවර- අවිප්පවාසයෙහි ප්‍රයෝජනය ලැබෙන්නේ මහාසීමාව තුළ බැවිනි.]

සීමා-පරිච්ඡේද නිසි ලෙස නො දැන සිදු කරන සීමා සමූහනනය සඞ්කාදෝෂ සහිත වන බව මෙයින් පෙනේ. එනිසා වර්තමානයෙහි සිදු කෙරන සීමා සම්මත කිරීමේ විනයකර්ම සඞ්කාදෝෂ සහිත (සැක කටයුතු) ය. එසේ නම්, වර්තමානයෙහි බද්ධසීමා සම්මත කරනු ලබන්නේ කෙසේ ද? පුරාණ බද්ධසීමා එතරම් දුරට නැති ප්‍රදේශවල අභිනව සීමා, සම්මත කළ හැකි ආකාරයක් විනය-ටීකාවලින් පෙන්වා දී ඇත. වර්තමානයෙහි බද්ධසීමා සම්මත කරනු ලබන්නේ ටීකාවලින් විවෘත කර ඇති එම දොරටුව පාදක කර ගෙන ය. විනය-ටීකා නො පිළිගන්නා ඇතැම් ඇදුරන් පවා එම ටීකා විවරණය පාදක කරගෙන බද්ධසීමා සම්මත කරනු දක්නට ලැබේ. එහෙත් ශාසන ඉතිහාසය සලකනවිට වර්තමානයෙහි ලක්දිව සඞ්කාදෝෂ රහිත වූ බද්ධසීමා සම්මත කළ නො හැක. එබඳු සඞ්කාදෝෂ සහිත බද්ධසීමාවල සිදු කෙරෙන විනයකර්ම ද සැක කටයුතු ය. අනුරාධපුර යුගයෙන් පසු, පුරාණයෙහි පටන් ම විනයධර උතුමන් උපසම්පදා ආදි ගරු විනයකර්ම බද්ධසීමාවන්හි සිදු නො කර උදකුක්ඛෙපසීමාවන්හි සිදුකරන ලද්දේ මේ හේතුව නිසා ය. මේ සඳහා ප්‍රමාණවත් සාධක ශාසනික ප්‍රවෘත්තීන් කියැවෙන වංශකථාවලින් දත හැකි ය.

☆ පොළොන්නරු යුගයෙහි රාජ්‍යානුග්‍රහයෙන් සිදු කළ විශේෂ උපසම්පදා විනයකර්ම මහවැලි නදියෙහි උදකුක්ඛෙපසීමාවල සිදු කොට තිබේ. ඒ වන විට ද පොළොන්නරුවේ ආළාහන පිරිවෙණ ඇසුරු කොට තිබෙන විශාල බද්ධසීමාව සහ එහි ඛණ්ඩසීමා තුන ද නො තිබුණා නො වේ. එනමුත් මහාපරාක්‍රමබාහු රජතුමා වසරක් පාසා මහවැලි නදීතීරය සමීපයට භික්ෂූන් වැඩම කරවා නදිය මැද නිශ්චල ව තැබූ යාත්‍රාවක මනරම් මණ්ඩපයක් ඉදිකරවා සිවුරු පිරිකර පුදා උපසම්පදා විනයකර්මය කරවූ බව මහාවංශයෙහි සඳහන් වේ.

☆ දඹදෙණි යුගයෙහි රාජ්‍යය කළ දෙවන පරාක්‍රමබාහු රජ දවස ද පොළොන්නරුව සමීපයෙහි මහවැලි නදියෙහි දහස්තොට නම් ස්ථානයෙහි (පුළුල් ස්ථානයක) අඩමසක් මුළුල්ලෙහි උපසම්පදා විනයකර්මය සිදු කළ බව මහාවංශයෙහි සඳහන් වේ.

☆ එසේ ම කෝට්ටේ යුගයෙහි බුරුම (රාමඤ්ඤ) රටට උපසම්පදාව රැගෙන යනු පිණිස ලක්දිවට පැමිණි සාමණේරයන් වහන්සේලා පිරිස උපසම්පදා කරවන ලද්දේ කල්‍යාණී නදියේ උදකුක්ඛෙපසීමාවක දී ය.

☆ මහනුවර යුගය ආරම්භයෙහි සිටි වීරවික්‍රම රජු ද මහවැලි නදියෙහි මණ්ඩපයක් කරවා එහි වැඩසිටි ධර්මකීර්ති මහතෙරුන් වහන්සේ ප්‍රධාන තිස්පස්නමක් වූ කාරකසඞ්ඝයා ලවා තුන්සියපණස්නමක් උපසම්පදා කරවූ බව රාජරත්නාකරයෙහි සඳහන් වේ.


☆ පළමුවන විමලධර්මසූරිය රජතුමා සසුන පිරිහී තිබෙනු දැක බුරුම (රක්ඛංග) දේශයෙන් නන්දිචක්‍ර ආදි තෙරුන් වහන්සේලා වැඩම කරවා ගෙන මහවැලි නදියේ ගැටඹේ තොටෙහි උදකුක්ඛෙපසීමාවක දී බොහෝ කුලපුත්‍රයන් උපසම්පදා කරවූ බව වංශකථාවන්හි සඳහන් වේ.

☆ දෙවන විමලධර්මසූරිය රජු ද නැවතත් බුරුම (රක්ඛංග) දේශයෙන් සන්තාන ආදි තෙරුන් වහන්සේලා තිස්තුන්නමක් වැඩම කරවා ගෙන ගැටඹේ තොටෙහි උදකුක්ඛේපසීමාවක දී තිස්තුන්නමක් උපසම්පදා කරවූ බව වංශකථාවන්හි සඳහන් වේ.

එසේ ම ඉන් පසු දහනවවන සියවසෙහි බුරුම/රාමඤ්ඤ රටට ගොස් උපසම්පදාව ලබා මෙරටට පැමිණි විනයධර උතුමෝ ද එම පරම්පරානුයාත විනයධර උතුමෝ ද උදකුක්ඛේපසීමාවන්හි උපසම්පදා ආදි ගරු විනයකර්ම සිදු කළහ. මෙලෙස වර්තමානයෙහි පවා විනයධර උතුමන් විසින් විශේෂයෙන් උදකුක්ඛේපසීමා භාවිතා කරනු ලබන්නේ වර්තමාන බද්ධසීමා සම්බන්ධයෙන් තිබෙන සඞ්කාදෝෂ නිසා ය. එබැවින් උපසම්පදා ආදි ගරු විනයකර්ම සඳහා භාවිතා කරන උදකුක්ඛේපසීමා තුළ කිසිදු සැකයක් ඇති නො වන ලෙස පිරිසිදු සීමා-උපචාර සහිත ව ම අට්ටාලය ඉදි කර ගැනීමටත් පටු නදියක විනයකර්ම සිදු කරන විට නීත්‍යානුකූල ව ඉවුරු ශෝධනාදි (එනම්, නදිය තුළ තිබෙන ඉවුරට සම්බන්ධ ගස්වැල් ආදිය ඉවත් කිරීම් ආදි) කටයුතු සිදු කර ගැනීමටත් විනයධරයන්ගේ විශේෂ සැලකිල්ල යොමු විය යුතු ය.

# 8-2. පාලම් දැමීමෙහි දී සැලකිලිමත් විය යුතු කරුණු

උදකුක්ඛේපසීමාව තුළ ඉදි කෙරෙන අට්ටාලය වෙත පහසුවෙන් ගමන් කරනු පිණිස ඇතැම් අවස්ථාවල තාවකාලික පාලම් ද ඇතැම් විට ස්ථිර පාලම් ද ඉදි කරනු දක්නට ලැබේ. අට්ඨකථාවන්හි සඳහන් පෞරාණික විනය පටිපාටිය නො දන්නාකමින් හෝ එය නො සලකා හෝ ඉදි කෙරෙන එබඳු ඇතැම් පාලම් නිසා උදකුක්ඛේපසීමාව මෙන් ම සීමා-උපචාරය ද සඞ්කර වීමෙන් එම උදකුක්ඛේපසීමාවෙහි සිදු කෙරෙන විනයකර්ම අඩාළ වේ. එවිට සිදු වන්නේ කුමක් ද? සඞ්කර වූ උදකුක්ඛේපසීමාවන්හි සිදු කරන උපසම්පදා විනයකර්ම අඩාළ වීමෙන් නියම උපසම්පදාව නැති (උපසම්පදාව තිබෙන බවට ප්‍රතිඥා කරන, එහෙත් අනුපසම්පන්න) භික්ෂුප්‍රතිරූපක පිරිසක් බිහි වීම ය. එය බුදුසසුනට ඉතාමත් අන්තරායකර වූ ශාසනික උපසම්පදාව නැති වී යාමට හේතු වන කරුණකි. මෙබඳු දෝෂ ඇති වීමට පසුබිම් වන බැවින් උදකුක්ඛේපසීමාව තුළ ඉදි කෙරෙන අට්ටාලය වෙත යාමට පාලම් ඉදි කිරීමෙන් වැළකී සිටීම ඉතාමත් සුදුසු ය.




$A_1B_1$ දුර = $A_2B_2$ දුර = උදකුක්ඛේපසීමාව

$B_1C_1$ දුර = $B_2C_2$ දුර = සීමා-උපචාරය

ඉහත රූපසටහනෙහි නදියෙන් බැහැර ඉවුරට සෘජු ව සම්බන්ධ ව තිබෙන පාලම සීමා-උපචාරය ද අජ්ඣොත්‍ථරණය කරමින් (යට කරමින්) උදකුක්ඛෙපසීමාවට ප්‍රවිෂ්ට වී ඇත. ඒ අනුව පාලම දැමීම නිසා උදකුක්ඛෙපසීමාව සඞ්කර වී ඇත. ප්‍රධාන අට්ටාලය සහ පාලම වෙන් වන ලෙස කුඩා කපොල්ලක් තබා ඇතත් නදියෙන් බැහැර ඉවුරට සම්බන්ධ පාලම සීමා-උපචාරය හා උදකුක්ඛෙපසීමාව අජ්ඣොත්‍ථරණය කරමින් උදකුක්ඛෙපසීමාව තුළට ප්‍රවිෂ්ට වී ඇති නිසා උදකුක්ඛෙපසීමාවේ සඞ්කරය වළකාලීමට එම කුඩා කපොල්ල ප්‍රමාණවත් නො වේ. උදකුක්ඛෙපසීමා විනිශ්චය තත් වූ පරිදි නො දත් ඇතැම් භික්‍ෂූන් විසින් බද්ධසීමා හා උදකුක්ඛෙපසීමා වෙනස නො දැන කරුණු අවුල් කර ගැනීමෙනි, මෙබඳු සඞ්කරදොෂ හට ගැනෙනුයේ. බද්ධසීමා සඳහා සතරඟුලක සීමාන්තරිකය ද ප්‍රමාණවත් බව අට්ඨකථාවන්හි සඳහන් වේ. එම නය සලකා ගෙන, උදකුක්ඛෙපසීමා-විනිශ්චය නො දත් ඇතැම් භික්‍ෂූන් විසින් පාලමත් අට්ටාලයත් වෙන් කිරීම සඳහා ඒ දෙක අතර කුඩා කපොල්ලක් තැබීම ප්‍රමාණවත් ය'යි සලකනු ලැබේ. එහෙත් බද්ධසීමා-උපචාරය මෙන් නොව, උදකුක්ඛෙපසීමාව තරම් වූ ම (ඊට අඩු නො වන) දුරක් උදකුක්ඛෙපසීමා-උපචාරය සඳහා තැබිය යුතු බව සමන්තපාසාදිකාවෙහි සහ මාතිකට්ඨකථාවෙහි මෙන් ම විමතිවිනෝදනී, විනයාලඞ්කාර-ටීකාවල ද සඳහන් වේ. ඒ නිසා නදියෙන් බැහැර ඉවුරට සම්බන්ධ පාලමත් උදකුක්ඛෙපසීමාව තුළ ඉදි කෙරෙන අට්ටාලයත් වෙන් වනු පිණිස කුඩා කපොල්ලක් තැබීමෙන් උදකුක්ඛෙපසීමා පාරිශුද්ධිය නො රැකේ.

පුරාණ කාලයෙහි පටන් වර්තමානය තෙක් ම විවිධ අවස්ථාවල කරුණු නිසි ලෙස නො සලකා උදකුක්ඛෙපසීමා, උපචාර සඞ්කර වන ලෙස යෙදූ පාලම් හේතුවෙන් උපසම්පදා ආදි ගරු විනයකර්ම අඩාළ වූ ආකාරය පිළිබඳ වත් පසු ව විනයධරයන් විසින් එම අඩාළ විනයකර්මයන්ට පිළියම් කළ ආකාරය පිළිබඳ වත් ශාසන-ඉතිහාසයෙන් දත හැකි ය. ඒ පිළිබඳ උදාහරණ කිහිපයක් මෙසේ ය.

(i). රා:වː 1844 (බු:වː 2388) දී පමණ බලපිටියේ මාදු ගඟෙහි උදකුක්ඛෙපසීමාව තුළ ඉදි කළ අට්ටාලය වෙත පහසුවෙන් ගමන් කිරීම සඳහා ඉදි කරනු ලැබූ පාලම හේතුවෙන් හටගත් සීමා-සඞ්කරදොෂ නිසා වර්ෂ දහයක් ම එහි සිදු කළ ගරු උපසම්පදා විනයකර්ම අඩාළ වූ අතර එම දොෂය පෙන්වා දෙනු ලැබුවේ අමරපුර ශ්‍රී සද්ධම්මවංස මහානිකායේ මහානායක විනයධර අතිපූජනීය ලඞ්කාගොඩ ධීරානන්ද ස්වාමීන් වහන්සේ විසිනි. අඩාළ වූ උපසම්පදා විනයකර්ම සඳහා වෙනත් උදකුක්ඛෙපසීමාවක දී පුනශික්‍ෂාව ලබාදීම හෙවත් දළ්හීකර්මෝපසම්පදාකර්ම සිදු කරන ලදී.

- සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ - පොල්වත්තේ බුද්ධදත්ත මහානාහිමි -

(i). රා:වː 1844 (බු:වː 2388) දී පමණ බලපිටියේ මාදු ගඟෙහි උදකුක්ඛෙපසීමාව තුළ ඉදි කළ අට්ටාලය වෙත පහසුවෙන් ගමන් කිරීම සඳහා ඉදි කරනු ලැබූ පාලම හේතුවෙන් හටගත් සීමා-සඞ්කරදොෂ නිසා වර්ෂ දහයක් ම එහි සිදු කළ ගරු උපසම්පදා විනයකර්ම අඩාළ වූ අතර එම දොෂය පෙන්වා දෙනු ලැබුවේ අමරපුර ශ්‍රී සද්ධම්මවංස මහානිකායේ මහානායක විනයධර අතිපූජනීය ලඞ්කාගොඩ ධීරානන්ද ස්වාමීන් වහන්සේ විසිනි. අඩාළ වූ උපසම්පදා විනයකර්ම සඳහා වෙනත් උදකුක්ඛෙපසීමාවක දී පුනශික්‍ෂාව ලබාදීම හෙවත් දළ්හීකර්මෝපසම්පදාකර්ම සිදු කරන ලදී.

- සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ - පොල්වත්තේ බුද්ධදත්ත මහානාහිමි -


(iii). රා:වː 2000-2005 කාලය තුළ ශ්‍රී ලඞ්කා රාමඤ්ඤ මහානිකායානුබද්ධ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ගරු උපසම්පදා විනයකර්ම සිදු කෙරෙන අම්බලන්ගොඩ මාදම්පා නදියේ උදකුක්ඛෙපසීමාව තුළ ඉදි කළ අට්ටාලය වෙත යාමට යොදා තිබූ පාලම හේතුවෙන් එම වර්ෂවල උපසම්පදා විනයකර්ම අඩාළ වූ බැවින් රා:වː 2006 දී එම උපසම්පදා විනයකර්ම නැවත සිදු කරන ලදී.

මෙලෙස පාලම් දැමීම හේතුවෙන් උදකුක්ඛෙපසීමා සහ උපචාර සඞ්කර වීමෙන් උපසම්පදා ආදි ගරු විනයකර්ම අඩාළ වූ අවස්ථා මෙන් ම එහි වරද දුටු විනයධරයන් වහන්සේලා විසින් එම විනයකර්ම නැවත සිදු කිරීමෙන් පිළියම් කළ අවස්ථා ද ශාසන ඉතිහාසයෙන් දත හැකි ය. (එසේ ම පිළියම් නො කළ අවස්ථා ද බොහෝ බව කනගාටුවෙන් නමුත් ප්‍රකාශ කළ යුතු ව තිබේ.)

එනිසා උදකුක්ඛෙපසීමාවේ අට්ටාලය වෙත යාම සඳහා පාලම් යෙදීම ඉතා ම අන්තරායකර බැවින් පාලම් නො යොදා යාත්‍රාවක් භාවිතා කිරීම වඩාත් ආරක්‍ෂාකාරී පිළිවෙත බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.


# 8-3. විනයානුකූල ව පාලමක් යෙදිය නො හැකි ද ?

උදකුක්ඛේපසීමාව තුළ ඉදි කෙරෙන අට්ටාලය වෙත යාමට විනයානුකූල ව පාලමක් යෙදිය හැකි පිළිවෙළක් ද අට්ඨකථාවෙහි සඳහන් වේ. පාලමෙහි කණු හා මුළු පාලම බැහැර ඉවුරට සම්බන්ධයක් නැති ව නදිය තුළ ම පිහිටා තිබේ නම් එබඳු පාලමක් යෙදීමෙන් සීමා සඞ්කරයක් සිදු නො වේ.




$A_1B_1$ දුර = $A_2B_2$ දුර = උදකුක්ඛේපසීමාව $B_1C_1$ දුර = $B_2C_2$ දුර = සීමා-උපචාරය

පාලම බැහැර ඉවුරට සම්බන්ධයක් නැති ව අට්ටාලයට සම්බන්ධ ව තිබුනත් එයින් සීමා සඞ්කර වීමක් සිදු නො වේ. පාලම උදකුක්ඛේපසීමාව තුළට හා උපචාරය තුළට ප්‍රවිෂ්ට ව තිබුණත් ගොඩබිමට සම්බන්ධයක් නැති ව මුළු පාලම ම නදියෙහි පිහිටා ඇති බැවින් සීමාවෙහි සඞ්කර වීමක් නැත. එහෙත් මෙහි ලා අන්තරායක් ද තිබේ. එනම්, මකුළුහුයකින් හෝ පාලම බැහැර ඉවුරට සම්බන්ධ වුවහොත් එයින් සීමා එකිනෙක සඞ්කර වීම සිදු වේ.




$A_1B_1$ දුර = $A_2B_2$ දුර = උදකුක්ඛේපසීමාව $B_1C_1$ දුර = $B_2C_2$ දුර = සීමා-උපචාරය

මෙහි පාලම අට්ටාලයට සම්බන්ධ වීමෙන් සඞ්කරදෝෂයක් නැතත් පාලමේ සිට බැහැර ඉවුරට සම්බන්ධ වී තිබෙන මකුළුහුය නිසා සීමාව සඞ්කර වී ඇත. එබැවින් මෙම උදකුක්ඛේපසීමාව තුළ සිදු කෙරෙන විනයකර්ම කෝප්‍ය වීමට එයින් කරුණු යෙදේ.

උදකුක්ඛේපසීමාව හෝ සීමා-උපචාරය හෝ ග්‍රාමසීමාව සමඟින් සඞ්කර වූ පමණින් ම විනයකර්ම කෝප්‍ය නො වේ. උදකුක්ඛේපසීමාව හෝ සීමා-උපචාරය හෝ සමඟින් සම්බන්ධ වී තිබෙන ග්‍රාමසීමාවෙහි හෝ විහාරසීමාවෙහි හෝ සමානසංවාසක ඡන්දාරහ (විනයකර්මය සඳහා ඡන්දය ගත යුතු) උපසම්පන්න භික්ෂූහු සිටිත් නම්, ඔවුන්ගේ ඡන්දය ලබා ගෙන නැති නම්, එබඳු අවස්ථාවක ග්‍රාමසීමාව හා උදකුක්ඛේපසීමාව/උපචාරය සඞ්කර වීම නිසා එම උදකුක්ඛේපසීමාවෙහි සිදු කරන විනයකර්ම කෝප්‍ය වේ. එම ග්‍රාමසීමාවල/විහාරසීමාවල ඡන්දාරහ භික්ෂූන් නැති නම්, එබඳු අවස්ථාවක උදකුක්ඛේපසීමාව සඞ්කර ව තිබුණ ද එයින් විනයකර්ම කෝප්‍ය වීමක් සිදු නො වේ. එහෙත් බොහෝ අවස්ථාවල උදකුක්ඛේපසීමාවක විනයකර්ම සිදු කෙරෙන අවස්ථාවල නදීතීරයෙහි හෝ ග්‍රාමසීමාව තුළ තවත් සමානසංවාසක උපසම්පදා භික්ෂූන් සිටිනු දක්නට ලැබේ. එබඳු අවස්ථාවල ග්‍රාමසීමාව සමඟින් උදකුක්ඛේපසීමාව හෝ සීමා-උපචාරය හෝ සඞ්කර වූයේ නම්, එම උදකුක්ඛේපසීමාවෙහි සිදු කෙරෙන විනයකර්ම අඩාළ වෙයි. විශේෂයෙන් උපසම්පදා ආදි ගරු විනයකර්ම සම්බන්ධයෙන් සඞ්කාදෝෂ ඇති වීම දුර තබා ම වැළැක්වීම විනයධරයන්ගේ පිළිවෙත යි. ඒ නිසා සඞ්කාදෝෂ ඇති වීමට හේතු වන්නා වූ පාලම් ආදිය උදකුක්ඛේපසීමාවට හෝ සීමා-උපචාරයට සම්බන්ධ නො කර සැකයක් ඇති නො වන ලෙස ම විනයකර්ම සිදු කිරීමට විනයධරයෝ උත්සුක විය යුත්තාහ.

## 9. උදකුක්ඛේපසීමා-උපචාරය පිළිබඳ ව ටීකාවන්හි දැක්වෙන කරුණු

මාතිකට්ඨකථාවෙහි සඳහන් වන පරිදි උදකුක්ඛේපසීමාවක විනයකර්ම සිදු කරන විට සීමා-උපචාරය පිරිසිදු විය යුතු ආකාරය පිළිබඳ ව හා සඟපිරිස් දෙකක් ආසන්නයෙහි විනයකර්ම සිදු කරන විට උපචාරය තැබිය යුතු ආකාරය පිළිබඳ ව විමතිවිනෝදනී සහ විනයාලඞ්කාර-ටීකාවන්හි පැහැදිලි ව සඳහන් ව ඇත. මෙහි ලා මතභේදයට තුඩු දී ඇති මාතිකට්ඨකථා පාඨය හා ඒ පිළිබඳ ව විග්‍රහ කරන විමතිවිනෝදනී සහ විනයාලඞ්කාර-ටීකා විවරණ එකිනෙක සංසන්දනය කරමින් කරුණු විමසා බැලිය යුතු ය. මතභේදයට හේතු වී ඇති මාතිකට්ඨකථා පාඨය නම්,

"සචෙ පන ද්වෙ සඞ්ඝා විසුං විසුං උපොසථාදිකම්මං කරොන්ති, ද්වින්නං උදකුක්ඛෙපානං අන්තරෙ අඤ්ඤො ඒකො උදකුක්ඛෙපො උපචාරත්ථාය ඨපෙතබ්බො අයං හි සත්තබ්භන්තරසීමා ච උදකුක්ඛෙපසීමා ච භික්ඛූනං ඨිතොකාසතො පට්ඨාය ලබ්භති පරිච්ඡෙදබ්භන්තරෙ හත්ථපාසං විජහිත්වා ඨිතොපි පරිච්ඡෙදතො බහි අඤ්ඤං තත්තකංයෙව පරිච්ඡෙදං අනතික්කමිත්වා ඨිතොපි කම්මං කොපෙති, ඉදං සබ්බඅට්ඨකථාසු සන්නිට්ඨානං"

- මාතිකට්ඨකථා (හේ.මු) -

"ඉදින් (එක ම නදියෙහි) සඟපිරිස් දෙකක් වෙන් වෙන් ව උපෝසථාදි විනයකර්ම කරත් නම්, එම උදකුක්ඛේපසීමා දෙක අතරෙහි තවත් සම්පූර්ණ උදකුක්ඛේපයක් සීමා-උපචාරය වශයෙන් තැබිය යුතු ය. සත්තබ්භන්තරසීමාව හා උදකුක්ඛේපසීමාව ලැබෙන්නේ විනයකර්ම සිදු කිරීම සඳහා අත්පස නො හැර රැස් ව සිටින භික්ෂූන්ගේ කෙළවර සිට ය. සීමා-පරිච්ඡේදය තුළ අත්පසින් බැහැර ව සිටින භික්ෂුව ද සීමා-පරිච්ඡේදයෙන් බැහැර තවත් එබඳු ම පරිච්ඡේදයක් නො ඉක්මවා සිටින භික්ෂුව ද විනයකර්මය කෝප්‍ය කරයි. මෙය සියලු විනය-අට්ඨකථාවන්හි සඳහන් වන විනිශ්චය යි."

මාතිකට්ඨකථාවෙහි සඳහන් මෙම ඡේදයෙහි උදකුක්ඛේපසීමාවක උපචාරය තැබිය යුතු පිළිවෙළ පිළිබඳ ව සඳහන් වන්නේ "පරිච්ඡේදබ්භන්තරේ හත්ථපාසං විජහිත්වා ඨිතෝ'පි පරිච්ඡේදතෝ බහි අඤ්ඤං තත්තකංයේව පරිච්ඡේදං අනතික්කමිත්වා ඨිතෝපි කම්මං කෝපේති" යන වාක්‍යයෙහි ය. ඒ අනුව උදකුක්ඛේපසීමාව තුළ අත්පසින් බැහැර ව සිටින භික්ෂුව විනයකර්මය කෝප්‍ය කරන්නා සේ ම තවත් එබඳු ම පරිච්ඡේදයක් නො ඉක්මවා සිටින භික්ෂුව ද විනයකර්මය කෝප්‍ය කරන බව එක ම වැකියක සඳහන් ව තිබේ. මෙහි ලා "සීමා-පරිච්ඡේදයෙන් බැහැර තවත් එබඳු ම පරිච්ඡේදයක් නො ඉක්මවා" යනුවෙන් ප්‍රකාශිත වන්නේ උදකුක්ඛේපසීමාවේ උපචාරය පිළිබඳ ව යි. උදකුක්ඛේපසීමාව පිළිබඳ වූ මෙම උපචාරය සැලකිය යුත්තේ එක ම නදියක සඟපිරිස් දෙකක් ඔවුනොවුන්ට ආසන්නයෙහි විනයකර්ම කරන විට බවත්, ආසන්නයෙහි වෙනත් සඟපිරිසක් නැති කල මෙම උපචාරය සැලකීම අනවශ්‍ය බවත් ඇතැමෙක් මේ පිළිබඳ ව දරණ දුර්මතයකි. "පරිච්ඡේදබ්භන්තරේ හත්ථපාසං විජහිත්වා ඨිතෝපි පරිච්ඡේදතෝ බහි අඤ්ඤං තත්තකංයේව පරිච්ඡේදං අනතික්කමිත්වා ඨිතෝපි කම්මං කෝපේති" (සීමා-පරිච්ඡේදය තුළ අත්පසින් බැහැර ව සිටින භික්ෂුව ද සීමා-පරිච්ඡේදයෙන් බැහැර තවත් එබඳු ම පරිච්ඡේදයක් නො ඉක්මවා සිටින භික්ෂුව ද විනයකර්මය කෝප්‍ය කරයි) යනුවෙන් මෙම වැකියෙහි සඳහන් වන ප්‍රකාශය අදාළ වන්නේත් ඇතැමුන් පවසන ලෙස සඟපිරිස් දෙකක් ආසන්නයෙහි විනයකර්ම සිදුකරන විට පමණක් නම්, එම  වැකියෙහි ම සඳහන් වන පරිදි උදකුක්ඛේපසීමාව තුළ අත්පසින් බැහැර ව සිටින භික්ෂුව විනයකර්මය කෝප්‍ය කරන්නේත් සඟපිරිස් දෙකක් ආසන්නයෙහි විනයකර්ම සිදු කරන විට පමණක් ම විය  යුතු ය. එහෙත් එය එසේ නො වන බව විනයධරයෝ දනිති. එනිසා 'උදකුක්ඛේපසීමාවෙහි උපචාරය සැලකිය යුත්තේ ආසන්නයෙහි සඟපිරිස් දෙකක් විනයකර්ම සිදු කරන විට පමණක් ය' යනුවෙන් ඇතැමුන් දරණ මතය දුර්මතයක් බව විනයාලඞ්කාර හා විමතිවිනෝදනී-ටීකාවන්ගෙන් ද සාධනය වේ. ඒ බව  විනයාලඞ්කාර- ටීකාවෙහි දැක්වෙන්නේ මෙසේ ය.

"තස්ස අන්තෝති, තස්ස උදකුක්ඛේපපරිච්ඡින්නස්ස ඨානස්ස අන්තො. න කේවලඤ්ච තස්සේව අන්තෝ තතෝ බහිපි, 'ඒකස්ස උදකුක්ඛේපස්ස අන්තෝ ඨාතුං න වට්ටතී'ති වචනං උදකුක්ඛේපපරිච්ඡේදස්ස දුබ්බිජානතෝ කම්මකෝපසඞ්කා හෝතීති, තේනේව මාතිකාට්ඨකථායං 'පරිච්ඡේදබ්භන්තරේ හත්ථපාසං විජහිත්වා ඨිතෝපි පරිච්ඡේදතෝ බහි අඤ්ඤං තත්තකංයේව පරිච්ඡේදං අනතික්කමිත්වා ඨිතෝපි කම්මං කෝපේති, ඉදං සබ්බඅට්ඨකථාසු සන්නිට්ඨාන'න්ති වුත්තං"

- විනයාලඞ්කාර-ටීකා -

"තස්ස අන්තෝ" යනු එම උදකුක්ඛේපසීමාව පිරිසිඳෙන තැනින් ඇතුළත යනු යි. හුදෙක් ඒ පිරිසිඳෙන සීමාවෙන් ඇතුළත පමණක් නොව ඉන් බැහැර (එනම්, සීමා-උපචාරය තුළ) සිටින  භික්ෂුව ද විනයකර්මය කෝප්‍ය කරයි. එයට හේතුව නම්, එක් උදකුක්ඛේප පරිච්ඡේදයක භාග්‍යවතුන් වහන්සේ අදහස් කළ පරිදි නියම ප්‍රමාණය (එනම්, බලමැදුම්-පුරුෂයා මුළු වැර යොදා දිය විසි කරන විට වැටෙන නියම දුර) නිශ්චිත ව දත නො හැකි බැවින් විනයකර්මය කෝප්‍ය වීමේ සඞ්කාදෝෂ ඇති වේ. 'සීමා-පරිච්ඡේදය තුළ අත්පසින් බැහැර ව සිටින භික්ෂුව ද සීමා-පරිච්ඡේදයෙන් බැහැර තවත් එබඳු ම පරිච්ඡේදයක් නො ඉක්මවා සිටින භික්ෂුව ද විනයකර්මය කෝප්‍ය කරයි. මෙය සියලු විනය-අට්ඨකථාවන්හි සඳහන් වන විනිශ්චය යි' යනුවෙන් මාතිකට්ඨකථාවෙහි සඳහන් කරන ලද්දේ මෙම හේතුවෙනි.

- විනයාලඞ්කාර-ටීකා -

විනයාලඞ්කාර-ටීකාචාර්යයන් වහන්සේගේ මෙම ප්‍රකාශයෙන් ඉතා පැහැදිලි ව දැක්වෙන පරිදි උදකුක්ඛේපසීමාවක  උපචාරය තබනු ලබන්නේ සඟපිරිස් දෙකක් ආසන්නයෙහි විනයකර්ම සිදු කරන විට ඔවුනොවුන්ගේ උදකුක්ඛේපසීමා වෙන් කිරීම සඳහා ම නො වේ. භාග්‍යවතුන් වහන්සේ අදහස් කළ බලමැදුම්-පුරුෂයා  නිශ්චිත ව ම අසවලා ය යි විනිශ්චය කළ නො හැකි ය.  එක් එක් පුද්ගලයෙකු මුළු වැර යොදා දිය හෝ වැලි හෝ විසි කරන විට ඒ ඒ පුද්ගලයාගේ ශක්තිය වෙනස් වන බැවින් විවිධ දුර  ප්‍රමාණවලට  දිය හෝ වැලි හෝ  වැටීමෙන්  උදකුක්ඛේපසීමාව

පිළිබඳ ව සඞ්කාදෝෂ ඇති විය හැකි ය. එබැවින් එම සඞ්කාදෝෂ මඟහැරීමට ය, සීමා-උපචාරය වශයෙන් තවත්උදකුක්ඛෙපයක් තැබිය යුත්තේ. තවද මෙය පෞරාණික සියලු විනය-අට්ඨකථාවල සඳහන් වන විනිශ්චය ය'යි මාතිකට්ඨකථාවෙහි සඳහන් පාඨය ටීකාචාර්යයන් වහන්සේ විසින් ද අවධාරණයෙන් සඳහන් කිරීමෙන් මෙම කරුණ වැඩි දුරටත් සනාථ වේ.

මාතිකට්ඨකථාවෙහි සඳහන් වන "පරිච්ඡේදබ්භන්තරේ හත්ථපාසං විජහිත්වා ඨිතෝපි" යන පාඨය පිළිබඳ ව මෙකල ඇතැම් ඇදුරන් තුළ දුර්මත පවතින්නා සේ ඇතැම් පුරාණ ඇදුරන් තුළ ද මේ පිළිබඳ ව දුර්මත පැවති බව විනයාලඞ්කාර-ටීකාවෙහි අනතුරු ව සඳහන් වන විවරණයෙන් පෙනේ.

යං පනෙත්ථ සාරත්ථදීපනියං "තස්ස අන්තෝහත්ථපාසං විජහිත්වා ඨිතෝ කම්මං කෝපේතී'ති ඉමිනා පරිච්ඡේදතෝ බහි යත්ථ කත්ථචි ඨිතෝ කම්මං න කෝපේතී"ති වත්වා මාතිකාට්ඨකථාවචනම්පි පටික්ඛිපිත්වා "නේව පාළියං න අට්ඨකථායං උපලබ්භතී"ති ආදි බහු පපඤ්චිතං, තං න සුන්දරං. ඉධ අට්ඨකථාවචනේන මාතිකාට්ඨකථාවචනස්ස නයතෝ සංසන්දනතෝ සඞ්ඝටනතෝ තථා හි ද්වින්නං උදකුක්ඛෙපපරිච්ඡේදානමන්තරා විදත්ථිචතුරඞ්ගුලමත්තම්පි සීමන්තරිකං අඨපෙත්වා "අඤ්ඤෝ උදකුක්ඛෙපෝ සීමන්තරිකාය ඨපේතබ්බෝ, තතෝ අධිකං වට්ටති ඒව, ඌනකං පන න වට්ටතී"ති ඒවං ඉධේව වුත්තේන ඉමිනා අට්ඨකථාවචනේන සීමන්තරිකෝපචාරේ උදකුක්ඛෙපතෝ ඌනකේ ඨපිතේ සීමාය සීමාසම්භේදතෝ කම්මකෝපෝපි වුත්තෝ ඒව. යදග්ගේන ච ඒවං වුත්තෝ, තදග්ගේන ච තත්ථ ඒකභික්ඛුනෝ පවේසේපි සති තස්ස සීමට්ඨභාවතෝ කම්මකෝපෝ වුත්තෝ ඒව හෝති. අට්ඨකථායං "ඌනකං පන න වට්ටතී"ති, කථනඤ්චේතං උදකුක්ඛෙපපරිච්ඡේදස්ස දුබ්බිජානනත්තේනපි සීමාසම්භේදසඞ්කාපරිහාරත්ථං වුත්තං. . . . . . . . .
. . . . . . . . . . . . . . කම්මකෝපසඞ්කට්ඨානම්පි ආචරියා දූරතෝ පරිහාරත්ථං 'කම්මකෝපට්ඨාන'න්ති වත්වා ඨපේසුන්ති ගහේතබ්බං.

- විනයාලඞ්කාර-ටීකා -

මෙහි මෙම කරුණෙහි ලා සාරත්ථදීපනී-ටීකාවෙහි "තස්ස අන්තෝහත්ථපාසං විජහිත්වා ඨිතෝ කම්මං කෝපේතී"ති (උදකුක්ඛෙපසීමාව තුළ අත්පසින් බැහැර ව සිටි භික්ෂුව විනයකර්මය කෝප්‍ය කරයි) යනුවෙන් මාතිකට්ඨකථාවෙහි සඳහන් පාඨය දක්වා අනතුරු ව මාතිකට්ඨකථාවෙහි එන මෙම ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමින් "නේව පාළියං න අට්ඨකථායං උපලබ්භති" (මෙම ප්‍රකාශය විනය පාළියෙහි හෝ අට්ඨකථාවෙහි හෝ සඳහන් නො වෙයි) යනුවෙන් ඒ පිළිබඳ ව අදාළ නො වන අනවශ්‍ය කරුණු රැසක් සඳහන් කර ඇත. එය සුදුසු නො වේ. මෙහි ලා විනය (මහා) අට්ඨකථාවෙහි ප්‍රකාශයක් සමඟින් මාතිකට්ඨකථාවේ ප්‍රකාශය න්‍යායානුකූල ව මැනවින් සැසඳී, ගැළපී යන බැවින් සාරත්ථදීපනියෙහි සඳහන් වන මෙම කරුණ අදාළ නො වන්නකි. "ආසන්නයෙහි උදකුක්ඛෙපසීමා දෙකක් ඇති විට ඒ අතර සතරඟුලක් හෝ වියතක් හෝ පමණ වන සීමන්තරිකයක් නො තබා සීමන්තරිකය වශයෙන් තවත් උදකුක්ඛෙපයක් ම තැබිය යුතු ය. එයට වඩා වැඩි වූයේ නමුත් අඩු වීම නුසුදුසු ය" යන අට්ඨකථා ප්‍රකාශයෙන් ද උදකුක්ඛෙපසීමාවක උපචාරය වශයෙන් තවත් උදකුක්ඛෙපයක් තැබීමේ අවශ්‍යතාව සනාථ වේ. මෙසේ මෙහි ම (එනම්, මාතිකට්ඨකථාවෙහි) සඳහන් ව තිබෙන මෙම පාඨය අනුව ද පැහැදිලි වන්නේ උදකුක්ඛෙපසීමා පිළිබඳ වූ සීමන්තරික, සීමා-උපචාරයන් උදකුක්ඛෙපයකට වඩා අඩුවෙන් තබා ඇති කල්හි සීමාවෙන් සීමාව සම්බන්ධ වීමේ දෝෂය (එනම්, උදකුක්ඛෙපසීමාව වෙනත් සීමාවක් සමඟ සම්බන්ධ වීමේ දෝෂය) හේතුවෙන් එම සීමාවන්හි සිදු කරන විනයකර්ම කෝප්‍ය වීම දක්වා ඇති බව යි. යම් අයුරකින් මෙසේ කියන ලද ද ඒ අයුරින් ම සලකන කල එකී උපචාරය තුළට එක් භික්ෂුවකගේ හෝ ප්‍රවේශය ඇති කල්හි එම භික්ෂුව සීමස්ථක (උදකුක්ඛෙපසීමාව තුළට පිවිස සිටින) බැවින් විනයකර්ම කෝප්‍ය වන බව ද එයින් ප්‍රකාශිත ය. "ඌනකං පන න වට්ටති" යනුවෙන් උදකුක්ඛෙපසීමාවෙහි උපචාරය තබන කල්හි තවත් උදකුක්ඛෙපයක ප්‍රමාණයට අඩුවෙන් උපචාරය තැබීම නො කළ යුතු බව ප්‍රකාශ කරන ලද්දේ උදකුක්ඛෙපසීමාවේ පරිච්ඡේදය නිශ්චිත ව ම නො දත හැකි බැවින් සීමා එකිනෙක සම්බන්ධ වීමේ සැකය දුර තබා ම මඟහැරීම සඳහා ය. විනයකර්මය කෝප්‍ය විය හැකැ'යි සැක සිතෙන තැන් ද දුර තබා ම මඟ හැරීම සඳහා විනය ඇදුරන් විසින් විනයකර්මය කෝප්‍යය යන තත්ත්වයෙහි ලා ම සලකන ලදැ'යි කියා මෙයින් සලකා ගත යුතු යි.

- විනයාලඞ්කාර-ටීකා -

මේ අනුව පැහැදිලි වන්නේ පොළොන්නරු යුගයේ විසූ සාරත්ථදීපනී-ටීකාචාර්යයන් වහන්සේ වන ටීකාචාර්ය සාරිපුත්ත තෙරුන් වහන්සේ පවා උදකුක්ඛේපසීමා-උපචාරය පිළිබඳ ව මාතිකට්ඨකථාවට පටහැණි වූ දුර්මතයක් සඳහන් කර ඇති බව යි. <u>එම දුර්මතයෙහි දෝෂය ඉන් පසු ව ලියවුණු විනයාලඞ්කාර සහ විමතිවිනෝදනී-ටීකාවන්හි පැහැදිලි ව විවේචනය කර දක්වා ඇත.</u> පොළොන්නරු යුගයෙහි දී ලියවුණු සාරත්ථදීපනී-ටීකාවෙහි සදොස් මතයක් ලියවෙන්නට හේතුව කුමක් ද? මහාමහින්ද මහරහතන් වහන්සේ විසින් පිහිටුවා වදාළ මහාවිහාරීය භික්ෂුපරපුර ධර්ම-විනය සම්බන්ධයෙන් ඇතිවුණු මතභේද මුල් කර ගෙන පසු කාලීන ව මහාවිහාර - අභයගිරි - ජේතවන වශයෙන් නිකායත්‍රයකට බෙදී ගිය අයුරු වංශකථාවන්ගෙන් පැහැදිලි වේ. පොළොන්නරු යුගය දක්වා ම පැවති මෙම භේදය නැති කරන ලද්දේ මහාපරාක්‍රමබාහු රජතුමා විසිනි. ඒ වන විට මහාවිහාරයට සිටි ප්‍රබල ප්‍රතිපාක්ෂිකයා වූ අභයගිරිය තුළින් පැතිරුණු ධර්ම-විනය විරෝධී මතිමතාන්තර රාශියක් රට පුරා ව්‍යාප්ත ව තිබිණි. මහාපරාක්‍රමබාහු රජතුමා බලවත් උත්සාහයක් ගෙන මහාවිහාර-අභයගිරි-ජේතවන නිකායයන් අත්සිටුවා එක ම මහාවිහාරයක් ඇති කළ ද ඒ වන විට මුල් බැසගෙන තිබුණු ධර්ම-විනය විරෝධී මතිමතාන්තර සෑම එකක් ම බැහැර කළ හැකි වූයේ නැත. රාජාඥාවෙන් අත්සිටුවනු ලැබූ අභයගිරි, ජේතවන (සාගලික) නිකායවලට අයත් ව සිටි ඇතැම් භික්ෂූහු රාජාඥාව නිසා යළි මහාවිහාරය සමඟින් එකතු වූහ. එම එක්වීම නිසා ඔවුන් වහන්සේලා දැරූ ඇතැම් අභයගිරික මත නොහොත් මහාවිහාර සම්ප්‍රදායට පටහැණි මතවාද ද එකල ලියවුණු ඇතැම් ධර්ම-විනය ග්‍රන්ථවලට ඇතුළු වී ඇත. ඒ සඳහා තිබෙන හොඳ ම නිදසුනක් නම් ටීකාචාර්ය සාරිපුත්ත මාහිමියන් (පොළොන්නරු යුගය) විසින් ලියන ලද මෙම සාරත්ථදීපනී-ටීකාව යි. ථේරවාද මහාවිහාරීය විනය පිටකයට හා තදනුගත අට්ඨකථාවන්ට පටහැණි වූ විනය-විරෝධී ප්‍රකාශන ගණනාවක් සාරත්ථදීපනියෙහි සඳහන් වේ. ඊට පසු කාලයක දී ලියවුණු විමතිවිනෝදනී සහ විනයාලඞ්කාර යන ටීකාවන්හි "මාතිකාට්ඨකථාවචනම්පි පටික්ඛිපිත්වා 'නේව පාළියං න අට්ඨකථායං උපලබ්භතී'ති ආදි බහු පපඤ්චිතං, තං න සුන්දරං" යනුවෙන් සාරත්ථදීපනී-ටීකාවෙහි සඳහන් සදොස් විවරණ විවේචනය කර තිබෙන්නේ සාරත්ථදීපනියෙහි සඳහන් වන එම කරුණු විනය-විරෝධී බැවිනි. එනිසා උදකුක්ඛේපසීමා-උපචාරය අනවශ්‍ය බව දක්වමින් සාරත්ථදීපනියෙහි සඳහන් වන සදොස් කරුණු විනයධරයන් විසින් සැලකිල්ලට ගනු නො ලැබේ. ඒ බව විමතිවිනෝදනී-ටීකාචාර්ය චෝළිය කස්සප තෙරුන් වහන්සේගේ හා විනයාලඞ්කාර-ටීකාචාර්ය තිපේටකාලඞ්කාර මුනින්දඝෝස රාජගුරු මහතෙරුන් වහන්සේගේ (බු.ව. 2101) ටීකා ප්‍රකාශවලින් තහවුරු වේ. ශ්‍රී ලඞ්කාද්වීපවාසි ටීකාචාර්ය සාරිපුත්ත තෙරුන් වහන්සේගේ ටීකා ප්‍රකාශයට වඩා විදේශික භික්ෂූන්ගේ අර්ථ විවරණ නිවැරදි වන්නේ කෙසේ ද? යන ගැටලුව ඇතැම් කෙනෙකු තුළ ඇති වීමට ඉඩ තිබේ. ඒ සඳහා සාරත්ථදීපනී-ටීකාචාර්ය සාරිපුත්ත තෙරුන් වහන්සේ වැඩවාසය කළ පොළොන්නරු යුගයේ පැවති සංකීර්ණ ශාසනික තත්ත්වය පිළිබඳ ව කරුණු විමසා බැලිය යුතු ය.

ක්‍රි:පූ: පළමුවන සියවසෙහි දී වළගම්බා රජු විසින් අභයගිරි විහාරය පිහිටුවීමෙන් පසු මහාවිහාරයෙන් වෙන් වී අභයගිරියෙහි වාසයට ගිය භික්ෂු පිරිස මහාවිහාරයෙන් අන්‍ය වූ නිකායක් වශයෙන් එනම්, අභයගිරිකයන් ලෙස ප්‍රකට වූහ. අභයගිරි නිකායිකයෝ පැහැදිලි ලෙස ම ථේරවාද මහාවිහාරීය ධර්ම-විනයට පටහැණි වූ මහායාන අධර්මවාදී මතවාද දැරූහ. වර්ෂ දහසකටත් අධික කාලයක් ලක්දිව මුල් බැසගෙන පැවති මෙම මහායාන නැඹුරුව ඇති අභයගිරි නිකාය අත්සිටුවනු ලැබුයේ පොළොන්නරු යුගයෙහි විසූ මහාපරාක්‍රමබාහු නරේන්ද්‍රයා විසිනි. අභයගිරි-සාගලික නිකාය දෙක අත්සිටුවා එකම ථේරවාද මහාවිහාරය පමණක් ඉතිරි කිරීමට මහාපරාක්‍රමබාහු රජතුමා ගත් බලවත් ප්‍රයත්නය ගැන සඳහන්

වන්නේ රුහුණු, පිහිටි, මායා යන ත්‍රිසිංහලය එක්සත් කිරීමට හා විදේශ රටවල් සමඟින් යුද්ධ කොට ජය ගැනීම රජතුමාට එතරම් දුෂ්කර නො වූ බවත් අභයගිරි-සාගලික නිකායයන් අත්සිටුවා ථේරවාද මහාවිහාරය පමණක් ඉතිරි කොට ශාසන චිරස්ථිතිය ඇති කිරීමට ඊට වඩා බලවත් සඞ්ග්‍රාමයක් කිරීමට සිදු වූ බවත් ප්‍රකාශ කරමිනි. මෙබඳු පසුබිමක් යටතේ අභයගිරි නිකාය සතු විහාර-ආරාම සියල්ල මහාවිහාරයට පවරා දෙනු ලැබූ අතර පැවිද්දෙහි රැඳී සිටීමට කැමති වූ අභයගිරික භික්ෂූන්ට මහාපරාක්‍රමබාහු රජතුමාගේ නියමය පරිදි අභයගිරි නිකාය අත්හැර මහාවිහාරය සමඟින් එක්වීමට සිදු විය. ඒ අනුව අභයගිරික මත දැරූ භික්ෂුපිරිසක් මහාවිහාරයට එක්වීම මෙම ක්‍රියාදාමය නිසා නිතැතින් ම සිදු විය. එනිසා පොළොන්නරු යුගයෙහි රචිත මෙම සාරත්ථදීපනී-ටීකාවෙහි කර්තෘ ටීකාචාර්ය සාරිපුත්ත තෙරුන්, ගරු කටයුතු මහාවිහාරීය අට්ඨකථාවක් වන මාතිකට්ඨකථාවෙහි සඳහන් උදකුක්ඛේපසීමා-උපචාර විනිශ්චය පිළිබඳ ව "නේව පාළියං න අට්ඨකථායං උපලබ්භති" යනුවෙන් අසත්‍ය විවේචනයක් කර තිබීමෙන් පැහැදිලි වන්නේ සාරත්ථදීපනී-ටීකා මතය සරු වශයෙන් පිළිගත යුත්තක් නොව අභයගිරිකයන්ගේ සාවද්‍ය මතයක් ලෙස සලකා බැහැර කළ යුත්තක් බව ය.

සාරත්‍ථදීපනී-ටීකා මතය තම විමතිවිනෝදනී-ටීකාවෙහි ලා විවේචනය කර දක්වන්නා වූ චෝළිය කස්සප මහතෙරුන් වහන්සේ වනාහි චෝළ (සොළී) දේශයෙහි විසූ නමුත්, මහාවිහාරවංශික භික්‍ෂුවක් බවට සාධක දක්නට තිබේ. චෝළිය කස්සප මහතෙරුන් වහන්සේ චෝළ දේශයෙහි විසූ බැවින් ඇතැමුන් විසින් ඒ මහතෙරුන් වහන්සේ ද්‍රවිඩ භික්‍ෂුවක් ලෙස සලකා විමතිවිනෝදනියෙහි එන විනිශ්චයන් ලඝු කොට සිතන්නට ඉඩ තිබේ. චෝළිය කස්සප මහතෙරුන් වහන්සේ මෙන් පොළොන්නරු යුගයෙහි විසූ තවත් ප්‍රකට වියත් තෙරනමකි, චෝළිය බුද්ධප්‍රිය තෙරණුවෝ. 'රූපසිද්ධි' නම් පාළි ව්‍යාකරණ ග්‍රන්ථයෙහි කතෲ වනාහි චෝළිය බුද්ධප්‍රිය තෙරුන් වහන්සේ ය. චෝළිය බුද්ධප්‍රිය තෙරුන් වහන්සේ ලක්දිව වැඩවිසූ ආනන්ද වනරතන මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යවරයෙකි. දකුණු ඉන්දියාවෙහි (චෝළ දේශයෙහි) පිහිටි විහාර කිහිපයක අධිපති වූ චෝළිය බුද්ධප්‍රිය තෙරුන් වහන්සේ ලක්වැසියෙකු බව පැවසේ. ඇතැම් ලාඞ්කික භික්‍ෂූන් දකුණු ඉන්දියාවේ විහාරයන්හි විසූ බව 'උපාසකජනාලඞ්කාර' ග්‍රන්ථයෙහි ද සඳහන් වන බැවින් චෝළිය බුද්ධප්‍රිය තෙරුන් වහන්සේ මෙන් ම චෝළිය කස්සප මහතෙරුන් වහන්සේ ද චෝළ දේශයෙහි විසූ ලාඞ්කික මහාවිහාරීය භික්‍ෂූන් වීමට ඇති ඉඩ බොහෝ ය. ඒ බව විමතිවිනෝදනී-ටීකාවෙහි සඳහන් ඇතැම් පාඨාන්තරවලින් ද තහවුරු වේ. විමතිවිනෝදනී-ටීකාවෙහි භාරත දේශය ගැන කරුණු දක්වන ඇතැම් තැනක භාරතය හඳුන්වා ඇත්තේ 'පරදේස' (පිටරට) නමිනි. ඒ අනුව ද විමතිවිනෝදනී-ටීකාචාර්ය චෝළිය කස්සප මහතෙරුන් වහන්සේ චෝළ දේශයෙහි විසූ ලාඞ්කික මහාවිහාරීය භික්‍ෂූන් වහන්සේනමක් වශයෙන් ද චෝළ දේශයෙහි විහාරයන්හි අධිපතිත්‍වය දැරූ බැවින් 'චෝළිය' යන්න 'කස්සප' යන නම සමඟින් යෙදී ඇතැ'යි ද සැලකිය හැකි ය.

එලෙසින් ම විනයාලඞ්කාර-ටීකාචාර්ය තිපේටකාලඞ්කාර මුනින්දඝෝස රාජගුරු මහතෙරුන් වහන්සේ ද බුරුම රටෙහි බුදුසසුන බැබළුණු කලෙක පහළ ව සිටි බහුශ්‍රැත විනයධර ලාඞ්කික මහාවිහාරවංශය ගරු කළ යතිවරයෙකි. එනිසා එබඳු පෞරාණික මහාවිහාරවංශික විනයධර උතුමෝ සාරත්‍ථදීපනී-ටීකාවෙහි එන සදොස් විග්‍රහයන් සැලකිල්ලට නො ගෙන නිවැරදි විනයානුකූල මතය ප්‍රකාශ කළහ.

ඈත අතීතයෙහි වැඩවිසූ විනයධර උතුමන් පමණක් නොව මෑත අතීතයෙහි විසූ විනයධර උතුමන් විසින් ද සාරත්‍ථදීපනී-ටීකාව සැලකිල්ලට නො ගෙන බැහැර කළ බවට උදාහරණ දැක්විය හැකි ය. ශ්‍රී ලඞ්කා රාමඤ්ඤ මහානිකාය පිහිටුවාලීමෙහි ලා පුරෝගාමී වූ සම්භාවනීය විනයධර අතිපූජනීය අඹගහවත්තේ ශ්‍රී සරණඞ්කර ඉන්දසභවරඤාණසාමී මහාස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට අයත් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා නම් වූ යෝගාවචර භික්‍ෂුවංශය පිහිටුවා වදාළ අතිපූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවරයෙකු වූ ද තත් සඞ්ඝසභාවෙහි සභාපති ධූරන්ධර, සම්භාවනීය විනයධරයන් වහන්සේනමක් වූ අතිපූජනීය ගැටමාන්නේ විමලවංස මාහිමිපාණන් වහන්සේ විසින් සඞ්ඝසභාවක දී සාරත්‍ථදීපනී-ටීකාව ගැන සඳහන් කරමින් "එය (සාරත්‍ථදීපනී-ටීකාව) අපගේ (මහාවිහාරීය) ග්‍රන්ථයක් නො වේ" ය යි ප්‍රකාශ කරන ලදැ'යි කියා දැනගන්නට ලැබිණි. මෙලෙසින් මෑත කාලීන විනයධරයන් වහන්සේලා විසින් ද සාරත්‍ථදීපනී-ටීකාවෙහි සදොස් මත සැලකිල්ලට නො ගත් අයුරු පැහැදිලි වේ. එනිසා මෙම කරුණු සියල්ල ම සැලකිල්ලට ගනිමින් ගරුතැන්හි පිහිටා උදකුක්ඛේපසීමා-උපචාරය පිළිබඳ ව විනිශ්චය කළ යුතු වේ

**ඒ අනුව ආසන්නයෙහි සඟපිරිස් දෙකක් විනයකර්ම සිදු කරන විට පමණක් නොව එක ම සඟපිරිසක් නදියක විනයකර්ම සිදු කරන විටත් අත්පස නො හැර නදියෙහි රැස් ව සිටින සඟපිරිස කෙළවර සිට බලමැදුම්-පුරුෂයෙකු මුළු වැර යොදා හාත්පස දිය හෝ වැලි හෝ විසි කරන විට වැටෙන දුරප්‍රමාණය (එනම්, අඩි 35) උදකුක්ඛේපසීමාව ලෙසත් ඊට අඩු නො වන එබඳු ම දුර ප්‍රමාණයක් (එනම්, තවත් අඩි 35) උදකුක්ඛේපසීමා-උපචාරය ලෙසත් සැලකීම යුක්තියුක්ත ය. එය ථේරවාද මහාවිහාරීය පෙළ-අට්ඨකථා-ටීකා අනුගත විනය-විනිශ්චය යි.**

මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ පන්සියයක් මහරහතන් වහන්සේලා ප්‍රථම ධර්මසඞ්ගායනාවෙහි දී **"විනයෝ නාම බුද්ධසාසනස්ස ආයු, විනයේ ඨිතේ සාසනං ඨිතං හෝති"** එනම්, **"විනය වනාහි බුද්ධශාසනයෙහි ආයුෂ යි. විනය මනා ව පැවති කල්හි ශාසනය මනා ව පැවතියා වෙයි."** යනුවෙන් සැලකුහ. එනිසා සසුන් ලැදි සැදැහැති කුලපුත්‍රයෝ විනය ගරුතැන්හි ලා සලකමින් නිවැරදි විනය-විනිශ්චයන් ම ගරු කරමින් බුදුසසුන බබුළුවමින් රැක ගැනීමට උත්සාහ වෙත්වා!

සාධු ! සාධු !! සාධු !!!

# උපග්‍රන්ථය i

## විනයාලඞ්කාර-ටීකා

ඒවමේව හි සාමත්ථියං ගහෙත්වා “සබ්බා, භික්ඛවේ, නදී අසීමා” ති ආදිනා පටික්ඛිත්තබද්ධසීමානම්පි නදීසමුද්දජාතස්සරානං අත්තනෝ සභාවේනේව සීමාභාවෝ අට්ඨකථායං වුත්තෝති ගහේතබ්බෝ.

**අථස්ස ඨිතෝකාසතෝති** තස්ස භික්ඛුස්ස ඨිතෝකාසතෝ. සචේපි හි භික්ඛුසහස්සං තිට්ඨති, තස්ස ඨිතෝකාසස්ස බාහිරන්තතෝ පට්ඨාය භික්ඛූනං වග්ගකම්මපරිහාරත්ථං සීමාපෙක්ඛාය උප්පන්නාය තාය සහ සයමේව උප්පන්නා සත්තබ්භන්තරසීමා සමානසංවාසකාති අධිප්පායෝ. යත්ථ පන ඛුද්දකේ අරඤ්ඤේ මහන්තේහි භික්ඛූහි පරිපුණ්ණතාය වග්ගකම්මසඞ්කාභාවේන සත්තබ්භන්තරසීමාපෙක්ඛා නත්ථි, තත්ථ සත්තබ්භන්තරසීමා න උප්පජ්ජති. කේවලාරඤ්ඤසීමායමේව, තත්ථ සඞ්ඝේන කම්මං කාතබ්බං. නදීආදීසුපි ඒසේව නයෝ. වක්ඛති හි “සචේ නදී නාතිදීඝා හෝති, පභවතෝ පට්ඨාය යාව මුඛද්වාරා සබ්බත්ථ සඞ්ඝෝ නිසීදති, උදකුක්ඛේපසීමාය කම්මං නත්ථී”ති ආදි, ඉමිනා ඒව ච වචනේන වග්ගකම්මපරිහාරත්ථං සීමාපෙක්ඛාය සති ඒව උදකුක්ඛේපසත්තබ්භන්තරසීමා උප්පජ්ජන්ති, නාසතීති දට්ඨබ්බං.

කේචි පන “සමන්තා අබ්භන්තරං මිනිත්වා පරිච්ඡේදකරණේනේව සීමා සඤ්ජායති, න සයමේවා”ති වදන්ති, තං න ගහේතබ්බං. යදි හි අබ්භන්තරපරිච්ඡේදකරණප්පකාරේන සීමා උප්පජ්ජෙය්‍ය, අබද්ධසීමාව න සියා භික්ඛූනං කිරියාපකාරසිද්ධිතෝ. අපි ච වඩ්ඪකිහත්ථානං පකතිහත්ථානඤ්ච ලෝකේ අනේකවිධත්තා, විනයේ ඊදිසං හත්ථප්පමාණ’න්ති අවුත්තත්තා ච ‘යේන කේනචි මිනිතේ භගවතා අනුඤ්ඤාතේන නු ඛෝ හත්ථේන මිනිතං, න නු ඛෝ’ති සීමාය විපත්තිසඞ්කා භවෙය්‍ය, මිනන්තේහි ච අනුමත්තම්පි ඌනමධිකමකත්වා මිනිතුං අසක්කුණෙය්‍යතාය විපත්ති ඒව සියා, පරිසවසේන චායං වඩ්ඪමානා තේසං මිනනේන වඩ්ඪති, හායති වා. සඞ්ඝේ ච කම්මං කත්වා ගතේ අයං භික්ඛූනං පයෝගේන සමුප්පන්නා සීමා තේසං පයෝගේන විගච්ඡති න විගච්ඡති ච, කථං බද්ධසීමා විය යාව සාසනන්තරධානා න තිට්ඨෙය්‍ය, ඨිතියා ච පුරාණවිහාරේසු විය සකලේපි විසුං අරඤ්ඤේ කතසීමා සම්භේදසඞ්කා න භවෙය්‍ය, තස්මා සීමාපෙක්ඛාය ඒව සමුප්පජ්ජති, තබ්බිගමේන විගච්ඡතීති ගහේතබ්බං. යථා චෙත්ථ, ඒවං උදකුක්ඛේපසීමායම්පි නදීආදිසුපි.

තත්ථාපි හි මජ්ඣිමපුරිසෝ න පඤ්ඤායති, තථා සබ්බථාමේන ඛිපනං, උභයත්ථපි ච යස්සං දිසායං සත්තබ්භන්තරස්ස, උදකුක්ඛේපස්ස වා ඕකාසෝ නප්පහෝති, තත්ථ කථං මිනනං, ඛිපනං වා භවෙය්‍ය, ගාමක්ඛෙත්තාදීසු පවිසනතෝ අඛෙත්තේ සීමා පවිට්ඨා කින්නාම සීමා න විපජ්ජෙය්‍ය. අපෙක්ඛාය සීමුප්පත්තියං පන යතෝ පහෝති, තත්ථ සත්තබ්භන්තරඋදකුක්ඛේපසීමා සයමේව පරිපුණ්ණා ජායන්ති. යතෝ පන නප්පහෝති, තත්ථ අත්තනෝ ඛෙත්තප්පමාණේනේව ජායන්ති, න බහි. යං පනෙත්ථ අබ්භන්තරමිනනප්පමාණස්ස වාලුකාදිඛිපනකම්මස්ස ච දස්සනං, තං සයංජාතසීමානං ඨිතට්ඨානස්ස පරිච්ඡේදනත්ථං කතං ගාමූපචාරඝරූපචාරජානනත්ථං ලෙඩ්ඩුසුප්පාදිඛිපනවිධානදස්සනං විය. තේනේව මාතිකාට්ඨකථායං “සීමං වා සම්මන්නති උදකුක්ඛේපං වා පරිච්ඡින්දතී”ති වුත්තං. ඒවං කතේපි තස්ස පරිච්ඡේදස්ස යථාවතෝ ඤාතුං අසක්කුණෙය්‍යත්තේන පුථුලතෝ ඤත්වා අන්තෝ තිට්ඨන්තේහි නිරාසඞ්කට්ඨානේ ඨාතබ්බං, අඤ්ඤං බහි කරොන්තේහි අතිදූරේ නිරාසඞ්කට්ඨානේ පේසේතබ්බං.

අපරේ පන "සීමාපෙක්ඛාය කිච්චං නත්ථි, මග්ගගමනනහානාදිඅත්ථේහි ඒකභික්ඛුස්මිම්පි අරඤ්ඤේ වා නදීආදීසු වා පවිට්ඨේ තං පරික්ඛිපිත්වා සත්තබ්භන්තරඋදකුක්ඛෙපසීමා සයමේව පභා විය පදීපස්ස සමුප්පජ්ජති. ගාමක්ඛෙත්තාදීසු තස්මිං ඔතිණ්ණමත්තේ විගච්ඡති. තේනේවෙත්ථ ද්වින්නං සඞ්ඝානං විසුං කම්මං කරොන්තානං සීමාද්වයස්ස අන්තරා සීමන්තරිකං අඤ්ඤං සත්තබ්භන්තරං උදකුක්ඛෙපඤ්ච ඨපේතුං අනුඤ්ඤාතං, සීමාපරියන්තේ හි කේනචි කම්මේන පේසිතස්ස භික්ඛුනො සමන්තා සඤ්ජාතා සීමා ඉතරේසං සීමාය ඵුසිත්වා සීමාසම්භේදං කරෙය්‍ය, සො මා හොතූ'ති වා, ඉතරථා හත්ථචතුරඞ්ගුලමත්තායපෙත්ථ සීමන්තරිකාය අනුජානිතබ්බතො. අපි ච සීමන්තරිකාය ඨිතස්ස උභයත්ථ කම්මකොපවචනතොපි චෙතං සිජ්ඣති, තම්පි පරික්ඛිපිත්වා සයමේව සඤ්ජාතාය සීමාය උභින්නම්පි සීමානං, ඒකාය ඒව වා සඞ්කරතො. ඉතරථා තස්ස කම්මකොපවචනං න යුජ්ජෙය්‍ය. වුත්තඤ්හි මාතිකාට්ඨකථායං 'පරිච්ඡේදබ්භන්තරේ හත්ථපාසං විජහිත්වා ඨිතොපි පරිච්ඡේදතො බහි අඤ්ඤං තත්තකංයේව පරිච්ඡේදං අනතික්කමිත්වා ඨිතොපි කම්මං කොපේතී'ති. කිඤ්චාපි අගාමකාරඤ්ඤේ ඨිතස්ස කම්මකරණිච්ඡාවිරහිතස්සපි භික්ඛුනො සත්තබ්භන්තරපරිච්ඡින්නේ අබ්භොකාසේ චීවරවිප්පවාසො භගවතා අනුඤ්ඤාතො, සො ච පරිච්ඡේදො සීමා, ඒවං අපෙක්ඛං විනා සමුප්පන්නා. තේනේවෙත්ථ 'අයං සීමා චීවරවිප්පවාසපරිහාරම්පි ලභතී'ති වුත්තං. තස්මා කම්මකරණිච්ඡං විනාපි වුත්තනයේන සමුප්පත්ති ගහේතබ්බා"ති වදන්ති. තං න යුත්තං පදීපපභා විය සබ්බපුග්ගලානම්පි පච්චේකං සීමාසම්භවේන සඞ්ඝේ, ගණේ වා කම්මං කරොන්තේ තත්ථ ඨිතානං භික්ඛූනං සමන්තා පච්චේකං සමුප්පන්නානං අනේකසීමානං අඤ්ඤමඤ්ඤං සඞ්කරදොසප්පසඞ්ගතො. පරිසවසේන චස්සා වඩ්ඪි හානි ච සම්භවති, පච්ඡා ආගතානං අභිනවසීමන්තරුප්පත්ති ඒව, ගතානං සමන්තා ඨිතසීමාවිනාසො ච භවෙය්‍ය.

පාළියං පන "සමන්තා සත්තබ්භන්තරා, අයං තත්ථ සමානසංවාසා"ති ආදිනා ඒකා ඒව සත්තබ්භන්තරා උදකුක්ඛෙපා ච අනුඤ්ඤාතා, න චේසා සීමා සභාවේන, කාරණසාමත්ථියේන වා පභා විය පදීපස්ස උප්පජ්ජති, කින්තු? භගවතො අනුජානනේනේව. භගවා ච ඉමා අනුජානන්තො භික්ඛූනං වග්ගකම්මපරිහාරේන කම්මකරණසුඛත්ථමේව අනුඤ්ඤාසී'ති. කථං? නහානාදිකිච්චේන පවිට්ඨානම්පි සමන්තා තාසං සීමානං සමුප්පත්ති පයොජනාභාවා, පයොජනේ ච ඒකං ඒව පයොජනන්ති. කථං? පච්චේකං භික්ඛුගණනාය අනේකසීමාසමුප්පත්ති. "ඒකසීමාය හත්ථපාසං අවිජහිත්වා ඨිතා"ති හි වුත්තං. යං පන ද්වින්නං සීමානං අන්තරා තත්තකපරිච්ඡේදේනේව සීමන්තරිකාඨපනවචනං, තත්ථ ඨිතානං කම්මකොපවචනඤ්ච, තම්පි ඉමාසං සීමානං පරිච්ඡේදස්ස දුබ්බොධතාය සීමාය සම්භේදසඞ්කං කම්මකොපසඞ්කඤ්ච දූරතො පරිහරිතුං වුත්තං.

යො ච චීවරවිප්පවාසත්ථං භගවතා අබ්භොකාසේ දස්සිතො සත්තබ්භන්තරපරිච්ඡේදො, සො සීමා ඒව න හොති, ඛෙත්තතළාකාදිපරිච්ඡේදො විය අයමෙත්ථ ඒකො පරිච්ඡේදොව. තත්ථ ච බහූසු භික්ඛූසු ඒකතො ඨිතේසු තේසං විසුං විසුං අත්තනො ඨිතට්ඨානතො පට්ඨාය සමන්තා සත්තබ්භන්තරපරිච්ඡේදබ්භන්තරේ ඒව චීවරං ඨපේතබ්බං, න පරිසපරියන්තතො. පරිසපරියන්තතො පට්ඨාය හි අබ්භන්තරේ ගය්හමානේ සත්තබ්භන්තරපරියොසානේ ඨපිතචීවරං මජ්ඣේ ඨිතස්ස සත්තබ්භන්තරතො බහි හොතී'ති තං අරුණුග්ගමනේ නිස්සග්ගියං සියා. සීමා පන පරිසපරියන්තතොව ගහේතබ්බා. චීවරවිප්පවාසපරිහාරොපෙත්ථ අජ්ඣොකාසපරිච්ඡේදස්ස විජ්ජමානත්තා වුත්තො, න පන යාව සීමාපරිච්ඡේදං ලබ්භමානත්තා මහාසීමාය අවිප්පවාසසීමාවොහාරො විය. මහාසීමායම්පි හි ගාමගාමූපචාරේසු චීවරං නිස්සග්ගියං හොති, ඉධාපි මජ්ඣේ ඨිතස්ස සීමාපරියන්තේ නිස්සග්ගියං හොති, තස්මා යථාවුත්තසීමාපෙක්ඛාවසේනේව තාසං සත්තබ්භන්තරඋදකුක්ඛෙපසීමානං උප්පත්ති, තබ්බිගමේන විනාසො ච ගහේතබ්බොති අම්හාකං ඛන්ති, වීමංසිත්වා ගහේතබ්බං. අඤ්ඤො වා පකාරො ඉතො යුත්තතරො ගවේසිතබ්බො.

ඉධ පන "අරඤ්ඤේ සමන්තා සත්තබ්භන්තරා"ති ඒවං පාළියං "විඤ්ඣාටවිසදිසේ අරඤ්ඤේ සමන්තා සත්තබ්භන්තරා"ති අට්ඨකථායඤ්ච රුක්ඛාදිනිරන්තරේපි අරඤ්ඤේ සත්තබ්භන්තරසීමාය විහිතත්තා අත්තනො නිස්සයභූතාය අරඤ්ඤසීමාය සහ ඒතිස්සා රුක්ඛාදිසම්බන්ධේ දොසාභාවො, පගේව අගාමකේ රුක්ඛේති නිස්සිතේපි පදේසේ චීවරවිප්පවාසස්ස රුක්ඛපරිහාරං විනාව අජ්ඣොකාසපරිහාරො ච අනුමතොති සිද්ධොති වේදිතබ්බං.

**උපචාරත්ථායාති** සීමන්තරිකත්ථාය. සත්තබ්භන්තරතෝ අධිකං වට්ටති, ඌනකං පන න වට්ටති ඒව, සත්තබ්භන්තරපරිච්ඡේදස්ස දුබ්බිජානත්තා. තස්මා සඞ්ඝං විනා ඒකේනපි භික්ඛුනා බහි තිට්ඨන්තේන අඤ්ඤං සත්තබ්භන්තරං අතික්කමිත්වා දූරේ ඒව ඨාතබ්බං. ඉතරථා කම්මකෝපසඞ්කරතෝ. උදකුක්ඛේපේපි ඒසේව නයෝ. තේනේව වක්ඛති "ඌනකං පන න වට්ටතී"ති. ඉදඤ්චෙත්ථ සීමන්තරිකාවිධානං ද්වින්නං බද්ධසීමානං සීමන්තරිකානුජානනසුත්තානුලෝමතෝ සිද්ධන්ති දට්ඨබ්බං. කිඤ්චාපි හි භගවතා නිදානවසේන ඒකගාමනිස්සිතානං ඒකසභාගානඤ්ච ද්වින්නං ද්ධසීමානමේව අඤ්ඤමඤ්ඤං සම්භේදඅජ්ඣොත්ථරණදෝසපරිහාරාය සීමන්තරිකා අනුඤ්ඤාතා, තථාපි තදනුලෝමතෝ ඒකං අරඤ්ඤසීමං නදීආදිසීමඤ්ච නිස්සිතානං ඒකසභාගානං ද්වින්නං සත්තබ්භන්තරසීමානම්පි උදකුක්ඛේපසීමානම්පි අඤ්ඤමඤ්ඤං සම්භේදජ්ඣොත්ථරණං, සීමන්තරිකං විනා අබ්‍යවධානේන ඨානඤ්ච භගවතා අනභිමතමේවාති ඤත්වා අට්ඨකථාචරියා ඉධාපි සීමන්තරිකාවිධානමකංසු. විසභාගසීමානම්පි හි ඒකසීමානිස්සිතත්තං ඒකසභාගත්තඤ්චාති ද්වීහඞ්ගේහි සමන්නාගමේ සති ඒව සීමන්තරිකං විනා ඨානං සම්භේදාය හෝති, නාසතීති දට්ඨබ්බං. සීමන්තරිකවිධානසාමත්ථියේනේව චේතාසං රුක්ඛාදිසම්බන්ධෝපි බද්ධසීමා විය අඤ්ඤමඤ්ඤං න වට්ටතීති අයම්පි නයතෝ දස්සිතෝවාති ගහේතබ්බං.

**සභාවේනේවාති** ඉමිනා ගාමසීමා විය අබද්ධසීමාති දස්සේති. **සබ්බමෙත්ථ සඞ්ඝකම්මං කාතුං වට්ටතීති** සමානසංවාසා ඒකූපෝසථාති දස්සේති. **යේන කේනචීති** අන්තමසෝ සූකරාදිනා සත්තේන. මහෝඝේන පන උණ්ණතට්ඨානතෝ නින්නට්ඨානේ පතන්තේන ඛතෝ ඛුද්දකෝ වා මහන්තෝ වා ලක්ඛණයුත්තෝ ජාතස්සරෝ"ත්වේව වුච්චති. එත්ථපි ඛුද්දකේ උදකුක්ඛේපකිච්චං නත්ථි. සමුද්දේ පන සබ්බත්ථ උදකුක්ඛේපසීමායමේව කම්මං කාතබ්බං සෝධේතුං දුක්කරත්තා. **පුන තත්ථාති** ලෝකවෝහාරසිද්ධීසු ඒව තාසු නදීආදීසු තීසු අබද්ධසීමාසු පුන වග්ගකම්මපරිහාරත්ථං සාසනවෝහාරසිද්ධාය අබද්ධසීමාය පරිච්ඡේදං දස්සෙන්තෝති අධිප්පායෝ. පාළියං "යං මජ්ඣිමස්ස පුරිසස්සා"ති ආදීසු උදකං උක්ඛිපිත්වා ඛිපීයති එත්ථාති උදකුක්ඛේපෝ, උදකස්ස පතනෝකාසෝ, තස්මා **උදකුක්ඛේපා**, අයඤ්හෙත්ථ පදසම්බන්ධවසේන අත්ථෝ පරිසපරියන්තතෝ පට්ඨාය සමන්තා යාව මජ්ඣිමස්ස පුරිසස්ස උදකුක්ඛේපෝ උදකස්ස පතනට්ඨානං, තාව යං තං පරිච්ඡින්නට්ඨානං, අයං තත්ථ නදීආදීසු අපරා සමානසංවාසා උදකුක්ඛේපසීමාති.

**තස්ස අන්තෝති**, තස්ස උදකුක්ඛේපපරිච්ඡින්නස්ස ඨානස්ස අන්තෝ. න කේවලඤ්ච තස්සේව අන්තෝ, තතෝ බහිපි "ඒකස්ස, උදකුක්ඛේපස්ස අන්තෝ ඨාතුං න වට්ටතී"ති වචනං උදකුක්ඛේපපරිච්ඡේදස්ස දුබ්බිජානතෝ කම්මකෝපසඞ්කා හෝතීති. තේනේව මාතිකාට්ඨකථායං "පරිච්ඡේදබ්භන්තරේ හත්ථපාසං විජහිත්වා ඨිතෝපි පරිච්ඡේදතෝ බහි අඤ්ඤං තත්තකංයේව පරිච්ඡේදං අනතික්කමිත්වා ඨිතෝපි කම්මං කෝපේති, ඉදං සබ්බඅට්ඨකථාසු සන්නිට්ඨානනී"ති වුත්තං. යං පනෙත්ථ සාරත්ථදීපනියං "**තස්ස අන්තෝ හත්ථපාසං විජහිත්වා ඨිතෝ කම්මං කෝපේතී**'ති ඉමිනා පරිච්ඡේදතෝ බහි යත්ථ කත්ථචි ඨිතෝ කම්මං න කෝපේතී"ති වත්වා මාතිකාට්ඨකථාවචනම්පි පටික්ඛිපිත්වා "නෙව පාළියං න අට්ඨකථායං උපලබ්භතී"ති ආදි බහු පපඤ්චිතං, තං න සුන්දරං. ඉධ අට්ඨකථාවචනේන මාතිකාට්ඨකථාවචනස්ස නයතෝ සංසන්දනතෝ සඞ්ඝටනතෝ. තථා හි ද්වින්නං උදකුක්ඛේපපරිච්ඡේදානමන්තරා විදත්ථිචතුරඞ්ගුලමත්තම්පි සීමන්තරිකං අඨපෙත්වා අඤ්ඤෝ උදකුක්ඛේපෝ සීමන්තරිකාය ඨපේතබ්බෝ, තතෝ අධිකං වට්ටති ඒව, ඌනකං පන න වට්ටතී"ති ඒවං ඉධේව වුත්තේන ඉමිනා අට්ඨකථාවචනේන සීමන්තරිකෝපචාරේ උදකුක්ඛේපතෝ ඌනකේ ඨපිතේ සීමාය සීමාසම්භේදතෝ කම්මකෝපෝපි වුත්තෝ ඒව. යදග්ගේන ච ඒවං වුත්තෝ, තදග්ගේන ච තත්ථ ඒකභික්ඛුනෝ පවේසේපි සති තස්ස සීමට්ඨභාවතෝ කම්මකෝපෝ වුත්තෝ ඒව හෝති. අට්ඨකථායං "ඌනකං පන න වට්ටතී"ති කථනඤ්චේතං උදකුක්ඛේපපරිච්ඡේදස්ස දුබ්බිජානන්තේනපි සීමාසම්භේදසඞ්කාපරිහාරත්ථං වුත්තං.සත්තබ්භන්තරසීමානමන්තරා තත්තකපරිච්ඡේදේනේව සීමන්තරිකවිධානවචනතෝපි ඒතාසං දුබ්බිජානපරිච්ඡේදතා, තත්ථ ච ඨිතානං කම්මකෝපසඞ්කා සිජ්ඣති. කම්මකෝපසඞ්කට්ඨානම්පි ආචරියා දූරතෝ පරිහාරත්ථං 'කම්මකෝපට්ඨාන'න්ති වත්වාව ඨපේසුන්ති ගහේතබ්බං.

# උපග්‍රන්ථය ii

# දෙතුන්දෙනා එකවර උපසම්පදා කිරීමේ කර්මවාක්‍යය

දැනට භාවිතා කෙරෙන දෙතුන්දෙනා එකවර උපසම්පදා කිරීමේ කර්මවාක්‍යයේ ව්‍යාකරණානුකූල බව මෙසේ දැක්විය හැකි ය.

එම කර්මවාක්‍යයෙහි "අයං <u>ච</u> නාගෝ අයං <u>ච</u> නාගෝ අයං <u>ච</u> නාගෝ" යනාදි වශයෙන් යෙදී තිබෙන '<u>ච</u>' යන මෙම නිපාතය සමුච්චය සහ අවධාරණාදි විෂයයන්හි යෙදෙයි. මෙහි 'ආදි' පදයෙන් වාක්‍යොපන්‍යාසත් අතිකඩ්ඪනයත් අදහස් කරන ලදී. ආදි පදයෙන් ම නිද්ධාරණාර්ථය ද ගත යුතු බවට ද ආචාර්‍යමතයකි.

'ච' නිපාතය සමුච්චය විෂයයෙහි යෙදෙන විට,

- කේවල-සමුච්චය
- අන්වාචය-සමුච්චය
- ඉතරීතරයෝග-සමුච්චය
- සමාහාර-සමුච්චය

යන තැන්හි යෙදේ. මින් 'ඉතරීතරයෝග' හා 'සමාහාර' අවස්ථා සමුච්චය වශයෙන් පද සමාස වන තැන්හි යෙදේ. එබැවින් එය ද්වන්ද්ව සමාස විෂයයෙහි ව්‍යාපෘත ය. 'නාමානං සමුච්චයෝ ද්වන්දො' ය යි එම සමාස විෂය සඤ්ඤා කිරීමෙන් ම කරුණ පැහැදිලි ය. සමුච්චය නම් පිණ්ඩීකරණය හෙවත් එකට පිඩු කිරීම යි.

මෙහි 'ඉතරීතරයෝගය' නම් 'ඉතරේන ඉතරේන යෝගෝ ඉතරීතරයෝගෝ' ය යි කියූ බැවින් අවයව ප්‍රධානත්වයෙන් හුදෙක් සමාස වීම යි. <u>මාතා ච පිතා ච මාතාපිතරෝ</u> ය යි සමාස වූවාක් මෙනි. <u>චන්දෝ ච සුරියෝ ච චන්දසුරියා</u> යන තැන්හි හෝ මෙනි. මෙහි දී සමාස වූ පදය බොහෝසෙයින් ම බහුවචන යි. උත්තරපද ලිඞ්ගය ද ගනී. සමාහාර-ද්වන්දයේ දී පදයෝ අවයවාර්ථය ප්‍රධාන නො කොට සමූහයකට පිඩු වෙත්. එබැවින් සමූහ වශයෙන් සමාස වූයේ සමූහාර්ථවාචී ය. මේ හෙයින් ම සමාසිත පදය බොහෝසෙයින් ම ඒකවචනයෙන් සිටී. එසේ ඒකවචනයෙන් සිටින මෙම පදය නපුංසක-ලිඟු වීම සමාහාර රීතිය යි. මෙහි බෝහෝසෙයිනැ' යි කියන ලද්දේ,

- පාණ්‍යඞ්ගාර්ථය
- තූර්‍යාඞ්ගාර්ථය
- යොග්ගඞ්ගාර්ථය
- සේනාඞ්ගාර්ථය
- ක්‍ෂුද්‍රජන්තුකාර්ථය
- විවිධවිරුද්ධාර්ථය
- විසභාගාර්ථය

යන තැන්හි නිත්‍යයෙන් ද

- වෘක්‍ෂ-වාචක
- තෘණ-වාචක
- පශු-වාචක
- ධන-වාචක
- ධාන්‍ය-වාචක
- ජනපද-වාචක
- නිච්චවිරෝධීඅදබ්බ-වාචක
- පක්‍ෂි-වාචක
- ව්‍යඤ්ජන-වාචක
- දිසා-වාචක

යන ශබ්දයන්හි විකල්පයෙන් ද ඒකත්‍වය හා නපුංසකත්‍වය විධාන කොට ඇතිවා විනා සියලු ම තැන්හි නිත්‍යයෙන් එය සිදු වන බවට ව්‍යාකරණ විධානයක් හෝ ග්‍රන්ථාර්ගත සාක්‍ෂ්‍යයක් නොමැති බැවිනි. එය එසේ ම ය.

'මුඤ්ජෝ ච බබ්බජෝ ච මුඤ්ජබබ්බජං' කියා නපුංසක-ලිඟු ඒකවචනයෙන් සමාහාර-සමුච්චයෙන් සමාස වන මෙම නාමයෝ ඇතැම් තැනක මුඤ්ජෝ ච බබ්බජෝ ච මුඤ්ජබබ්බජා යැ යි ඉතරීතරයෝගයෙන් සමාසිත ව බහුවචනාන්ත ව ද දක්නා ලැබෙත්. අජා ච ඒළකා ච අජේළකං කියා ද අජා ච ඒළකා ච අජේළකා කියා ද දක්නා ලැබෙයි. මෙබඳු පද බොහෝ ඇත. 'කුසලාකුසලං' යන්න 'කුසලාකුසලා' යනුවෙන් ද 'හිරඤ්ඤසුවණ්ණං' යන්න 'හිරඤ්ඤසුවණ්ණා' යනුවෙන් ද 'කාසිකෝසලං' යන්න 'කාසිකෝසලා' යනුවෙන් ද 'සාලියවං' යන්න 'සාලියවා' යනුවෙන් ද මෙසේ එක ම පද සමූහය ඒකවචනාන්ත ව ද බහුවචනාන්ත ව ද සමාස වන තැන් සඳහා බොහෝ උදහරණ දක්විය හැක. මේ බව බාලාවතාරයෙහි සූත්‍ර එකක් දෙකක් පරිශීලනයෙන් දුක සේ දත යුතු වන නමුත් රූපසිද්ධියෙහි "සමස්සමානපදතෝ අඤ්ඤෙසං සප්පයමානං දුතියාදිවිභත්‍යන්තානං පදනමත්‍ථේසු යුත්තථානි නාමානි සහ විභාසා සමස්‍යන්තේ සෝ සමාසෝ බහුබ්බීසඤ්ඤෝ" යැ යි එකී සමාසය විකල්පයෙන් මුත් නිත්‍යයෙන් නො වන බව අවධාරණය කොට ඇත. කච්චායනයෙහි ද "විභාසා රුක්ඛතිණපසුධනධඤ්ඤජනපදාදීනඤ්ච" යන සූත්‍රවෘත්තියෙහි ඒ බව පැහැදිලි ව දක්වා ඇත.

කේවල-සමුච්චය හා අන්වාචය අවස්ථා අසමාස අවස්ථා ය. එනම් සමාස නො වී පද ඒ අයුරින් ම තිබෙන්නට හැරීම යි. මෙහි 'අන්වාචය' සමුච්චයෙහි ලා සැලකෙනුයේ යම් විටෙක ප්‍රධාන කටයුත්ත මුලින් දක්වා අප්‍රධාන කටයුත්ත ඊට ම ඈඳා දක්විය යුතු නම්, එකල්හි 'ච' නිපාතයෙන් කරනු ලබන සමුච්චය යි. 'භික්ඛං ච චර සාසනං ච ආරෝචෙහි' යන වාක්‍යයෙහි මෙනි. මෙහි භික්ෂාචරණය ප්‍රධාන ය. සාසන ආරෝචනය අප්‍රධාන ය. එකී ප්‍රධාන වූත් අප්‍රධාන වූත් කටයුතු සම්පිණ්ඩනය කොට කිවමනා කල්හි යෙදෙන සමුච්චය ප්‍රයෝගය, අන්වාචය-සමුච්චය නම් වේ.

උක්තය, ආඛ්‍යාතය දෙසට වෙන වෙන ම යොමු කරන කල්හි හා උක්තාධීනයෙහි ප්‍රධාන පදය දෙසට සෙසු පද යොමු කරන කල යොදන සමුච්චය ප්‍රයෝගය, කේවල සමුච්චය යි. 'චීවරං ච දේහි පිණ්ඩපාතං ච දේහි සේනාසනං ච දේහි' ආදි තැන්හි මෙනි. 'බුද්ධරක්ඛිතෝ ච ආගච්ඡති ධම්මරක්ඛිතෝ ච ආගච්ඡති' යන තැන්හි හෝ මෙනි. 'බුද්ධරක්ඛිතෝ ච සඞ්ඝරක්ඛිතාචරියස්ස අන්තේවාසිකෝ ධම්මරක්ඛිතෝ ච සඞ්ඝරක්ඛිතාචරියස්ස අන්තේවාසිකෝ' යන තැන්හි හෝ මෙනි.

"බුද්ධරක්ඛිතෝ ච සඞ්ඝරක්ඛිතාචරියස්ස අන්තේවාසිකෝ ධම්මරක්ඛිතෝ ච සඞ්ඝරක්ඛිතාචරියස්ස අන්තේවාසිකෝ" යනාදි මෙබඳු තැන්හි 'බුද්ධරක්ඛිතෝ ච ධම්මරක්ඛිතෝ ච සඞ්ඝරක්ඛිතාචරියස්ස අන්තේවාසිකා' යැ යි බහුවචනයෙන් ලිවීම ප්‍රචලිත ක්‍රමය වුව ද 'බුද්ධරක්ඛිතෝ ච ධම්මරක්ඛිතෝ ච සඞ්ඝරක්ඛිතාචරියස්ස අන්තේවාසිකෝ' යැ යි කියා ඒකවචනයෙන් ද ලිවීම වරද නැති බව පෙනේ. මෙබඳු තැන් ඒකවචනයෙන් ද ලියන ප්‍රයෝග ග්‍රන්ථාන්තරයෙන් ද දත හැකි ය.

"අනූපවාදෝ අනූපඝාතෝ
පාතිමොක්ඛේ ච සංවරෝ
මත්තඤ්ඤුතා ච භත්තස්මිං
පන්තඤ්ච සයනාසනං
අධිචිත්තේ ච ආයෝගෝ
ඒතං බුද්ධානසාසනං" යනු නිදර්ශන යි.

මෙහි දී අනූපවාදෝ, අනූපඝාතෝ, පාතිමොක්ඛේ ච සංවරෝ, අධිචිත්තේ ආයෝගෝ යන පද උක්තාධීනය සේ ඒතං යන්නට සමූහ වශයෙන් සමුච්චය කරන විට යොදා ගන්නා වූ 'ච' නිපාතය හේතුවෙන් ඒතං යන්න ඒතානි කියා වෙනස් වී නොමැත. (මෙහි උක්තාධීනය නම් වාක්‍යක කර්තෘට අයත් කොටස යි.)

එසේ ම නාමයන් 'ච' නිපාතයෙන් ආඛ්‍යාතය දෙසට, කේවල-සමුච්චය ලෙසින් යොමු කරන විට ද ආඛ්‍යාතය බහුවචනයෙන් යෙදීම සාමාන්‍ය ක්‍රමය වුව ද එය ඒකවචනයෙන් යෙදීම වරද නැති බව කිව යුතු ය.

"යෝ ඛෝ ආනන්ද මයා ධම්මෝ ච විනයෝ ච දේසිතෝ පඤ්ඤත්තෝ සෝ වෝ මමච්චයේන සත්‍ථා" (මහාපරිනිබ්බාන-සූත්‍රය - දීඝනිකාය) යන දේශනාපාළිය ද

"බුද්ධේන ධම්මෝ විනයෝ ච වුත්තෝ
යෝ තස්ස පුත්තේහි තථේව ඤාතෝ,
සෝ යේහි තේසං මතිමච්චජන්තා
යස්මා පුරේ අට්ඨකථා අකංසු."

(පණාමනගාථා - සමන්තපාසාදිකා විනයට්ඨකථා) යන අට්ඨකථා පාඨය ද ඒ සඳහා නිදර්ශන ය.

[සංස්කාරක - ඉහත මහාපරිනිබ්බාන සූත්‍ර පාඨයෙහි එන 'ධම්මෝ ච විනයෝ ච' යන පද දෙක 'ච' නිපාතයෙන් සමුච්චය වශයෙන් සමූහ කරන විට සාමාන්‍ය පරිදි නම්, ආඛ්‍යාතය විය යුත්තේ 'මයා ධම්මෝ ච විනයෝ ච දේසිතා පඤ්ඤත්තා' වශයෙනි. එහෙත් එය එසේ නො යෙදී 'දේසිතෝ පඤ්ඤත්තෝ' යනුවෙන් යෙදී තිබීමෙන් බුදුරජාණන් වහන්සේ විසින් ද මෙම ව්‍යාකරණ පිළිවෙළ අනුගමනය කරන ලද බව සනාථ වේ. ඒ පිළිබඳ ව දීඝනිකාය අට්ඨකථාවෙහි සඳහන් විවරණයෙන් මේ බව වඩාත් තහවුරු වේ. එම විවරණය මෙසේ යි.

'දේසිතෝ පඤ්ඤත්තෝ'ති : ධම්මෝපි දේසිතෝ චේව පඤ්ඤත්තෝ ච, විනයෝපි දේසිතෝ චේව පඤ්ඤත්තෝ ච.] - සුමඞ්ගලවිලාසිනී දීඝනිකායට්ඨකථා - හේ.මු. 415 පිටුව -

කරුණු මෙසේ හෙයින් 'අයං ච නාගෝ අයං ච නාගෝ අයං ච නාගෝ ආයස්මතෝ තිස්සස්ස උපසම්පදාපෙක්ඛෝ සඞ්ඝං උපසම්පදං යාචති' යන උපසම්පද කර්මවාක්‍යයෙහි 'අයං ච නාගෝ අයං ච නාගෝ අයං ච නාගෝ' යන පද 'උපසම්පදාපෙක්ඛෝ' යන පදය හා ගළපා උක්තාධීනය සකසා ගැනීම සඳහා 'ච' යන සමුච්චයෙන් සමූහ කිරීමෙහි දී 'උපසම්පදාපෙක්ඛෝ' යනුවෙන් ඒකවචනයෙන් ගෙන තිබීම හෝ ආඛ්‍යාතය 'යාචති' යනුවෙන් ඒකවචනයෙන් ගෙන තිබීම හෝ වියරණ දෙසින් නිදහස් බවට සන්දේහ(සැක) රහිත ය. 'උපසම්පදාපෙක්ඛෝ' යනුවෙන් උක්තය ඒකවචනයෙන් යෙදී ඇති බැවින් ආඛ්‍යාතය 'යාචති' යනුවෙන් ඒකවචනයෙන් යොදා තිබීමෙහි නම් කිසි ම ගැටලුවක් නැත්තේ ම ය. දෝෂයක සේයාවක් පෙනෙනුයේ 'අයං ච නාගෝ අයං ච නාගෝ අයං ච නාගෝ' යන පදයෝ 'උපසම්පදාපෙක්ඛෝ' යන පදය වෙත පැමිණවීමෙහි දී 'උපසම්පදාපෙක්ඛෝ' යනුවෙන් ඒකවචනයෙන් ගෙන තිබීම යි. එය ද ව්‍යාකරණානුකූල ව ම නිවැරදි බව දූන් ප්‍රත්‍යක්ෂ ය.

"අනූපවාදෝ අනූපඝාතෝ - පාතිමොක්ඛේ ච සංවරෝ
මත්තඤ්ඤුතා ච භත්තස්මිං - පන්තඤ්ච සයනාසනං
අධිචිත්තේ ච ආයෝගෝ - ඒතං බුද්ධානසාසනං"

යනු නිදර්ශන හෙයිනි. මඞ්ගල සූත්‍රයෙහි ද මීට සාධක ඇතිතරම් ඇත.

"අසේවනා ච බාලානං
පණ්ඩිතානඤ්ච සේවනා
පූජා ච පූජනීයානං
ඒතං මඞ්ගලමුත්තමං"

[සංස්කාරක - සාමාන්‍ය පිළිවෙළ අනුව නම් 'ච' නිපාතයෙන් සමූහ වී ඇති 'බාලානං අසේවනා ච', 'පණ්ඩිතානං සේවනා ච', 'පූජනීයානං පූජා ච' යන මෙම පද සියල්ල සඳහා 'ඒතානි මඞ්ගලමුත්තමානි' යනුවෙන් බහුවචනයෙනි, යෙදිය යුත්තේ. එහෙත් මෙහි ලා 'ච' නිපාතයෙන් සමූහ වන පද සියල්ල සඳහා ඒතං යනුවෙන් ඒකවචනයෙන් යෙදී තිබීමෙන් පෙනී යන්නේ, සර්වඥයන් වහන්සේ විසින් ද අනුගමනය කරනු ලැබූ ව්‍යාකරණ ක්‍රමයෙහි නිවැරදි බව යි.]

එබැවින් ඇතැම් භික්ෂු-නිකායක දෙතුන්දෙනා එකවර උපසම්පද කිරීමෙහි දී උපසම්පද කර්මවාක්‍යයෙහි 'අයං ච නාගෝ අයං ච නාගෝ අයං ච නාගෝ ආයස්මතෝ තිස්සස්ස උපසම්පදාපෙක්ඛෝ සඞ්ඝං උපසම්පදං යාචති' යනුවෙන් යොදා ගැනීම නිවරද ය. වඩා ආරක්ෂාකාරී පිළිවෙත ද එය ය. එසේ නැති ව 'අයං ච නාගෝ අයං ච නාගෝ අයං ච නාගෝ ආයස්මතෝ තිස්සස්ස උපසම්පදාපෙක්ඛා' යනුවෙන් බහුවචනයෙන් යෙදීම ව්‍යාකරණානුකූල ව නිවැරදි වුව ද එවිට භාග්‍යවතුන් වහන්සේ දෙසූ නියම කර්මවාක්‍යයෙහි එන යාචති අස්ස ආදි පද යාචන්ති ඉමේසං ආදි ලෙසින් පැහැදිලි වෙනස්කම්වලට භාජනය වී සාවණභාපන_ දෝෂය පිළිබඳ සැකය බලගතු ලෙස ඉස්මතු විය හැකි ය.

මෙකී කර්මවාක්‍යය පිළිබඳ සාවණ්ණභාපන දෝෂ සහගත සැකය අස්ථාන වුව ද විනය දැනුම මඳ ඇතැමෙකුට වඩා තීව්‍ර ව පහළ විය හැකි ය. එබැවින් ඇතැම් භික්ෂු-නිකායක මෙසේ දෙතුන්දෙනා එකවර උපසම්පදා කිරීමෙහි දී උපසම්පදා කර්මවාක්‍යයෙහි 'අයං ච නාගෝ අයං ච නාගෝ අයං ච නාගෝ ආයස්මතෝ තිස්සස්ස උපසම්පදාපෙක්ඛෝ සඞ්ඝං උපසම්පදං යාචති' යනුවෙන් යොදා ගැනීම දුරදිග බලා ඥානාන්විත ව කරන ලද්දක් බව ඉතා ම පැහැදිලි ය.

විනයග්‍රන්ථාගත කරුණු මඟින් ද මෙම කරුණ ස්ඵුට කර ගත යුතු ය.

"අනුජානාමි භික්ඛවේ ද්වේ තයෝ ඒකානුසාවණේ කාතුං. තඤ්ච ඛෝ ඒකේන උපජ්ඣායේන නත්වේව නානුපජ්ඣායේන" යන දේශනාවට අදාළ ව කර්මවාක්‍යයක් දේශනා කර නොමැති වීම මෙහි ලා ඇති ගැටලුවට හේතුව යි. අට්ඨකථාවෙහි ද එම කර්මවාක්‍යය ගැන විශේෂ කිසිවක් කියා නැත.

ශාසන පැවැත්මෙහි ප්‍රධානතම සාධකය වූත් අතිශය ගරුකටයුතු වූත් උපසම්පදා විනයකර්මය සම්බන්ධ ව කිවයුත්ත නො දෙසා හැරීමෙන් හෙළි වනුයේ කුමක් ද? බුදුරජාණන් වහන්සේලාගේ ධර්මතා දෙකකි. ඉන් එකක් නම් තථාගතයන් වහන්සේ ගරු-ලහු කරුණු අතරින් ගරු තැන් සම්බන්ධ ව ශේෂයක් නො දෙසා ඉතිරි නො කරන සේක. භාග්‍යවතුන් වහන්සේගේ පුත්‍ර වූ අටුවාචාරී මහඋතුමන් අතින් හෝ විස්තර වන බව දක්නා ලද නම් ඇතැම් විට ඊට ඉඩ තබනු ඇත. භාග්‍යවතුන් වහන්සේත් නො දෙසා හැරීමෙන් අටුවාචාරීන් වහන්සේලාත් විශේෂයක් නො කිරීමෙන් ගම්‍ය වනුයේ පෙර සඳහන් කරනු ලැබූ, බුදුරජාණන් වහන්සේලාගේ ධර්මතාව ම යි. එනම් දෙතුන්දෙනා එක්වර උපසම්පදා කිරීමෙහි දී ද යොදා ගත යුත්තේ පූර්වයෙහි එක්අයෙකු උපසම්පදා කිරීමෙහි දී යොදා ගත් වියරණ රීතීන්ගෙන් යුතු කර්මවාක්‍යය ම බව යි. මේ බව වජිරබුද්ධි නම් විනය-ටීකාවෙහි ද මෙසේ පවසා තිබේ.

"අයඤ්හි බුද්ධානං ධම්මතා යදිදං යත්ථ යත්ථ වචනනානත්තමත්ථි තත්ථ තත්ථ ගරුකේසු ඨානේසු වත්තබ්බයුත්තංවදන්ති. දූතේන උපසම්පදායයෝචෙත්ථ නිදස්සනං. යස්මාචෙත්ථ පුබ්බේ අනුඤ්ඤාතකම්මවාචාය නානත්තං නත්ථි තස්මා ද්වේ තයෝ ඒකානුසාවණේ කාතුං ඉති වත්වා ඒවඤ්ච පන භික්ඛවේ කාතබ්බෝති න වුත්තං" යනුවෙනි.

මෙහි අර්ථය මෙසේ ය.

"මෙය වනාහි බුදුරජාණන් වහන්සේලාගේ ධර්මතාව යි. යම් යම් තැනෙක දේශනාවෙහි නානාත්වයක් ඇති නම් ඒ ඒ තැන ගරු තැන්හි ලා දේශනා කළ යුත්ත දේශනා කරන සේක. දූතයකු ලවා උපසම්පදා කිරීමෙහි දී නැවත කර්මවාක්‍යය වෙනස් කොට දෙසූ තැන් ආදිය මෙහි ලා නිදර්ශන ය. යම් හෙයකින් පූර්වයෙහි දෙසූ කර්මවාක්‍යයෙහි හා දෙතුන්දෙනා එක්වර උපසපන් කිරීමේ කර්මවාක්‍යයෙහි ලා නානාත්වයක් නැත්තේ ද එබැවින් ම 'ද්වේ තයෝ ඒකානුසාවණේ කාතුං' ය යි අනුදැන වදරා 'ඒවඤ්ච පන භික්ඛවේ කාතබ්බෝ' යනුවෙන් කර්මවාක්‍යය ගැන කිසිවක් නො දෙසූ සේක" යනු යි.

එබැවින් ද පූර්වයෙහි දෙසූ කර්මවාක්‍යයෙහි එන වෙනස් වීමෙන් 'සාවණ්ණභාපනය' ඇති කළ හැකි '<u>උපසම්පදාපෙක්ඛෝ</u>' _ '<u>යාචති</u>' ආදි පද <u>උපසම්පදාපෙක්ඛා යාචන්ති</u> ආදි ලෙසින් නො දක්වා වඩාත් ආරක්ෂාකාරී ලෙස පූර්වයෙහි දෙසූ කර්මවාක්‍යයෙහි එන ලෙසින් ම යොදමින් වියරණ-ප්‍රයෝග මඟින් 'සාවණ්ණභාපන' වළකා දෙතුන්දෙනා එකවර උපසම්පදා කිරීමේ කර්මවාක්‍යය සැකසීමෙන් අප වත්මන් ඇදුරු පරපුරේ ලාඞ්කේය ප්‍රාචාර්‍ය මහෝත්තමයන් වහන්සේලා ගත් මඟ අතිශය නිවැරදි ය යි ස්ඵුට වනවා සේ ම එතුමන්වහන්සේලාගේ පාණ්ඩිත්‍යයෙහි හා ප්‍රඥාවෙහි තරම ද අපහට මැනවින් කියාපායි.

විමතිවිනෝදනී නම් ටීකාවෙහි ආ වදනින් ද අඥානයන් තුළ පවත්නා සංශය ඛණ්ඩනය වැ සුවිමත මණ්ඩනය වන්නේ මැ යි.

"අයං බුද්ධරක්ඛිතෝ ච අයං ධම්මරක්ඛිතෝ ච ආයස්මතෝ සඞ්ඝරක්ඛිතස්ස උපසම්පදාපෙක්ඛෝ'ති ආදිනා නයේන ඒකේන ආචරියේන ද්වින්නං ඒකස්මිං ඛණේ අනුස්සාවනනයෝ දට්ඨබ්බෝ" යනුවෙන් සඳහන් ය.

'විනිශ්චයාර්ථදීපනී' නම් විනයවිනිශ්චය ව්‍යාඛ්‍යානයෙහි ද 2545 වන ගාථා ව්‍යාඛ්‍යාවෙහි මේ බව දක්වා ඇත.

'අනුජානාමි භික්ඛවේ ද්වේ තයෝ ඒකානුසාවණේ කාතුං' ය යි කී හෙයින් ඉදින් එක් ආචාර්‍ය කෙනෙක් 'අයං බුද්ධරක්ඛිතෝ ච අයං ධම්මරක්ඛිතෝ ච අයං සඞ්ඝරක්ඛිතෝ ච ආයස්මතෝ සාරිපුත්තස්ස උපසම්පදාපෙක්ඛෝ' යි උපසම්පදා වන්නවුන්ගේ නම් වෙන වෙන ම ගෙන කර්මවාක්‍යය කියා දෙතුන්දෙනෙකු උපසම්පදා කෙරේ ද එය සුදුසු ය'යි දක්වන්නට 'ඒකුපජ්ඣායකෝ හෝති' යි ආදි කීයේ, යනුවෙන් එහි සඳහන් ව ඇත.

**මෙතෙකින් උද්ගත ප්‍රස්තුතයෙහි ලා විනිශ්චය නිමියේ ය.**

## ඇති විය හැකි වෙනත් අතුරු සංශයදෝෂ

- 

මෙහි ලා 'උපසම්පදාපෙක්ඛෝ' ය යි කීව ද 'උපසම්පදාපෙඛෝ' ය යි කීව ද වරද නැති බව"උපසම්පදං අපෙක්ඛතීති උපසම්පදාපේඛෝ" යන පද නිරුක්ති නයින් ස්ඵුට ය.

- කර්මවාක්‍යයක වචනයක් දෙතුන් වරක් ශ්‍රාවණය වීම 'සාවණභාපනය' නො වන බව දත යුතු ය. 'ශ්‍රාවණය වූයේ ද නො වූයේ ද' යි සැකයක් ඇති වූ කල විනයධරයා විසින් එම වචනය ම නැවත ශ්‍රාවණය කිරීම නිදසුන් ය. ඒ අනුව මූල කර්මවාක්‍යයෙන් පර ව දෙතුන්දෙනා එක්වර උපසපන් කිරීමෙහි දී 'අයං ච නාගෝ අයං ච නාගෝ අයං ච නාගෝ' යනුවෙන් තෙවරක් එක ම පදය ශ්‍රාවණය කිරීම එසේ නම් යෝග්‍ය ද? නො වේ ද? යන්න පිළිබඳ ව ඇතැමෙකුට ඇති විය හැකි සැකය අස්ථාන ය. 'ච' නිපාතයෙහි අවශේෂ වූ අවධාරණ, නිද්ධාරණාදි අර්ථ විසින් ද බහාලා බැලීමෙනුදු ඉහත අදහස ස්ඵුට වන මුත් ග්‍රන්ථාන්තරයෙන් ම ප්‍රමාණවත් සේ ම කරුණු තහවුරු වන හෙයින් ඒ සම්බන්ධ ව ව්‍යාපෘත වීම අනවශ්‍ය සේ හැඟේ.

'අයං ච නාගෝ අයං ච නාගෝ අයං ච නාගෝ ආයස්මතෝ තිස්සස්ස උපසම්පදාපෙක්ඛා සඞ්ඝං උපසම්පදං යාචන්ති' යනාදි නයින් කර්මවාක්‍ය කියා කරන උපසම්පදාවෙහි තතු කෙබඳු ද? එය ද නිරවද්‍ය ම ය. ඒ කෙසේ ද යත් ? ඉහත කර්මවාක්‍යය පෙර සඳහන් කළ, බුදුරජාණන් වහන්සේලාගේ දෙවන ධර්මතාවට අදාළ වන බැවිනි.

ගරු-ලහු කරුණු අතරින් ගරුතැන්හි දී ශේෂයක් නො පනවන්නා සේ ම තුන්කල්හි ම ගරුතැන්හි දී මතභේදයට හේතු වන අයුරින් යමක් ශේෂව නො තබන බව ද බුදුරජාණන් වහන්සේලාගේ ධර්මතාවක් ම ය.එබැවින් මෙතැන්හි ලා භාග්‍යවතුන් වහන්සේගේ අග්‍රපුත්‍රෝත්තම අට්ඨකථාචාරීන් වහන්සේලා ද කිසිවක් නො පවසා හැරපීම භාග්‍යවතුන් වහන්සේ නො දුටුවා නො වන්නේ ය. එම දෙරටුව තවත් අයුරකින් යොදා ගන්නා ඇදුරුවරු ඉහත සඳහන් කළ ඒකවචන ප්‍රයෝග සියල්ල බහුවචනයෙන් යොදා කර්මවාක්‍යය සකසා ගන්නා බව භාග්‍යවතුන් වහන්සේ දුටු සේක. එහි ද නිරවද්‍ය බව අනුදනිමින් ම මෙතැන්හි දී වැඩි යමක් නො පැවසූ සේකැ'යි පරම්පරාගත වූ විනය පිටකයාදි බුද්ධාභිප්‍රාය එළිපෙහෙළි වන තැන්හි පාරප්‍රාප්ත ඥානයෙන් යුතු වූ ඇදුරු උතුමෝ දත්හ. අට්ඨකථාවෙහි විශේෂයක් පැවසුවා නම් ඊට වඩා සිතිය යුත්තක් ඇත්තේ ම නැත. මෙබඳු වූ අන් තැන්හි මෙන් නොව මෙහි ලා අට්ඨකථාවෙහි ද යමක් පවසා නැත. එබැවින් එම ක්‍රමය ද අඥානයන්ට සඞ්කා සහිත වුව ද එයත් බුද්ධාභිප්‍රාය ම බව පරම්පරාගත ආචාර්ය්‍ය මතය හෙයින් නිරවද්‍ය ම ය.

මෙම දෙනයින් පූර්වෝක්ත ක්‍රමය අඥානයන්ට සඞ්කා හෝ නූපදන බැවින් වඩා ප්‍රශස්තතර ය යි ම දත යුතු ය.

**විනයවිශාරද අතිගරු පූජනීය නුවරඑළියේ ඥාණසීල ස්වාමීන් වහන්සේගේ ලිපියක් ඇසුරින් සකස් කරන ලදී.**



පිරිසිදු උපචාර සහිත සඞ්කරදෝෂ රහිත උදකුක්ඛේපසීමාමාලකයක්



භික්ෂූන් වහන්සේලා පිරිසක් උදකුක්ඛේපසීමාමාලකය වෙත
යාත්‍රාවකින් ගමන් කරන අයුරු



අමරපුර සිරි සද්ධම්මවංස නිකායික භික්ෂූන් වහන්සේලා
ගරු උපසම්පදා විනයකර්ම සිදු කළ (දැන් අභාවයට පත් ව තිබෙන)
මාදු ගඟෙහි පිහිටි උදකුක්ඛේපසීමාමාලකයෙහි නටඹුන්



අමරපුර කල්‍යාණිවංශික භික්ෂූන් වහන්සේලා
ගරු උපසම්පදා විනයකර්ම සිදු කරන, රත්ගම කලපුවෙහි පිහිටි
උදකුක්ඛේපසීමාමාලකය



භික්ෂූන් වහන්සේලා පිරිසක් පිරිසිදු උපචාර සහිත සඞ්කරදෝෂ රහිත සමුද්‍ර-උදකුක්ඛෙපසීමාවක විනයකර්ම සිදුකරන අයුරු



පාලමක් යෙදීමෙන් උදකුක්ඛ්පසීමාවේ උපචාරය සඞ්කර ව තිබෙන අයුරු



පුරාණයෙහි සිට ම මහාවිහාරීය භික්‍ෂූන් වහන්සේලා
පිරිසිදු උදකුක්ඛේපසීමා සඳහා භාවිතා කළ කල්‍යාණී (කැලණි) නදිය
(කල්‍යාණී රාජමහාවිහාරය සමීපයෙහි දී)



පුරාණයෙහි සිට ම මහාවිහාරීය භික්‍ෂූන් වහන්සේලා
පිරිසිදු උදකුක්ඛේපසීමා සඳහා භාවිතා කළ
මහවැලි නදිය (ගැටඹේ සමීපයෙහි දී)



ප්‍රකාශනය

**ශ්‍රී සද්ධර්ම සංසදය**

**www.theravada.mahavihara.org**

**විමසීම් : 071 4417813,**

**විද්‍යුත්-තැපෑල : vinayalankara_sabha@mahavihara.org**